# ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානය
# (ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය)

## 22වන සංවත්සරය (1990 - 2012)

## සමරු කලාපය



ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය

2nd Floor-

# ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානය

# 22 වන සංවත්සරය (1990 - 2012)

## සමරු කලාපය

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය

# ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානය

## 22 වන සංවත්සරය (1990 - 2012)

## සමරු කලාපය

© ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය - 2012

ISBN 978-955-8383-75-9

සමරු කලාපය සම්පාදන කමිටුව

ඩබ්. සුනිල් (කමිටු සභාපති)

චන්දිමා වාදසිංහ

චමින්ද හිමේෂ් ද සිල්වා

විජය ප්‍රේමදර්ශන

ශ්‍රීමා සූරියබණ්ඩාර

රුවිනි දිල්රුක්ෂි

සම්පාදනය අධීක්ෂණය

ජී. ඩී. අමරසිරි - අධ්‍යක්ෂ, ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය

පිටකවරය නිර්මාණය හා අක්ෂර සංයෝජනය රුවිනි දිල්රුක්ෂි

ප්‍රකාශනය ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය,
නො. 14, නිදහස් මාවත, කොළඹ 07.
දුරකථන : 2698847
ෆැක්ස් : 2685201
web : www.natlib.lk

මුද්‍රණය ෆාස්ට් ප්‍රින්ටර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්

# පටුන

සභාපති තුමාගේ පණිවුඩය

අධ්‍යක්ෂ ජනරාල් තුමාගේ පණිවුඩය

ජාතික පුස්තකාලයක වගකීම හා කාර්යභාරය 1 - 4

ජාතික පුස්තකාල එකතුව ගොඩනැගීමේ දී ප්‍රතිග්‍රහණ ක්‍රියාවලියේ වැදගත්කම 5 - 8

ශ්‍රී ලාංකික පාඨක ප්‍රජාවගේ තොරතුරු අවශ්‍යතා සපුරාලීමේ දී ජාතික පුස්තකාලයේ කාර්යභාරය 9 - 18

ශ්‍රී ලංකාවේ ග්‍රන්ථ විඥාපන පාලනය හා ජාතික පුස්තකාලයේ වගකීම 19 - 27

පුස්තකාල ද්‍රව්‍ය සංරක්ෂණය හා ප්‍රතිෂ්ඨාපනය සඳහා වන උපායමාර්ග 29 - 32

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය මගින් සිදු කරන පර්යේෂණ හා සමීක්ෂණ සේවා 33 - 37

ජාතික මට්ටමේ පුස්තකාල සංවර්ධනයේ දී ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ කාර්යභාරය 39 - 44

ශ්‍රී ලංකාවේ පුස්තකාල අධ්‍යාපනය සඳහා ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ දායකත්වය 45 - 52

ශ්‍රී ලංකාවේ ප්‍රකාශන හා ග්‍රන්ථ සංවර්ධන ක්ෂේත්‍රයේ ප්‍රගමනය උදෙසා ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ මෙහෙවර 53 - 58

# සභාපති තුමාගේ පණිවුඩය

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානය හෙවත් ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයේ විසි දෙවන සංවත්සරය නිමිත්තෙන් සම්පාදනය කරන ලද සමරු කලාපය සඳහා පණිවුඩයක් නිකුත් කිරීමට හැකිවීම ගැන සතුටු වෙමි. පසුගිය වසර විසි දෙක දෙස ආපසු හැරී බලන විට ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය සිය අපේක්ෂිත අරමුණු, බාධාවන් මධ්‍යයේ වුව ද සාර්ථක ලෙස ඉටුකරගෙන ඇති බව කිව හැකිය. ජාතික පුස්තකාල එකතුව ගොඩනැගීම, ජාතික පුස්තකාල සේවා ප්‍රවර්ධනය, ජාතික පුස්තකාල එකතුව සංරක්ෂණය, ස්වයංක්‍රීයකරණය, ග්‍රන්ථ විඥාපන හා ප්‍රලේඛන සේවා, පුස්තකාල පර්යේෂණ කටයුතු ආදී ක්ෂේත්‍රවලින් විශාල ප්‍රගතියක් ලබා ඇත. මීට අමතරව ජාතික පුස්තකාලයේ සේවා ප්‍රවර්ධනය සඳහා අවශ්‍යවන යටිතල පහසුකම් සංවර්ධනය අතින් ද සැලකිය යුතු ප්‍රගතියක් ලබාගෙන ඇත.

මීට අමතරව ජාත්‍යන්තර වශයෙන් පිළිගත් ජාතික පුස්තකාල කාර්යයන් සෑම එකක්ම පාහේ පවත්වා ගෙන යාමට හැකි වී ඇත. කෙසේ වුව ද ජාතික පුස්තකාලය ජාත්‍යන්තර මට්ටමට වර්ධනය කිරීම සඳහා ඉදිරියට කළ යුතු දෑ බොහෝ ය. අපගේ දේශීය අවශ්‍යතා හා නව ලෝක ප්‍රවනතා හඳුනාගෙන අපගේ ඉදිරි ගමන්මග සකස් කර ගත යුතුව ඇත. ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයේ විසි දෙවන සංවත්සරය සමරන මේ අවස්ථාවේ දී එහි ඉදිරි කටයුතු සාර්ථක වේවායි ප්‍රාර්ථනා කරමි.

මහාචාර්ය සෝමරත්න බාලසූරිය
සභාපති

# අධ්‍යක්ෂ ජනරාල් තුමාගේ පණිවුඩය

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානයේ (ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය) වීසි දෙවන සංවත්සරය නිමිත්තෙන් පලකරන සමරු කලාපය සඳහා පණිවුඩයක් නිකුත් කිරීමට හැකිවීම ගැන සතුටු වෙමි. 1970 දී පිහිටුවන ලද ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ ප්‍රධාන අරමුණ වූයේ ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය පිහිටුවීමයි. එම ප්‍රධාන අරමුණ ඉටුකරමින් 1990 දී ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය පිහිටුවන ලදී. 1990 සිට මේ දක්වා වසර විසිදෙක තුළ ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය සැලකිය යුතු ප්‍රගතියක් ලබා ඇති බව කිය යුතුය. ශ්‍රී ලංකා ජාතික පුස්තකාල එකතුව ගොඩනැගීම, ජාතික පුස්තකාල කටයුතු පරිගණක ගත කිරීම, ජාතික මට්ටමේ ග්‍රන්ථ විඥාපන හා ප්‍රලේඛන සේවා පවත්වාගෙන යාම, පුස්තකාල ක්ෂේත්‍රයේ පර්යේෂණ හා සමීක්ෂණ පැවැත්වීම, ජාතික පුස්තකාල එකතුව සංරක්ෂණය සඳහා පියවර ගැනීම වැනි කාර්යයන් තුළින් මෙම ප්‍රගතිය ළඟා කරගෙන ඇත. ජාතික පුස්තකාලය යනු ජාතික උරුමයක් වන අතර එය රැක ගැනීම අපගේ යුතුකම වේ. ජාතික පුස්තකාලයේ විසි දෙවන සංවත්සරය සමරන මේ අවස්ථාවේ අපගේ අනාගත ඉලක්කයන් සපුරා ගැනීම පිළිබඳව ද අපගේ අවධානය යොමු විය යුතුය. ජාතියේ ලේඛන උරුමය ඒකරාශී කිරීමේ දී දැනට පවතින බාධාවන් ඉවත් කිරීම, ජාතික පුස්තකාල කටයුතු සඳහා තොරතුරු තාක්ෂණය මීට වඩා ඉහළ මට්ටමින් උපයෝගී කර ගැනීම, කාර්ය මණ්ඩල සංවර්ධනය, යටිතල පහසුකම් සංවර්ධනය වැනි අනාගත ඉලක්කයන් කෙරෙහි අපගේ අවධානය යොමු කර ඇති අතර ඒ සඳහා අවශ්‍ය පියවර ගනිමින් සිටින බවත් මෙහිලා සඳහන් කරනු කැමැත්තෙමි. ජාතික පුස්තකාලයේ විසි දෙවන සංවත්සරය සමරන මේ අවස්ථාවේ දී එහි අනාගත කටයුතු සර්වප්‍රකාරයෙන් සාර්ථක වේවායි පතමි.

එච්. එන්. එම්. චිත්‍රානන්ද
අධ්‍යක්ෂ ජනරාල් (වැ. බ.)
ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය

# ජාතික පුස්තකාලයක වගකීම හා කාර්යභාරය

**ජී. ඩී. අමරසිරි**

**අධ්‍යක්ෂ**

**ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය**

රටකට ජාතික පුස්තකාලයක් අවශ්‍ය වන්නේ ඇයි ද යන කාරණය හා ජාතික පුස්තකාලයක කාර්ය භාරය බොහෝ අවස්ථාවල විද්වතුන්ගේ සංවාදයට භාජනය වී ඇත. ලෝකයේ බොහෝ රටවල ජාතික පුස්තකාල බිහි වී තිබීමෙන් ම එය රටකට අත්‍යවශ්‍ය ආයතනයක් බව අපට තේරුම්ගත හැකිය. රටක් තුළ බිහිවන සමස්ත ග්‍රන්ථ සම්භාරය හෝ ලේඛන උරුමය (Documentary Heritage) ඒකරාශී කර ආරක්ෂාකර තැබීමට ආයතනයක් තිබිය යුතුය. රටක මහජන පුස්තකාල, පාසල් පුස්තකාල ආදී විවිධ වර්ගයේ පුස්තකාල තිබුණ ද රට තුළ බිහිවන සමස්ත ග්‍රන්ථ සම්භාරය ඒකරාශී කිරීමට එම පුස්තකාල වලට වගකීමක් හා හැකියාවක් නොමැත. එබැවින් රටකට ජාතික පුස්තකාලයක් අවශ්‍ය වන්නේ එම වගකීම ඉටුකිරීම සඳහාය. රටක් තුළ බිහිවන ග්‍රන්ථ සම්භාරය එම රටේ උරුමයකි. එම උරුමය වර්තමාන හා මතු පරම්පරාව වෙනුවෙන් ආරක්ෂා කිරීම ජාතික වගකීමකි. මෙම වගකීම ඉටු කිරීම සඳහා රජයෙන් නීති සම්පාදනය ද සිදු කර ඇත. නීත්‍යානුකූල තැන්පතු නීතිය ඊට නිදර්ශනයකි.

ජාතික පුස්තකාලයකට පැවරෙන කාර්යයන් ගණනාවකි. ජාතික පුස්තකාලයක කාර්යයන් පිළිබඳ ජාත්‍යන්තර වශයෙන් පිළිගැනීමක් ලැබුණු විග්‍රහයන් ගණනාවක් විවිධ විද්වතුන් විසින් ඉදිරිපත් කර ඇත. ඊ. ඩබ්. හම්ප්‍රීස් (E. W. Humpreys) හෙයින්ස් ගිටිං (Heinz Gitting) වැනි පුස්තකාලවේදීන් ජාතික පුස්තකාල කාර්යයන් පිළිබඳ විග්‍රහයන් ඉදිරිපත් කර ඇත. ඊ. ඩබ්. හම්ප්‍රිස්ගේ විග්‍රහයන්ට අනුව ජාතියේ ලිඛිත සාහිත්‍යය එක්රැස් කිරීම, නීත්‍යානුකූල තැන්පතු ප්‍රකාශන ලබා ගැනීම, ජාතික ග්‍රන්ථනාමාවලිය සම්පාදනය යන කාර්යයන් ජාතික පුස්තකාලයක මූලික කාර්යයන් වන අතර අන්තර් පුස්තකාල පිරුළු සේවය, අත්පිටපත් එක්රැස් කිරීම, පුස්තකාල ක්ෂේත්‍රයේ පර්යේෂණ පැවැත්වීම වැනි කාර්යයන් ජාතික පුස්තකාලයකට ඉටුකළ හැකි කාර්යයන් වේ. හෙයින්ස් ගිටිං ගේ විග්‍රහයට අනුව ද ජාතියේ ලිඛිත සාහිත්‍යය එක්රැස් කිරීම හා ජාතික ග්‍රන්ථනාමාවලිය සම්පාදනය ජාතික පුස්තකාලයක මූලික කාර්යයන් වේ.

සෞදි අරාබියේ අබ්දුල් අසීස් විශ්ව විද්‍යාලයේ සහාය මහාචාර්ය මොහොමඩ් අල්නහරි විසින් ද ජාතික පුස්තකාලයක කාර්යයන් පිළිබඳ විග්‍රහයක් ඉදිරිපත් කර ඇත. ඔහුගේ විග්‍රහයට අනුව ජාතික පුස්තකාලයක කාර්යයන් වර්ග තුනකට බෙදා දක්වා ඇත.

1. පළමු ප්‍රමුඛතා කාර්යයන්
2. දෙවන ප්‍රමුඛතා කාර්යයන්
3. තෙවන ප්‍රමුඛතා කාර්යයන්

**පළමු ප්‍රමුඛතා කාර්යයන්**

- රටේ නීත්‍යානුකූල තැන්පතු පුස්තකාලය වශයෙන් කටයුතු කිරීම.
- රට තුළ පලවන ප්‍රකාශනවල මධ්‍යම එකතුවක් පවත්වාගෙන යාම.
- රට පිළිබඳ ලියවුණු විදේශ කෘතීන් සහ රටේ කර්තෘවරුන් විසින් විදේශ රටවල දී ලියන ලද ග්‍රන්ථවල එකතුවක් පවත්වාගෙන යාම.
- ජාතික ග්‍රන්ථ නාමාවලිය සම්පාදනය.
- ජාතික ග්‍රන්ථ විඥාපන මධ්‍යස්ථානය ලෙස කටයුතු කිරීම.

**දෙවන ප්‍රමුඛතා කාර්යයන්**

- දේශීය අත්පිටපත් එකතු කිරීම හා සංරක්ෂණය.
- අනෙකුත් පුස්තකාලවලට, ජාතික පුස්තකාල සූචියට ප්‍රවේශ පහසුකම් සැලසීම.
- රටේ පුස්තකාල සේවා සැලසුම් කිරීම.
- ජාතික හා අන්තර්ජාතික වශයෙන් ප්‍රකාශන හුවමාරු මධ්‍යස්ථානය වශයෙන් කටයුතු කිරීම.
- ජාතික ඒකාබද්ධ සූචිය සම්පාදනය කිරීම.

**තෙවන ප්‍රමුඛතා කාර්යයන්**

- තොරතුරු හා විඥාපන සේවාවලට අදාළ ජාතික ප්‍රමිතීන් සකස් කිරීම.
- අන්තර් ජාතික දත්ත එකතුවලට සම්බන්ධ වීම.
- විඥාපන විද්‍යා ක්‍රමවේදය පිළිබඳ පහසුකම් සැලසීම.
- සූචි සේවාවන් පවත්වාගෙන යාම.
- පුස්තකාල කටයුතු පිළිබඳ පර්යේෂණ පැවැත්වීම.
- දෘශ්‍යාබාධිත හා අනෙකුත් අබාධිත අය සඳහා සේවා ලබාදීම.

ලෝකයේ වෙනත් රටවල ජාතික පුස්තකාල තම කාර්යයන් සකස් කරගෙන ඇත්තේ ඉහත සඳහන් විග්‍රහයන් පදනම් කරගෙනය. යුනෙස්කෝ ප්‍රකාශනයකට අනුව ජාතික පුස්තකාලයක වගකීම වන්නේ වර්තමාන හා අනාගත පරම්පරාවන්ගේ ප්‍රයෝජනය සඳහා රට තුළ බිහිවන ග්‍රන්ථ සම්භාරය ඒකරාශී කර සංරක්ෂණය කිරීමයි. සෑම ජාතික පුස්තකාලයක් ම ලෝකයේ අනෙකුත් ජාතික පුස්තකාල සමග සහයෝගීතාවය වර්ධනය කරගත යුතුය. එමෙන් ම පුස්තකාල ක්ෂේත්‍රයේ අනෙකුත් ජාත්‍යන්තර ආයතන සමග ද සහයෝගීතාවය ඇතිකර ගත යුතුය.

රටේ පුස්තකාල පද්ධතියට නායකත්වය ලබාදීම ද ජාතික පුස්තකාලයක වගකීම වේ. රටේ පුස්තකාල පද්ධතියේ සංවර්ධනය හා ගුණාත්මකභාවය ඇති කිරීම සඳහා ද ජාතික පුස්තකාලයකට වගකීමක් ඇත. එමෙන් ම රටතුළ පවතින වාචික සම්ප්‍රදාය (Oral Tradition) ඒකරාශී කර සංරක්ෂණය කිරීම ද ජාතික පුස්තකාලයකට පැවරෙන වගකීමකි.

ලෝකයේ බොහෝ රටවල ජාතික පුස්තකාල පිහිටුවාගෙන ඇත. ඉන්දියාව, පාකිස්තානය, බංග්ලාදේශය, තායිලන්තය, මැලේසියාව, චීනය, පිලිපීනය, ඉරානය, කැනඩාව, ඕස්ට්‍රේලියාව,

නවසීලන්තය, ජපානය, වියට්නාමය, කොරියාව, පැපුවා නිව්ගිනියා, සිංගප්පූරුව, ඉන්දුනීසියාව, නේපාලය ජාතික පුස්තකාල පිහිටුවා ඇති රටවලට නිදර්ශන කිහිපයකි. මෙම රටවල ජාතික පුස්තකාල තම කාර්යයන් සකස් කරගෙන ඇත්තේ ඉහත විස්තර කරන ලද ජාතික පුස්තකාල කාර්යයන් පිළිබඳ ජාත්‍යන්තර විග්‍රහයන් පදනම් කරගෙන බව කිව හැකිය. මේ සෑම ජාතික පුස්තකාලයකම කාර්යයන්වල බොහෝ දුරට සමරූපී බවක් පෙන්නුම් කරයි. උදාහරණ වශයෙන් රටතුළ බිහිවන ලේඛන උරුමය එක්රැස් කිරීම හා සංරක්ෂණය සෑම ජාතික පුස්තකාලයකම ප්‍රධානතම කාර්යය බව පෙනී යයි. මීට අමතරව ජාතික ග්‍රන්ථනාමාවලිය සම්පාදනය, නීත්‍යානුකූල තැන්පතු පිටපත් ලබා ගැනීම සෑම ජාතික පුස්තකාලයක්ම පාහේ ඉටුකරනු ලබයි. ජාතික පුස්තකාලයක සම්පත් විමර්ශන කටයුතු සඳහා පමණක් ලබාදීමත්, බැහැර ගෙනයාමට අවසර නොදීමත් සාමාන්‍ය සම්ප්‍රදාය වේ. ඒ අනුව බොහෝ ජාතික පුස්තකාල සංවෘත රාක්ක (Closed Access) ක්‍රමය අනුගමනය කරයි. එසේ සංවෘත රාක්ක ක්‍රමය අනුගමනය කිරීමට හේතුව පාඨක ජනතාව සඳහා සේවා ලබාදීම මෙන්ම ජාතික ග්‍රන්ථ එකතුව ආරක්ෂා කිරීම ද ජාතික පුස්තකාලයේ වගකීමක් බැවිනි. පොත් බැහැරදීම තුළින් පොත් අස්ථානගත වීම බහුලව සිදුවිය හැකි බැවින් එසේ වුවහොත් ජාතික එකතුව ආරක්ෂා කර ගැනීමට අපහසු වනු ඇත. කෙසේ වුව ද ලෝකයේ සමහර ජාතික පුස්තකාල විමර්ශන සේවයට අමතරව බැහැර දෙන සේවයක් ද (Lending) පවත්වාගෙන යයි. මැලේසියානු ජාතික පුස්තකාලය එවැනි පුස්තකාලයකට නිදර්ශනයකි. එසේ බැහැර දෙන සේවයක් පවත්වාගෙන යාමට හේතුව, මැලේසියාවේ ප්‍රධාන නගරය තුළ මහජන පුස්තකාල සේවයක් නොතිබීමයි. මහජන පුස්තකාල සේවයක් ආරම්භ කරන තෙක් ජාතික පුස්තකාලය එම කාර්යය ඉටු කරයි.

ජාතික පුස්තකාල කාර්යයන් පිළිබඳව ඇති විග්‍රහයන් සලකා බලා ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයේ කාර්ය පහත සඳහන් පරිදි සකස් කර ඇත.

1. ශ්‍රී ලංකාවේ ප්‍රකාශිත හා අප්‍රකාශිත ලේඛන උරුමය ඒකරාශී කර ජාතික සංචිතයක් ගොඩනැගීම හා සංරක්ෂණය කිරීම.
2. නීත්‍යානුකූල තැන්පතු පිටපත් ලබාගැනීම.
3. ශ්‍රී ලංකාවට අදාළ විදේශ ප්‍රකාශන ලබාගැනීම.
4. ජාතික ග්‍රන්ථ විඥාපන සේවාවන් පවත්වාගෙන යාම.
5. ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලිය සම්පාදනය.
6. ජාතික ඒකාබද්ධ සූචිය සම්පාදනය.
7. තොරතුරු ගවේෂණය පහසු කිරීම සඳහා ප්‍රලේඛන සේවා පවත්වාගෙන යාම.
8. ජාතික හා ජාත්‍යන්තර පොත් හුවමාරු සේවා පවත්වාගෙන යාම.
9. ශ්‍රී ලංකාවේ පුස්තකාල සඳහා තොරතුරු තාක්ෂණය උපයෝගීකර ගැනීම සම්බන්ධයෙන් සහාය වීම.

ශ්‍රී ලංකාවේ ජාතික පුස්තකාලය දැනට මෙම කාර්යයන් ඉටුකිරීමේ යෙදී සිටින අතර ඒ අනුව

ජාත්‍යන්තර වශයෙන් පිළිගත් විග්‍රහයන් අනුව ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයේ කාර්යයන් සකස වී ඇති බව කිව හැකිය.

රටක ප්‍රකාශිත හා අප්‍රකාශිත ලේඛන උරුමය ඒකරාශී කර සංරක්ෂණය කිරීම ජාතික පුස්තකාලයක ප්‍රධාන වගකීම වුවත් මෙම කාර්ය ඉටුකිරීම විශාල අභියෝගයක් බව කිව යුතුය. විශේෂයෙන් දියුණු වෙමින් පවතින රටවල් මෙම අභියෝගයට මුහුණ දී ඇත. රටතුළ බිහිවන සමස්ත ග්‍රන්ථ සම්භාරය ලබාගැනීම සඳහා අවශ්‍යවන මුදල් ප්‍රතිපාදන ප්‍රමාණවත් නො වීම ප්‍රධාන ගැටලුවකි. ජාතික පුස්තකාල රජයේ මුදල් මත යැපෙන නිසාත් පුස්තකාල ක්ෂේත්‍රයට ලැබෙන අඩු ප්‍රමුඛතාවය නිසාත් මෙම කාර්ය සාර්ථක ලෙස ඉටු කිරීමට අපහසු වී ඇත. නීත්‍යානුකූල තැන්පතු නීතිය ද (Legal deposit law) ජාතික පුස්තකාලයකට ප්‍රකාශන ලැබෙන ප්‍රධාන මාර්ගයකි. බොහෝ රටවල නීත්‍යානුකූල තැන්පතු නීතියේ පවතින අඩුපාඩු නිසා මේ මගින් ලැබෙන ප්‍රකාශන සීමා වී ඇත. ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය ද මෙම ගැටලුවට මුහුණ දී සිටී. නීත්‍යානුකූල තැන්පතු නීතියේ පැරණිබව නිසා අඩුපාඩු රාශියක් පවතී. මේ නිසා පොත් තැන්පත් කිරීමට ප්‍රකාශකයින් ඉදිරිපත් නොවීමත්, නීතිය මගින් සමහර ප්‍රකාශන ආවරණය නොවීමත් දැකිය හැකිය. එබැවින් ලේඛන උරුමය ඒකරාශී කිරීම සම්බන්ධ පවතින මෙම ගැටලු කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීම කාලීන අවශ්‍යතාවයක් බවට පත්ව ඇත.

**ආශ්‍රිත ග්‍රන්ථ :-**


Amarasiri. M. S. U, The National Library of Sri Lanka an Introduction, National Library of Sri Lanka commemorative volume, Sri Lanka National Library Services Board: Colombo, 1990.

Amarasiri. G. D., Establishing and Building up the National Library of Sri Lanka, 1994.

Manrice B. Line, Joyce Line (ed) National Libraries : London, 1987.

National Libraries in the Knowledge based Society, Proceedings of National Library of Thailand's Centennial Celebration International Conference, National Library of Thailand : Bangkok, 2005.

# ජාතික පුස්තකාල එකතුව ගොඩනැගීමේ දී ප්‍රතිග්‍රහණ ක්‍රියාවලියේ වැදගත්කම


**සේනානි දීපිකා බණ්ඩාර**

**අංශ ප්‍රධාන**

**ප්‍රතිග්‍රහණ අංශය**


රටක ජාතික පුස්තකාලය එම රටෙහි බුද්ධිමය උරුමය වර්තමාන හා අනාගත පරම්පරාවන් වෙනුවෙන් ආරක්ෂා කිරීමේ මහඟු කර්තව්‍ය සඳහා උරදී ඇති ප්‍රධාන ජාතික ආයතනයක් වේ. ජාතික පුස්තකාලය වශයෙන් දිවයින තුළ ප්‍රකාශයට පත් කෙරෙන සියලුම ප්‍රකාශන අත්පත් කර ගැනීම මගින් පරිපූර්ණ ජාතික එකතුවක් ගොඩනැගීම ජාතික පුස්තකාලයේ අරමුණු අතරින් ප්‍රධාන වේ. මේ යටතේ පර්යේෂකයන් හා සියලුම මහජනතාව සඳහා ඔවුන්ගේ තොරතුරු අවශ්‍යතා වෙනුවෙන් ප්‍රකාශන අත්පත් කර ගැනීම සඳහා ජාතික පුස්තකාලය කටයුතු කරනු ලබයි.

ජාතික පුස්තකාලයේ දැනට ක්‍රියාත්මක ප්‍රතිග්‍රහණ ප්‍රතිපත්තිය යටතේ ශ්‍රී ලංකාවේ පළ කෙරෙන සියලුම ප්‍රකාශන, ශ්‍රී ලාංකික කතුවරුන් දේශීයව හෝ විදේශීයව පළ කරන සියලුම ප්‍රකාශන, ශ්‍රී ලංකාව පිළිබඳව විදේශීයව පළ කෙරෙන ප්‍රකාශන මිල දී ගැනීම කෙරෙහි ප්‍රමුඛත්වය දී කටයුතු කරනු ලබයි. ඊට අතිරේකව ශ්‍රී ලංකාවේ වෙනත් පුස්තකාලවල පාඨක පරිහරණය සඳහා සොයා ගැනීමට අපහසු විමර්ශන මූලාශ්‍ර, පුස්තකාල හා විඥාපන විද්‍යා ප්‍රකාශන හා ජාතික පුස්තකාලයක අරමුණු හා අවශ්‍යතාවන්ට ගැළපෙන ප්‍රකාශන අත්පත් කර ගැනීම සිදු වේ. ජාතික පුස්තකාලය සඳහා මෙම සියලු පුස්තකාල සම්පත් අත්පත් කර ගැනීම සම්බන්ධයෙන් කටයුතු කරනු ලබන්නේ ප්‍රතිග්‍රහණ අංශය විසිනි. ජාතික පුස්තකාලය සඳහා මෙසේ ප්‍රකාශන ලබා ගැනීම ප්‍රධාන ක්‍රම 04 ක් යටතේ සිදු කෙරේ.

1. නීතිමය තැන්පතු ක්‍රමය
2. මිලදී ගැනීම්
3. පරිත්‍යාග
4. හුවමාරු ක්‍රමය

**නීතිමය තැන්පතු ක්‍රමය**

ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක නීතිමය තැන්පතු නීතිය යටතේ ශ්‍රී ලංකාවේ ප්‍රකාශයට පත් කෙරෙන සියලුම ප්‍රකාශනවලින් පිටපත් 05 ක් ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවට ලබා දිය යුතු වේ. මෙම පිටපත් පහෙන් එක් පිටපතක් 1976 සිට ජාතික පුස්තකාලයට ලැබෙන අතර එය ජාතික එකතුව පෝෂණය කිරීමේ ලා මහඟු පිටුබලයක් සපයයි.

## මිල දී ගැනීම්

නීතිමය තැන්පතු නීතිය පදනම් වන ව්‍යවස්ථාවන් දැනට සියවසකට වඩා පැරණි අතර මේ හේතුවෙන් එම නීතියෙහි දැනට අඩුපාඩු රාශියක් පවතී. මුද්‍රණකරුවන් මෙම නීතිය කඩ කිරීම, මුද්‍රිත මාධ්‍ය හැර වෙනත් මාධ්‍ය ප්‍රකාශන ආවරණය නොවීම මේ අතරින් ප්‍රධාන වේ. මෙසේ නීතිමය තැන්පතු නීතියේ දුර්වලතා හේතුවෙන් සිදුවන අඩුපාඩු අවම කරමින් පුළුල් හා අංග සම්පූර්ණ ශ්‍රී ලංකා එකතුවක් ගොඩ නැගීමේ දිගු කාලීන ඉලක්කය සපුරා ගැනීම සඳහා ජාතික පුස්තකාලය විසින් දළ වශයෙන් වසරකට මිලියන 04 ක් ඉක්මවන ශ්‍රී ලාංකික ප්‍රකාශන අත්පත් කර ගැනීමට කටයුතු කරනු ලබයි. මෙසේ ප්‍රකාශන මිලදී ගැනීමේ දී සෙසු පුස්තකාලවලට වඩා විශේෂත්වය වන්නේ එක් ප්‍රකාශනයකින් පිටපත් රාශියක් නොව සෑම ප්‍රකාශනයකින් ම උපරිමය පිටපත් 03 ක් නො ඉක්මවන ලෙස සෑම ශ්‍රී ලාංකික ප්‍රකාශනයක් ම අන්තර්ගත කිරීමේ මුඛ්‍ය පරමාර්ථයෙන් කටයුතු කිරීමයි. එයින් ප්‍රධාන වශයෙන් බලාපොරොත්තු වන්නේ පරිපූර්ණ ජාතික එකතුවක් එක් මධ්‍ය ස්ථානයක් වශයෙන් ජාතික පුස්තකාලයේ ගොඩ නැගීම මගින් රටේ සියලුම ජනතාවට අවශ්‍ය අවස්ථාවක පරිහරණය සඳහා මෙන් ම තොරතුරු ලබා ගැනීම සඳහා අවසාන වශයෙන් යොමුවන ස්ථානය (Last Resort) බවට ජාතික පුස්තකාලය පත් කිරීමයි. මෙසේ රට තුළ ප්‍රකාශයට පත් කෙරෙන සියලුම ප්‍රකාශන එක් රැස් කිරීම, ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානයේ ග්‍රන්ථ විඥාපන සේවා අංශය විසින් සිදු කරනු ලබන විද්‍යානුකූල ග්‍රන්ථ විඥාපන සේවාවන් සඳහා ද පිටු බලයක් සපයයි. මිල දී ගැනීම්වල දී විමර්ශන මූලාශ්‍ර, පොත්, වාර සඟරා, අත් පිටපත්, පුස්කොළ පොත්, දුර්ලභ පොත්, පුවත්පත්, වාර්තා, සිතියම්, ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය, සූක්ෂම රූපන, පුස්තකාල හා විඥාපන විද්‍යා ප්‍රකාශන, ඉලෙක්ට්‍රොනික ප්‍රකාශන හා මාර්ගගත දත්ත පදනම්, රාජ්‍ය ප්‍රකාශන යන සියලු පුස්තකාල ද්‍රව්‍ය මේ යටතේ අත්පත් කර ගැනීමට කටයුතු කරනු ලබයි. විදේශීය ප්‍රකාශන ද ඇතුළත්ව වාර්ෂිකව ජාතික පුස්තකාල සම්පත් මිල දී ගැනීම වෙනුවෙන් දළ වශයෙන් රුපියල් මිලියන 06 ක පමණ මුදලක් වැය කරනු ලබයි.

### පරිත්‍යාග

ජාතික පුස්තකාල එකතුව සඳහා දේශීය හා විදේශීය වශයෙන් විවිධ පුද්ගලයන් හා ආයතන විසින් ප්‍රකාශන පරිත්‍යාග කිරීම සෙසු පුස්තකාලවලට සාපේක්ෂව ඉහළ මට්ටමක පවතී. ජාතික එකතුව වෙනුවෙන් පරිත්‍යාග කිරීම එම ප්‍රකාශනවල සුරක්ෂිතභාවය, වර්තමාන හා අනාගත පුළුල් පාඨක පරිහරණය, ග්‍රන්ථ විඥාපන පාලන සේවාවන් මගින් දේශීය හා විදේශීය වශයෙන් එම ප්‍රකාශනයට ලැබෙන පිළිගැනීම යන කරුණු මේ සඳහා හේතු වේ.

ජාතික පුස්තකාල එකතුව පෝෂණය කිරීමෙහිලා විවිධ ශ්‍රී ලාංකික විද්වතුන්ගේ පෞද්ගලික ග්‍රන්ථ එකතු ජාතික පුස්තකාල එකතුව වෙත ලබා දීම සුවිශේෂ වැදගත්කමක් එක් කර ඇත. මේ ආකාරයෙන් ජාතික පුස්තකාල එකතුව වෙත ලබා ගත් එකතු කිහිපයකි,

මාර්ටින් වික්‍රමසිංහ එකතුව

ආචාර්ය පුංචිබණ්ඩාර සන්නස්ගල එකතුව

ආචාර්ය ගුණපාල සේනාධීර එකතුව

මහාචාර්ය ඩී. ඊ. හෙට්ටිආරච්චි එකතුව

පීටර් විජේසිංහ එකතුව

මහාචාර්ය ටිකිරි අබේසිංහ එකතුව

ඔලිවර් ඩී. සිල්වා එකතුව

මහාචාර්ය රැල්ෆ් පීරිස් එකතුව

ලයනල් ප්‍රනාන්දු එකතුව

ජී. ඩී. රණසිංහ එකතුව

තේජා ගුණවර්ධන එකතුව

පීටර් සිල්වා එකතුව

ආචාර්ය කේ. ජයතිලක එකතුව

මහාචාර්ය මිනිවන් පී. තිලකරත්න එකතුව

මඩවල එස්. රත්නායක එකතුව

එඩ්මන් සමරක්කොඩි එකතුව

මීට අමතරව දේශීය වශයෙන් ජාතික පුස්තකාල එකතුව වෙත ලැබෙන විවිධ පුද්ගල පරිත්‍යාග මගින් ජාතික එකතුව ගොඩනැගීමට ලැබෙනුයේ නොමඳ පිටුබලයකි.

**හුවමාරු ක්‍රමය**

මේ යටතේ දේශීය හා ජාත්‍යන්තර පුස්තකාල සමඟ ඇති කර ගනු ලබන එකඟතාවන්ට අනුව පුස්තකාල ද්‍රව්‍ය හුවමාරු කර ගැනීම සිදු වේ. ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් විදේශීය රටවල පළ කෙරෙන ප්‍රකාශන ඇතුළු වැදගත් විදේශීය ප්‍රකාශන ලබා ගැනීම සම්බන්ධයෙන් දැනට ලෝකයේ ජාතික පුස්තකාල 20 ක් සමඟ පවත්නා හුවමාරු සේවාව මගින් සැලකිය යුතු දායකත්වයක් ලබා ගැනේ.

රටක විසිරී ඇති පර්යේෂණ මූලාශ්‍ර එක් ස්ථානයක රැස් කිරීම මගින් රටෙහි සංවර්ධන කාර්යයෙහිලා විවිධ විෂය ක්ෂේත්‍රයන්හි සිදු විය යුතු පර්යේෂණ සඳහා තොරතුරු මූලාශ්‍ර සැපයීමේ වගකීමක් ජාතික පුස්තකාලයට හිමි වේ. මෙම පරමාර්ථයට අනුව ගොඩනැගීම ආරම්භ කරන ලද එකතු අතර පශ්චාත් උපාධි නිබන්ධන එකතුව විශේෂයෙන් වැදගත් වේ. ශ්‍රී ලාංකික විද්වතුන් දේශීය හෝ විදේශීය විශ්වවිද්‍යාලවල ඕනෑම විෂය ක්ෂේත්‍රයක සිදු කරන ලද පශ්චාත් උපාධි පර්යේෂණ නිබන්ධනවලින් සමන්විත එකතුවක් ගොඩ නැගීම මේ යටතේ සිදු වේ. විවිධ ප්‍රචාරක මාධ්‍යයන් ඔස්සේ මේ පිළිබඳව විද්වතුන් දැනුවත් කරමින් ප්‍රතිග්‍රහණ අංශය විසින් මෙම පශ්චාත් උපාධි නිබන්ධන එකතුව පරිපූර්ණ එකතුවක් බවට පත් කිරීමට කටයුතු කරනු ලැබේ.

ජාතික පුස්තකාලයෙහි ප්‍රතිග්‍රහණ අංශයෙන් සිදු කරනු ලබන කාර්යයන් අතරින් දේශීය හා විදේශීය වශයෙන් පුස්තකාල හා විවිධ පර්යේෂණ ආයතන සමඟ ආයතනික මට්ටමින් සිදුවන

සම්බන්ධතා සම්බන්ධයෙන් කටයුතු කිරීම ද දැක්විය හැකිය. මේ යටතේ දේශීය හා විදේශීය ආයතන සාමාජිකත්වය ලබා ගැනීමට කටයුතු කරනු ලබන අතර එමගින් ද ජාතික පුස්තකාල එකතුව ගොඩනගා ගැනීම සඳහා විශාල දායකත්වයක් ලබා ගැනේ.

එසේ ම විදේශීය රටවල ජාතික පුස්තකාල සමඟ ඇති කර ගනු ලබන ගිවිසුම් මත පදනම්ව විවිධ රටවල "තොරතුරු කවුළු" ආරම්භ කිරීම ප්‍රතිග්‍රහණ අංශය විසින් කටයුතු කරනු ලබයි. මේ යටතේ චීන තොරතුරු කවුළුව දැනටමත් ආරම්භකර ඇති අතර කොරියාව හා ඉරානය සමඟ මේ සඳහා ගිවිසුම් වලට එළඹ ඇත. මෙම වැඩසටහන යටතේ වසර 03 ක් හෝ 04 ක් වැනි කාල සීමාවන් සඳහා එම රටවලින් ලැබෙන ප්‍රකාශන වෙත ශ්‍රී ලාංකික පාඨකයන්ට ප්‍රවේශයන් ලබා ගැනීමට අවස්ථාව සැලසේ. එසේ ම මෙම විදේශීය "තොරතුරු කවුළු" සඳහා එම රටවලින් ජාතික පුස්තකාලය වෙත ලැබෙන ලී බඩු හා පරිගණක ඇතුළු මූල්‍යමය ආධාර ලබා ගැනීම සඳහා ප්‍රතිග්‍රහණ අංශය විසින් කටයුතු කර ඇත.

මේ අනුව දැනුමෙන් පරිපූර්ණ ශ්‍රී ලාංකික සමාජයක් ගොඩනැගීමේ දී ජාතික පුස්තකාලය විසින් ඉටුකරනු ලබන කාර්යභාරය තුළ ප්‍රතිග්‍රහණ අංශය විසින් ඒ සඳහා අවශ්‍ය පුස්තකාල මූලාශ්‍ර හා සම්පත් අත්පත්කර ගැනීම තුළින් ප්‍රබල දායකත්වයක් සපයනු ලබයි.


**මණ්ඩලයීය ප්‍රකාශන**

| | | | |
|---|---|---|---|
| 1. | ජාතික ග්‍රන්ථ නාමාවලිය | - | 100.00 |
| 2. | වාර සඟරා ලිපි අනුක්‍රමණිකාව | - | 100.00 |
| 3. | රජයේ ප්‍රකාශන නාමාවලිය | - | 200.00 |
| 4. | පශ්චාත් උපාධි නිබන්ධන අනුක්‍රමණිකාව | - | 375.00 |
| 5. | පුස්තකාල ප්‍රවෘත්ති | - | 50.00 |
| 6. | Index to Research Report ( 2005-2009) | - | 260.00 |
| 7. | Directory of Libraries in Sri Lanka (2010) | - | 250.00 |

**මෙම ප්‍රකාශන ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ අලෙවිහලෙන් ලබාගත හැකිය**

**විමසීම් - 0112698847/ 0112685197**

# ශ්‍රී ලාංකික පාඨක ප්‍රජාවගේ තොරතුරු අවශ්‍යතා සපුරාලීමේ දී ජාතික පුස්තකාලයේ කාර්යභාරය

**ඩබ්. සුනිල්**

**නියෝජ්‍ය අධ්‍යක්ෂ**

**ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය**

**හැඳින්වීම**

ජාතික පුස්තකාලය රටක දැනුම හා තොරතුරු සපයන ප්‍රධාන ත ම මධ්‍යස්ථානය වේ. මෙම මූලික අරමුණ සහිතව 1970 අංක 17 දරන පාර්ලිමේන්තු පනත මගින් 1970 වසරේ දී ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය පිහිටුවනු ලැබූ අතර, එම මණ්ඩලයෙහි ප්‍රධාන වගකීමක් වූයේ ශ්‍රී ලංකාව සඳහා "ජාතික පුස්තකාලයක්" පිහිටුවීම සහ පවත්වාගෙන යාමයි. මෙරට ජාතික පුස්තකාලය පිහිටුවීම මෙන් ම ජාතික වශයෙන් ශ්‍රී ලංකාවේ ඇති සියලුම පුස්තකාල සේවාවන් සම්බන්ධීකරණය හා සංවර්ධනය කරලීම, ජාතියේ සංවර්ධනයට අවශ්‍ය තොරතුරු හා විඥාපන සේවා පවත්වාගෙන යාමත් ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ ප්‍රධාන අරමුණ විය. 1970 වසරේ සිට 1990 වසර දක්වා කාල පරිච්ඡේදය තුළ ජාතික පුස්තකාලයේ වැඩකටයුතු ආරම්භ කිරීම හා පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය මගින් සිදු වූ අතර, එම ප්‍රයත්නයේ ප්‍රතිඵලයක් වශයෙන් 1990 වසරේ අප්‍රේල් මස 27 දින කොළඹ 07 නිදහස් මාවතේ පිහිටි නව ගොඩනැගිල්ලක ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය ස්ථාපිත කරනු ලැබීය.

කෙසේ වුව ද මෙරට පුස්තකාල ක්ෂේත්‍රයේ වැඩකටයුතු කරනු ලබන ජාතික ආයතනයක් වශයෙන් එතෙක් පැවති නීතිමය බලතල හා සීමාවන් ප්‍රමාණවත් නොවූ හෙයින්, 1998 අංක 51 දරන ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩල පනත සම්මත කර ගැනීමත් සමග ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයේ වගකීම හා කාර්යභාරය නීතිගත කරන ලදී. ඒ මගින් ආයතනයේ කටයුතු ඉදිරියට ගෙනයාම සඳහා අවශ්‍ය නීතිමය පදනම සැකසුණි.

ජාතික පුස්තකාලයක කාර්යයන් පිළිබඳව විවිධ මත තිබේ. මීට හේතු වී තිබෙන්නේ ඒ ඒ රටවල ජාතික අවශ්‍යතාවන් අනුව ජාතික පුස්තකාලයක කාර්යයන් තීරණය වීමයි. යුනෙස්කෝ ප්‍රකාශනයක් මගින් ඇති කරනු ලැබූ විශ්ව සම්මතයකට අනුව ජාතික පුස්තකාලයක වගකීම කුමක්ද? යන්න හඳුන්වා තිබෙන්නේ "ජාතික පුස්තකාලය ජාතියේ ප්‍රමුඛතම පුස්තකාලය විය යුතු බව පිළිගත් කරුණකි. එමෙන් ම එය රටෙහි අනෙකුත් පුස්තකාල සහ තොරතුරු සේවාවන් සඳහා ප්‍රබල නායකත්වයක් ලබා දිය යුතු වේ. එසේ ම ලොව අනෙකුත් රටවල ජාතික පුස්තකාල සමග ද ඓන්ද්‍රිය සබඳතාවක් පවත්වා ගත යුතු වේ. ජාතික පුස්තකාලය හුදෙක් විද්‍යාර්ථීන් සඳහා සේවය සපයනු ලබන ආයතනයක් පමණක් නොවේ. එය ජනතාවගේ බුද්ධිමය, සංස්කෘතික සහ ආධ්‍යාත්මික සංවර්ධනය සඳහා ඔවුනට සහාය වීමෙන් ඔවුන්ගේ අභිප්‍රායන් ඉටුකර ගැනීමට ඇපකැප වී කටයුතු කරන ආයතනයක් වශයෙන් ද කටයුතු කළ යුතු වේ."

**පිහිටීම**

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය පිහිටා තිබෙන්නේ කොළඹ 07, නිදහස් මාවතේ එක් පසෙකට වන්නටය. එය කොළඹ පිහිටි සංස්කෘතික කලාපය නමින් හඳුන්වනු ලබන ප්‍රදේශයට අයත් වේ. මෙම කලාපය තුළ ජාතික ලේඛනාගාරය, ශ්‍රී ලංකා පදනම් ආයතනය, ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව, ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව, රූපවාහිනී අභ්‍යාස ආයතනය, බස්නාහිර පළාත සංස්කෘතික ආයතනය, සෞන්දර්ය විශ්වවිද්‍යාලය, ජාතික කලා භවන, ජෝන් ද සිල්වා සමරු රඟහල, නෙළුම් පොකුණ රඟහල, කොළඹ මහජන පුස්තකාලය, ජාතික කෞතුකාගාරය, රාජකීය ආසියාතික සමිතිය, විද්වත් වෘත්තික සංගම් මධ්‍යස්ථානය, කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකා පුස්තකාල සංගමය, ශ්‍රී ලංකා විද්‍යාත්මක හා කාර්මික පර්යේෂණ ආයතනය, ජාතික විද්‍යා පදනම, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය, ග්‍රහලෝකාගාරය, නිදහස් චතුරස්‍රය හා නිදහස් මන්දිරය, රුසියානු සංස්කෘතික මධ්‍යස්ථානය, ලයනල් වෙන්ඩ්ට් රඟහල ඇතුළු ජාතික හා සංස්කෘතිකමය වැදගත්කමකින් යුත් ආයතන හා ගොඩනැගිලි රාශියක් මෙම ප්‍රදේශය අවට පිහිටා තිබේ.

**ජාතික පුස්තකාල ගොඩනැගිල්ල**

රුපියල් දස ලක්ෂ පනහක් පමණ වැයකොට තනා ඇති ශ්‍රී ලංකා ජාතික පුස්තකාල ගොඩනැගිල්ල මහල් පහකින් සමන්විත වන අතර එය වර්ග මීටර් 11250 ක බිම් ප්‍රමාණයකින් යුක්ත වේ. මෙම ජාතික පුස්තකාල ගොඩනැගිල්ලෙහි පුස්තකාල ද්‍රව්‍ය තැන්පත්කර ඇති කොටස වායු සමනය කර තිබේ. පාඨකයන් තුන්සිය විසි දෙනෙකුට එකවර ආසන පහසුකම් සැපයිය හැකි පරිදි කියවීම් ශාලා තුනක් තිබේ. මීට අමතරව 130 දෙනෙකුට අසුන් ගත හැකි සියලු පහසුකම්වලින් යුත් ශ්‍රවණාගාරයක් ද ජාතික පුස්තකාල පරිශ්‍රයෙහි ස්ථාපිත කර තිබේ.

**ජාතික පුස්තකාලය කා සඳහා ද?**

ජාතික පුස්තකාලය යනු කිසි විටෙකත් මහජන පුස්තකාලයක ස්වරූපය ගන්නා පුස්තකාලයක් නොවේ. එය ශිෂ්‍යයින් සඳහා පාඨ ග්‍රන්ථ ඇති පුස්තකාලයක් හෝ විභාග සඳහා සූදානම් වන ශිෂ්‍යයන්ට පාඩම් කිරීමට ඇති ස්ථානයක් නොවේ. එමෙන් ම දිනපතා පුවත්පත් බැලීමට හෝ ගැසට් පත්‍ර බැලීමට ඇති කියවීම් ශාලාවක් හෝ නොවේ.

ජාතික පුස්තකාලය ප්‍රධාන වශයෙන් පර්යේෂණ හා විමර්ශන පුස්තකාලයකි. එහෙයින් පර්යේෂණයන්හි නියැලි ශිෂ්‍යයින් හෝ පර්යේෂකයින් ලෙස ලියාපදිංචි වන්නන් සඳහා ජාතික පුස්තකාලයේ සියලුම සම්පත් පරිහරණය හා සේවාවන් ලබාගත හැකි වේ. පර්යේෂණ කටයුතුවල නිරතව සිටින ආයතනවලට සම්බන්ධ පුද්ගලයින් මෙන් ම, ස්වාධීන පර්යේෂණ කටයුතුවල නිරතව සිටින පුද්ගලයින් ද ජාතික පුස්තකාලය ප්‍රයෝජනයට ගනු ලැබේ. මේ හැරුණු විට ජාතික පුස්තකාලය මගින් පමණක් සපුරාලිය හැකි, අවශ්‍යතා ඇති පුද්ගලයින්ට ද පොදුවේ ඕනෑම ශ්‍රී ලාංකිකයෙකුට මෙන් ම විදේශිකයෙකුට වුව ද ජාතික පුස්තකාලය පරිහරණය කිරීමේ හැකියාව පවතී.

**විවෘතව පවතින දින සහ වේලාවන්**

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය ඉරිදා සහ රජයේ නිවාඩු දිනවල හැර සඳුදා සිට සෙනසුරාදා දින දක්වා විවෘතව පවතී. අඟහරුවාදා සහ බ්‍රහස්පතින්දා දිනවල පමණක් පෙ. ව. 8.30 සිට ප. ව. 6.15 දක්වාත් සෙසු දිනවල පෙ. ව. 8.30 සිට ප. ව. 4.15 දක්වාත් පාඨකයින් සඳහා විවෘතව පවතී.

**පාඨකයන් ලියාපදිංචි කිරීම සහ ප්‍රවේශ පත්‍ර ලබා ගැනීම**

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය විමර්ශන පුස්තකාලයක් වන අතර සියලුම පුස්තකාල ද්‍රව්‍ය විමර්ශනය සඳහා පමණක් යොමු කෙරේ. කිසි විටෙකත් ඒවා බැහැර ගෙන යාමට පාඨකයන්ට අවස්ථාව ලබා දෙනු නො ලැබේ. පුස්තකාල ද්‍රව්‍ය පරිහරණය කිරීමේ දී ජාතික පුස්තකාලයේ නීතිරීතිවලට අදාළ ව සිදුවිය යුතු වේ. පාඨකයන් ලියාපදිංචි කිරීමේ දී කිසිඳු ඇප කොන්දේසියකට යටත් නො කරන අතර, එක් දින සාමාජික ගාස්තු වශයෙන් රු. 20.00 ක මුදලක් ද මාස 03 ක කාලයක් සඳහා රු. 100.00 ක මුදලක් ද වසරක කාලයක් සඳහා රු. 350.00 ක මුදලක් ද ජාතික පුස්තකාලයෙහි යාවජීව සාමාජිකත්වය ලබාගන්නන් සඳහා රු. 1000.00 ක මුදලක් ද අය කෙරේ. මීට අමතරව ආයතනික සාමාජිකත්වය ලබා ගන්නා ආයතන වෙතින් වසරක කාලයක් සඳහා රු. 2500.00 ක මුදලක් අය කෙරේ. ජාතික කියවීමේ මාසය යෙදෙන සෑම වසරකම ඔක්තෝබර් මාසයේ දී ජාතික පුස්තකාලයේ සාමාජිකත්වය ලබා ගන්නා පාඨකයන් සඳහා වසරක කාලයකට නොමිලයේ සාමාජිකත්වය ලබාදීම සිදු කෙරේ. මෙය 2004 වසරේ සිට අඛණ්ඩව ක්‍රියාත්මක වේ.

**ජාතික පුස්තකාලයේ අරමුණු හා පරමාර්ථ**

රටක පවතින ප්‍රධාන තොරතුරු මධ්‍යස්ථානය වශයෙන් එහි පුළුල් අරමුණු හා පරමාර්ථ රාශියක් හඳුනාගත හැකිය.

01. ශ්‍රී ලංකාව සම්බන්ධ ජාතික වටිනාකමකින් යුත් ප්‍රලේඛන සම්පත් එක් රැස් කිරීම, ආරක්ෂා කිරීම හා ප්‍රවේශ පහසුකම් සැපයීම තහවුරු කිරීම.
02. සියලු ජන කොටස්වල භාවිතය සඳහා ජාතියේ තොරතුරු අවශ්‍යතාවලට උචිත පුස්තකාල හා ප්‍රලේඛන සම්පත් පිළිබඳ ජාතික සංචිතයක් ගොඩනැගීම.
03. ශ්‍රී ලංකාවේ පළ වූ හෝ ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් පළ වූ අනෙකුත් සියලුම ප්‍රකාශන මෙන් ම මෙරට පාඨක අවශ්‍යතා සපුරාලන විදේශ ප්‍රකාශන ලබා ගැනීම.
04. නීත්‍යානුකූල තැන්පතු නීතිය යටතේ සියලුම ශ්‍රී ලාංකික ප්‍රකාශන ලබා ගැනීම.
05. ශ්‍රී ලංකාවේ ජාතික හා සංස්කෘතික උරුමය සුරැකීම.
06. පාඨකයන්ට ඉතා පහසු ආකාරයට තොරතුරු බෙදා හැරීම.
07. පුස්තකාල හා පුස්තකාල වෘත්තිකයන් අතර සම්පත් හුවමාරුව හා සහයෝගිතාව සඳහා අනුබල දීම හා ප්‍රවර්ධනය කිරීම.
08. ඉගෙනීම හා දැනුම් නිර්මාණය ප්‍රවර්ධනය කිරීම.

ශ්‍රී ලංකාවේ විවිධ පුස්තකාල පරිහරණය කරනු ලබන පුද්ගලයන් සඳහා ජාතික පුස්තකාලය වක්‍ර අන්දමින් ද සේවා සපයනු ලැබේ.

01. ඒ ඒ පුස්තකාලවල පාඨකයන්ට අවශ්‍යවන පුස්තකාල සම්පත් හෝ තොරතුරු ආදිය නොමැති අවස්ථාවල දී ඒ ඒ පුස්තකාලවල පුස්තකාලයාධිපතීන් විසින් ජාතික පුස්තකාලයෙන් ඉල්ලීමක් කළ විට දී අදාළ ලේඛනයන් හි ඡායා පිටපත් හෝ අදාළ ප්‍රකාශනය පුස්තකාලයාධිපති වෙත ලබා දීම මගින් සිය පුස්තකාලවල පාඨක අවශ්‍යතා සපුරාලීමට කටයුතු කිරීම.

02. විශ්වවිද්‍යාල පුස්තකාලයාධිපතිවරු හෝ අධ්‍යයන අංශවල අංශ ප්‍රධානීන් විසින් ජාතික පුස්තකාලය වෙත උපාධි අපේක්ෂකයන් හෝ වෙනත් පර්යේෂකයින් යොමුකළ විට දී එවැනි පිරිස් වෙත පුස්තකාල ද්‍රව්‍ය හා සේවාවන් ලබා දීමට කටයුතු කිරීම.

03. පුස්තකාල නොමැති හෝ පුස්තකාල ඇතත් පර්යේෂණ කටයුතු සඳහා ප්‍රමාණවත් සම්පත් නොමැති රජයේ සේවයේ නියුතු නිලධාරීන්ට ජාතික පුස්තකාලයේ සම්පත් හා සේවාවන් ලබාදීමට කටයුතු කිරීම.

04. පුස්තකාලයක් හෝ ආයතනයක් විසින් ජාතික පුස්තකාලය වෙත යොමු කරනු ලබන සාමාන්‍ය ජනතාව සඳහා සේවාවන් ලබාදීමට කටයුතු කිරීම.

## ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයේ සම්පත් හා සේවා

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයේ පාඨක සේවාව වඩා උසස් මට්ටමකට පත් කිරීමේ අරමුණෙන් විවිධ එකතුවලින් මෙන් ම සේවා රාශියකින් පාඨක සේවාව සමන්විත වේ.

### ජාතික පුස්තකාල එකතුව

ජාතික පුස්තකාලයේ ශ්‍රී ලංකාවට අදාළ ප්‍රමාණාත්මක හා ගුණාත්මකව උසස් පුස්තකාල ද්‍රව්‍ය එකතුවක් සහ අනෙකුත් තොරතුරු මූලාශ්‍ර විශාල ප්‍රමාණයක් ද මුද්‍රිත, ශ්‍රව්‍ය දෘශ්‍ය හා ඉලෙක්ට්‍රොනික් මාධ්‍යයන්ගෙන් පවතී. ජාතික පුස්තකාලය එහි අභිමතාර්ථ සමග මනාව ගැලපෙන හා ජාතියේ තොරතුරු අවශ්‍යතා සපුරාලන උසස් තත්වයේ එකතුවකින් සමන්විත වේ. වර්තමානය වන විට ජාතික පුස්තකාල එකතුව මිලියනයකට ආසන්න ග්‍රන්ථ සම්භාරයකින් යුක්ත වේ. මෙම එකතුවෙහි පවත්නා ප්‍රකාශනවල ස්වරූපයට ගැලපෙන පරිදි විවිධ එකතු යටතේ බෙදා වෙන්කොට පවත්වාගෙන යනු ලැබේ.

### ශ්‍රී ලංකා ජාතික එකතුව

1885 වර්ෂයේ දී පනවන ලද මුද්‍රණකරුවන්ගේ හා ප්‍රකාශකයින්ගේ ආඥා පනතට අනුව ශ්‍රී ලංකාවේ ප්‍රකාශයට පත්වන සෑම ප්‍රකාශනයකින් ම පිටපත් 05 ක් බැගින් ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ පොත්පත් හා පුවත්පත් ලියාපදිංචි කිරීමේ අංශය වෙත භාර දිය යුතු වේ. මෙම නීතිය 1976 වර්ෂයේ දී සංශෝධනය වීම මගින් ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය ද තැන්පතු පුස්තකාලයක් ලෙස නම් කොට ලැබෙන පිටපත් 05 න් එක් පිටපතක් ජාතික පුස්තකාලය වෙත ලබාදීම සිදු කෙරේ. මෙම පිටපත නීතිමය තැන්පතු නීතිය යටතේ ලැබෙන පිටපත ලෙස නම් කරන ලදී. ඊට අමතරව ජාතික පුස්තකාලය සඳහා විවිධ ක්‍රම ඔස්සේ පරිත්‍යාග වශයෙන්

ලැබෙන පොතපත, හුවමාරු සේවා යටතේ ලැබෙන පොතපත මෙන් ම අන්තර්ජාතික ප්‍රමිති අංක ක්‍රමය (ISBN, ISMN, ISSN) යටතේ ලැබෙන පොතපත ද මීට ඇතුළත් වේ. මීට අමතරව මෙම එකතුව සඳහා විදේශීය රටවල සිටින ශ්‍රී ලාංකිකයින් විසින් රචනා කරනු ලබන පොතපත සහ විදේශීය රටවල ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් පළවන පොතපත ද එකතුව සඳහා අත්පත් කර ගැනීමට කටයුතු කරනු ලැබේ. ජාතික එකතුව පෝෂණය කිරීම සඳහා මෙරට විසූ ප්‍රාමාණික බුද්ධිමතුන්ගේ පෞද්ගලික පොත් එකතු රාශියක් අත්පත්කර ගැනීමට කටයුතු යොදා තිබේ. ඒවා අතර මහා ගත්කරු මාර්ටින් වික්‍රමසිංහ එකතුව, මහාචාර්ය ඩී. ඊ. හෙට්ටිආරච්චි එකතුව, මහාචාර්ය ටිකිරි අබේසිංහ එකතුව, ආචාර්ය පී. බී. සන්නස්ගල එකතුව, ආචාර්ය එම්. එච්. පීටර් සිල්වා එකතුව, වෛද්‍ය ඊ. එම්. විජේරාම එකතුව, තේජා ගුණවර්ධන එකතුව, පී. වත්තේගම එකතුව, මහාචාර්ය මිනිවන් පී. තිලකරත්න එකතුව, ආචාර්ය නන්දන කරුණානායක එකතුව, ආචාර්ය එස්. ජී. සමරසිංහ එකතුව, මඩවල එස්. රත්නායක එකතුව, ආචාර්ය කේ. ජයතිලක මහතා විසින් රචනා කරන ලද සියලුම කෘති එකතුව ආදී වශයෙන් පෞද්ගලික එකතු රාශියක පවත්නා දුර්ලභ මට්ටමේ කෘතිවලින් ද ජාතික එකතුව සමන්විත වේ.

**පුස්තකාල හා විඥාපන විද්‍යා එකතුව**

පුස්තකාල හා විඥාපන විද්‍යා විෂය ක්ෂේත්‍රයට අදාළ පොත්පත්, සඟරා, උපාධි නිබන්ධන ඇතුළු දේශීය හා විදේශීය වශයෙන් ප්‍රකාශයට පත් වී ඇති කෘති රාශියකින් සමන්විත එකතුවකි. මෙම විෂය ක්ෂේත්‍රයට අදාළ ව මෙරට පවත්නා විශාල ත ම සහ උසස් මට්ටමේ එකතුව වශයෙන් ද මෙය හැඳින්විය හැකිය.

**රජයේ ප්‍රකාශන එකතුව**

රජයේ ප්‍රකාශන කාර්යාංශය ඇතුළු විවිධ මට්ටමේ රාජ්‍ය ආයතන මගින් ප්‍රකාශයට පත් කරනු ලබන තිල වැදගත්කමක් සහිත ප්‍රකාශනවලින් සමන්විත ස්වාධීන එකතුවක් ජාතික පුස්තකාලය මගින් පවත්වාගෙන යනු ලැබේ. මෙම ප්‍රකාශන අතරට රජයේ ගැසට් පත්‍ර, පනත්, පනත් කෙටුම්පත්, හැන්සාඩ් වාර්තා, සැසි වාර්තා, පරිපාලන වාර්තා, ශ්‍රී ලංකා නීති වාර්තා, නව නීති වාර්තා, කොමිෂන් වාර්තා, රජයේ චක්‍රලේඛ, Blue Books ඇතුළු රජයේ ප්‍රකාශන රාශියක් මෙම එකතුවට ඇතුළත් වේ. විවිධ පනත් හා නීති වාර්තා ඇතුළු නීතිමය ක්ෂේත්‍රයට අදාළ ප්‍රකාශන පහසුවෙන් ලබා ගැනීම සඳහා Law Lanka නමින් විද්‍යුත් දත්ත පදනමක් ද කුළී පදනම යටතේ ලබාගෙන තිබේ. මේ මගින් පාඨකයන්ට අවශ්‍ය තොරතුරු කඩිනමින් සහ පහසුවෙන් ලබා දීමට උපකාරී වේ.

**මූලික විමර්ශන එකතුව**

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය සතු විමර්ශන කෘති එකතුව විශ්වකෝෂ, ශබ්දකෝෂ, අනුක්‍රමණිකා, ග්‍රන්ථ නාමාවලි, පාරිභාෂික ශබ්දමාලා, ස්ථාන නාම, සාර සංග්‍රහ ආදී පුළුල් පරාශයක පැතිරුණු විෂයයන්ට අයත් විමර්ශන කෘතිවලින් සමන්විතය. මෙම කෘති එකතුව පාඨක සේවා බිම් මහලේ විවෘත ප්‍රවේශ ක්‍රමය යටතේ පාඨකයින් සඳහා විමර්ශනයට පහසුකම් සපයා තිබේ.

**පශ්චාත් උපාධි නිබන්ධන එකතුව**

ශ්‍රී ලාංකික විද්වතුන් විසින් දේශීය හා විදේශීය විශ්වවිද්‍යාලවලට ඉදිරිපත් කරන ලද දර්ශනපති (M Phil), දර්ශන විශාරද (Phd) උපාධිවලට අදාළ උපාධි නිබන්ධන මෙන් ම පුස්තකාල හා විඥාපන විද්‍යා විෂයට අදාළව ශාස්ත්‍රපති (MA) උපාධියේ සිට ඉහළ උපාධි සඳහා ඉදිරිපත් කරන ලද උපාධි නිබන්ධන ද මෙම එකතුවට අයත් වේ.

**ඉලෙක්ට්‍රොනික සම්පත් එකතුව**

මුද්‍රිත මාධ්‍ය ග්‍රන්ථ එකතුවට අමතරව විද්‍යුත් ක්‍රම ඔස්සේ විමර්ශනය කළ හැකි පරිදි ඉලෙක්ට්‍රොනික තොරතුරු එකතුවක් ද ජාතික පුස්තකාල එකතුව සතුව පවතී. විවිධ දත්ත පදනම්වලට නිදසුන් ලෙස ජාතික පුස්තකාල සූචිය, බලය බෙදා හැරීම සහ ජනවාර්ගික අර්බුදය පිළිබඳ දත්ත පදනම, ඡායාරූප දත්ත පදනම, ජාතික ඒකාබද්ධ සූචිය, මාර්ටින් වික්‍රමසිංහ එකතුවට අදාළ සූචිය ආදිය පෙන්වා දිය හැකිය. විවිධ විශ්වකෝෂ ද ඉලෙක්ට්‍රොනිකව විමර්ශනයට පහසුකම් සපයා තිබේ. නිදසුන් ලෙස Britannica, Encarta ආදිය වේ. පුවත්පත් ලිපි අනුක්‍රමණිකා, පශ්චාත් උපාධි නිබන්ධන අනුක්‍රමණිකාව, විද්‍යා උපහැරණ අනුක්‍රමණිකාව (Science Citation Index) පුස්තකාල හා විඥාපන විද්‍යා සාරාංශය (LISA Plus) මෙන්ම ශ්‍රී ලාංකික ගීත, නාට්‍ය හා ටෙලි නාට්‍ය අඩංගු ශ්‍රව්‍ය දෘශ්‍ය කැසට් පට, සංයුක්ත තැටි, DVD තැටි හා ග්‍රැමෆෝන් තැටි ආදිය ඉලෙක්ට්‍රොනික සම්පත් එකතුවට අයත් වේ.

**පුවත්පත් එකතුව**

1976 වසරේ සිට මෙරට පළ වූ ජාතික පුවත්පත් ඇතුළු සෙසු පුවත්පත් නාම 300 කට ආසන්න පුවත්පත් සංඛ්‍යාවකින් මෙම එකතුව සමන්විත වේ. මෙම එකතුව ජාතික පුස්තකාලයේ බිම් මහලේ තැන්පත්කොට තිබෙන අතර බොහොමයක් පුවත්පත් සූක්ෂම සොයා පටල (Micro Films) ස්වරූපයෙන් ද යුක්ත වේ. පුවත්පත්වල පළ වූ ලිපි මෙන් ම අතීත සිදුවීම්වලට අදාළ තොරතුරු සොයන්නන්ට මෙම පුවත්පත් එකතුව බෙහෙවින් ප්‍රයෝජනවත් වේ. ජාතික පුවත්පත්වල පළ වී තිබෙන ලිපි ගවේෂණය කිරීමේ දී ශ්‍රී ලංකා පුවත්පත් ලිපි අනුක්‍රමණිකාව භාවිතය මගින් අදාළ ලිපි වෙත පහසුවෙන් ළඟා වීමේ හැකියාව පවතී. ඒ මගින් පුවත්පත් පරිහරණය කරන පාඨකයන්ගේ කාලය ද ඉතිරිකර ගත හැකිය. මීට අමතරව ඒ ඒ විෂයයන්ට අදාළව සකස් කරන ලද පුවත්පත් ලිපි කැපුම් එකතුවක් ද මෙම එකතුවට සමගාමීව පවත්වාගෙන යනු ලබයි.

**වාර සඟරා එකතුව**

වාර සඟරා නාම 800 කට අධික දේශීය හා විදේශීය වාර සඟරාවලින් මෙම එකතුව සමන්විත වේ. පර්යේෂකයින් හට කාලීන තොරතුරු සොයා ගැනීම සඳහා මෙම වාර සඟරා එකතුව බෙහෙවින් උපකාරී වේ. මෙම වාර සඟරා අතුරෙන් දේශීය වාර සඟරාවල ලිපි පිළිබඳ තොරතුරු සොයා ගැනීමේ දී ශ්‍රී ලංකා වාර සඟරා ලිපි අනුක්‍රමණිකාව බෙහෙවින් ප්‍රයෝජනවත් වේ. ත්‍රෛමාසික ප්‍රකාශනයක් වශයෙන් සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන භාෂාත්‍රයෙන් ම පළවන මෙය 1998 වසරේ සිට අඛණ්ඩව ප්‍රකාශයට පත්වන මුද්‍රිත ප්‍රකාශනයකි.

**දුර්ලභ පොත් එකතුව**

මෙරට මුද්‍රණ කර්මාන්තය ආරම්භ වූ අවධියේ සිට මෙරට පළ වූ ප්‍රකාශන අතුරෙන් දුර්ලභ හා ඉහළ වටිනාකමකින් යුත් කෘති රාශියකින් මෙම දුර්ලභ පොත් එකතුව සමන්විත වේ. මෙම එකතුව තුළ දුර්ලභ පොතපත මෙන් ම ඉපැරණි පුස්කොළ පොත් ද තිබේ.

**පුස්කොළ පොත් එකතුව**

බුද්ධාගම, බෞද්ධ සාහිත්‍ය, ආයුර්වේදය හා ජ්‍යොතිෂ ශාස්ත්‍රය යන විෂය ක්ෂේත්‍රයන් ආවරණය වන පරිදි වටිනා දුර්ලභ පුස්කොළ පොත් එකතුවකින් මෙම එකතුව සමන්විත වේ.

**ජන සාහිත්‍ය එකතුව**

ජන සාහිත්‍යය පිළිබඳව මෙරට විසූ ප්‍රාමාණික බුද්ධිමතෙකු වූ අභාවප්‍රාප්ත පීටර් විජේසිංහ මහතා විසින් ලබා දෙන ලද ජන සාහිත්‍ය පිළිබඳ අත්පිටපත් එකතුවක් ඇතුළු විවිධ අත්පිටපත් හා මුද්‍රිත පිටපත් විශාල ප්‍රමාණයකින් මෙම එකතුව සමන්විත වේ. ජන සාහිත්‍ය සම්බන්ධයෙන් විවිධ පළාත්වල දී පටිගත කරන ලද ජන ගී ඇතුළත් කැසට්පට එකතුවකින් ද මෙම ජන සාහිත්‍ය එකතුව සමන්විත වේ.

**අස්පර්ශීය සංස්කෘතික උරුමය පිළිබඳ එකතුව**

අස්පර්ශීය සංස්කෘතික උරුමය හා දේශීය දැනුම සම්බන්ධයෙන් මෙරට රචිත පොතපත හා අනෙකුත් තොරතුරු මූලාශ්‍ර ඇසුරෙන් මෙම එකතුව ගොඩනගා තිබේ.

**ළමා පොත් එකතුව**

ජාතික පුස්තකාලය මගින් විවිධ මාර්ග ඔස්සේ අත්පත් කර ගනු ලබන ළමා කෘති ඒකරාශී කර ගනිමින් ළමා පොත් එකතුව ගොඩනගා තිබේ. මෙරට පළවන ළමා කෘති පිළිබඳ අධ්‍යයනය කරන්නන්ට මෙන් ම ඒ පිළිබඳ පර්යේෂණ සිදුකරන්නන්ට මෙම ළමා පොත් එකතුව බෙහෙවින් ප්‍රයෝජනවත් වේ.

**යුනෙස්කෝ එකතුව**

යුනෙස්කෝ සංවිධානය මගින් ප්‍රකාශයට පත් කරනු ලබන කෘතිවල මෙරට එක් තැන්පතු පුස්තකාලයක් වන්නේ ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයයි. මෙම එකතුව තුළ අධ්‍යාපනය, ආර්ථික විද්‍යාව, සමාජ විද්‍යාව, භූගෝලය, ඉතිහාසය, විවිධ රටවල පර්යේෂණාත්මක තොරතුරු ඇතුළත් වටිනා කෘති රාශියකින් මෙම එකතුව සමන්විත වේ.

**විදේශීය කෘති එකතුව**

ජාතික පුස්තකාල එකතුව තුළ දේශීය කෘතිවලට අමතරව මෙරට සිටින විද්වතුන්ට හා පර්යේෂකයන්ට ප්‍රයෝජනවත් වේ යයි සිතෙන විදේශීය කෘති එකතුවකින් ද සමන්විත වේ. මෙම එකතුව තුළ සාහිත්‍ය, කලා, ක්‍රීඩා, අධ්‍යාපනය, පර්යේෂණ විද්‍යා, ආර්ථික, දේශපාලන, භූගෝල විද්‍යා ආදී විෂය ක්ෂේත්‍ර ගණනාවක් ආවරණය වන පරිදි වටිනා කෘතිවලින් මෙම එකතුව සමන්විත වේ.

**සිතියම් එකතුව**

ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් වූ සිතියම් දහසකට අධික ප්‍රමාණයක් මෙම එකතුවෙහි අඩංගු වන අතර එම සිතියම්, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස, දිස්ත්‍රික් හා පළාත් මට්ටමින් රජයේ මැනුම් දෙපාර්තමේන්තුව විසින් සම්පාදනය කරන ලද ඒවාය.

**මාර්ටින් වික්‍රමසිංහ එකතුව**

මහා ගත්කරු මාර්ටින් වික්‍රමසිංහ ශූරීන් රචනා කරන ලද කෘති ද සහිතව එතුමා ජීවත්ව සිටි කාලය තුළ එක් රැස්කර පරිශීලනය කරන ලද පන්දහසකට අධික පොත් සම්භාරයකින් යුත් මෙම එකතුව ජාතික පුස්තකාලයේ දෙවන මහලේ ස්වාධීන ඒකකයක් ලෙස පවත්වාගෙන යනු ලබයි. මෙම පොත් එකතුව මාර්ටින් වික්‍රමසිංහ භාරකාර මණ්ඩලය මගින් ජාතික පුස්තකාලය වෙත පරිත්‍යාග කළ අතර පොත්පත් වලට අමතරව එතුමා විසින් පරිහරණය කරන ලද ලියන මේසය, පුටුව, පෑන, යතුරු ලියනය, හාන්සි පුටුව, එතුමාගේ අත් අකුරින් ලියන ලද අත්පිටපත් ඇතුළු එතුමා විසින් එක් රැස් කරන ලද සංස්කෘතික වටිනාකමින් යුත් කෞතුක භාණ්ඩ රැසකින් මෙම එකතුව සමන්විත වේ.

**චීන පොත් එකතුව**

විවිධ රටවල පොත් එකතු ගොඩනැගීම යටතේ ශ්‍රී ලංකාවේ චීන තානාපති කාර්යාලයේ සහයෝගය ඇතිව චීන පොත් එකතුව (CHINA CORNER) 2010 වර්ෂයේ දී ආරම්භ කරන ලදී. මේ සඳහා සියලුම අනුග්‍රහය චීන ජාතික පුස්තකාලය සහ චීන රජය මගින් ලබා දී තිබේ. මෙම එකතුව තුළ චීන සංස්කෘතිය, කලාව, සිනමාව, ඉතිහාසය ආදී විෂය ක්ෂේත්‍ර නියෝජනය වන පරිදි ඉංග්‍රීසි හා චීන භාෂාවෙන් රචිත පොතපතින් මෙම එකතුව සමන්විත වේ.

**ඉරාන පොත් එකතුව**

ඉරාන රජයේ අනුග්‍රහය යටතේ ඉරාන පොත් එකතුව (IRAN CORNER) නමින් විශේෂ එකතුවක් මෙම වසරේ දී ගොඩනැගීමට අපේක්ෂා කෙරේ. මේ සඳහා නියමිත පොතපත හා සියලුම උපකරණ ඉරාන රජය මගින් ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය වෙත ලබා දෙනු ලැබේ. මෙම එකතුව ඉරාන සංස්කෘතිය, කලාව, සිනමාව ආදී ක්ෂේත්‍ර නියෝජනය වන පරිදි කෘති එකතුවකින් සමන්විත වේ.

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය මෙරට ප්‍රධානතම විමර්ශන පුස්තකාලය වශයෙන් රටෙහි සියලුම ජන කොටස් වෙත සිය සේවාව සැපයීම සඳහා මහත් පරිශ්‍රමයක් දරනු ලැබේ. ඒ සඳහා විවිධ සේවාවන් රැසක් ජාතික පුස්තකාලය මගින් පවත්වාගෙන යනු ලැබේ.

**පාඨක අධ්‍යාපන සේවා**

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය සතු විවිධ තොරතුරු සම්පත් හා සේවා පිළිබඳ ව විවිධ ක්‍රම ඔස්සේ පාඨකයන් දැනුවත් කිරීම සිදු කෙරේ. මේ සඳහා විවිධ දේශන හා සම්මන්ත්‍රණ පැවැත්වීම, අත් පත්‍රිකා, පෝස්ටර් හා විවිධ ප්‍රකාශන මුද්‍රණය කොට බෙදා හැරීම, පුවත්පත්, ගුවන්විදුලිය

හා රූපවාහිනිය වැනි ජන සන්නිවේදන මාධ්‍ය උපයෝගි කර ගනිමින් පාඨක ප්‍රජාව දැනුවත් කිරීම සිදු කෙරේ.

**විමර්ශන සේවා**

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය පූර්ණ වශයෙන් විමර්ශන පුස්තකාලයක් බැවින් විවිධ එකතු උපයෝගි කර ගනිමින් පාඨකයන් සඳහා කාර්යක්ෂම විමර්ශන සේවාවක් සැපයීමට සැම විටම කටයුතු කෙරේ.

**විමසීම් සේවා**

ලිපි, දුරකථන ඇමතුම්, ෆැක්ස් පණිවුඩ, විද්‍යුත් තැපැල මාර්ගයෙන් මෙන් ම පැමිණ කරන විමසීම් සඳහා ද ක්ෂණිකව තොරතුරු සැපයීමට කටයුතු කෙරේ. මේ සඳහා ජාතික පුස්තකාලයේ බිම් මහලෙහි ස්ථාපිත ප්‍රධාන තොරතුරු මේසයේ (Information Desk) කාර්ය මණ්ඩලය මගින් විමසීම් සම්බන්ධව සියලු කටයුතු සිදු කරනු ලැබේ.

**අන්තර් පුස්තකාල පිරුළු සේවා**

තම පුස්තකාලය මගින් පාඨකයන් වෙත සේවා සැපයීමේ දී තමන් සතුව නොමැති පොතපත තම පාඨකයන් වෙනුවෙන් ණය පදනමක් මත ලබා ගැනීම සඳහා ජාතික පුස්තකාලය මෙම සේවාව පවත්වාගෙන යනු ලැබේ. මෙම ක්‍රමයට මෙරට ප්‍රධාන පෙළේ පුස්තකාල ගණනාවක් සම්බන්ධ වී තිබේ.

**යොමුගත සේවා**

පාඨක අවශ්‍යතා අනුව ජාතික පුස්තකාලයෙන් ලබාගත නො හැකි තොරතුරු ලබා ගැනීම සඳහා පාඨකයන් යොමු කිරීම මේ මගින් සිදු කෙරේ. මේ සඳහා ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය මගින් පවත්වාගෙන යනු ලබන ජාතික ඒකාබද්ධ සූචිය (National Union Catalogue) ප්‍රයෝජනයට ගනු ලැබේ.

**ප්‍රතිරූපන සේවා**

ජාතික පුස්තකාලය විමර්ශන පුස්තකාලයක් බැවින් පාඨකයන්ට අවශ්‍ය තොරතුරු ඡායා පිටපත් කර ගැනීම, ස්කෑන් පිටපත් ලබා දීම, ඉලෙක්ට්‍රොනික ක්‍රම මගින් පිටපත් ලබා දීම සිදු කෙරේ.

## විවිධ තොරතුරු සේවා පවත්වාගෙන යාම

**ප්‍රවර්තන සාවධාන සේවය (Current Awareness Services)**

තම විෂය ක්ෂේත්‍රයට අදාළව ජාතික පුස්තකාලයෙහි ඇති නවතම පුස්තකාල ද්‍රව්‍ය සම්බන්ධයෙන් පර්යේෂකයන් ඇතුළු විවිධ පාඨකයන් දැනුවත් කිරීම මේ මගින් සිදු කෙරේ.

**වරණීය තොරතුරු සේවය (SDI Service)**

විවිධ ක්ෂේත්‍රයන්හි නියුතු පර්යේෂකයන්ගේ විශේෂ තොරතුරු අවශ්‍යතා හඳුනාගෙන නාමාවලි සැකසීම, අනුක්‍රමණිකාකරණය, පටුන පිටු සේවය, ක්ෂණික විමර්ශන සේවාවන් හා අනෙකුත් තොරතුරු සේවා මගින් පාඨක තොරතුරු අවශ්‍යතා සැපිරීම මේ මගින් සිදු කෙරේ.

**තොරතුරු ප්‍රති ඇසුරුම්කරණ සේවා**

විශේෂිත වූ විෂය ක්ෂේත්‍රයන්ට අදාළ වන පරිදි පුවත්පත්, සඟරා, පොත්පත් ආදියෙන් ලබා ගන්නා තොරතුරු උපයෝගිකරගෙන තොරතුරු කට්ටල සැකසීම හා ඒවා යාවත්කාලීන කිරීම සිදු කෙරේ. මේ මගින් විශේෂිත මාතෘකා පිළිබඳ තොරතුරු ගවේෂණය කරන පාඨකයන් වෙත පහසුවෙන් හා කාර්යක්ෂමව තොරතුරු සපයා ගැනීමට හැකියාව ලැබේ.

**අනුක්‍රමණිකාකරණය හා සාරාංශ සැකසීමේ සේවාව**

තොරතුරු ගවේෂණය වඩා පහසු කිරීමේ අරමුණෙන් විවිධ විෂයයන්ට අදාළව අනුක්‍රමණිකා හා සාරාංශ සම්පාදනය සිදු කෙරේ.

**අන්තර්ජාල පහසුකම් සේවා**

අන්තර්ජාලය මගින් තොරතුරු ගවේෂණය කරන්නන්ගේ පහසුව පිණිස බහු මාධ්‍ය ඒකකයක් මගින් පාඨකයන් සඳහා තොරතුරු ගවේෂණ පහසුකම් සපයා දී තිබේ.

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය විවිධ මට්ටමේ එකතු රැසක් භාවිතයට ගනිමින් පාඨකයන් සඳහා ප්‍රශස්ත තොරතුරු සේවාවක් සම්පාදනය කරමින් පුස්තකාල සේවාව මෙරට ප්‍රජාව අතර ජනප්‍රිය කරවීම මූලික අරමුණ බව සඳහන් කළ යුතුය.

# ශ්‍රී ලංකාවේ ග්‍රන්ථ විඥාපන පාලනය හා ජාතික පුස්තකාලයේ වගකීම

**චන්දිමා වාදසිංහ**

**අංශ ප්‍රධාන**

**ග්‍රන්ථ විඥාපන පාලන අංශය**

තාක්ෂණික සංවර්ධනය හා ගෝලීයකරණය නිසා ලෝකයේ තොරතුරු උත්පාදන වේගය ශීඝ්‍ර වීම මත වර්තමාන සමාජය තොරතුරු සමාජයක් බවට පත්ව තිබේ. එහෙයින් විවිධ ස්වරූපයෙන් ප්‍රකාශයට පත්වන තොරතුරු පර්යේෂකයින්ගේ මෙන්ම සාමාන්‍ය පාඨකයින්ගේ ද පහසුව සඳහා සංවිධානාත්මක ආකාරයකට ඉදිරිපත් කළ යුතුව ඇති අතර එම ක්‍රමවේදය ග්‍රන්ථ විඥාපන පාලනය මගින් සිදු වේ.

තොරතුරු එක්රැස් කිරිම හා එම තොරතුරුවලට පහසුවෙන් ප්‍රවේශ වීමට පහසුකම් සැපයීමත්, නිසි කළමනාකරණයකින් යුතුව අවශ්‍ය පාඨකයින්ට, අවශ්‍ය වේලාවට, අවශ්‍ය තොරතුරු, අවශ්‍ය ප්‍රමාණයට විධිමත්ව ලබාදීමත් ග්‍රන්ථ විඥාපන පාලනය මගින් ඉටු කළ යුතු කාර්යය වේ.

## ග්‍රන්ථ විඥාපන පාලනය (Bibliographic Control)

වර්තමාන ලෝකයේ තීරණාත්මක බලවේගය මිනිසා ලබා ඇති දියුණුව වන අතර ඒ සඳහා හේතුපාදක වී ඇත්තේ මිනිසා සතු දැනුමය. ශිෂ්ටාචාර ජීවිතය ආරම්භයේ සිටම කාර්මීකරණය දක්වා බිහිවූ දැනුම හා තොරතුරු පිළිබඳ වාර්තා තබා ගැනීම මානව සංවර්ධනයට අත්‍යාවශ්‍ය වන අතරම මෙහි දී ග්‍රන්ථ විඥාපන පාලනය ඉතා වැදගත් සාධකයක් බවට ද පත් වේ. ග්‍රන්ථ විඥාපන පාලනය යන්න පෘතුලාර්ථයෙන් ගත් කල්හි මිනිස් දැනුමට අදාළ සියලුම ලිඛිත හා ප්‍රකාශිත වාර්තා පිළිබඳ ඇති අවබෝධය වශයෙන් හැඳින්විය හැකිය (රණසිංහ. 1999 : පි. 6).

ග්‍රන්ථ විඥාපන පාලනය ප්‍රධාන කොටස් දෙකකි..

### 1. ජාතික ග්‍රන්ථ විඥාපන පාලනය (National Bibliographic Control)

කිසියම් දේශයක් හෙවත් රටක් තුළ විවිධ මාධ්‍යයන්ගෙන් ප්‍රකාශයට පත් කෙරෙන්නා වූ විවිධාකාර ප්‍රකාශන හඳුනාගෙන එකී ප්‍රකාශන සම්බන්ධ නිවැරදි ග්‍රන්ථ විද්‍යාත්මක තොරතුරු ඇතුළත් වාර්තා හැකි ඉක්මනින් පිළියෙල කොට උපයෝජකයින්ගේ ප්‍රයෝජනය සඳහා මුද්‍රිත හෝ වෙනත් ස්වරූපයකින් අඛණ්ඩව ඉදිරිපත් කිරීම ජාතික ග්‍රන්ථ විඥාපන පාලනය වශයෙන් හැඳින්විය හැකිය (රණසිංහ. 1999 : පි. 6).

### 2. විශ්ව ග්‍රන්ථ විඥාපන පාලනය (Universal Bibliographic Control)

ලෝකයේ සියලුම රටවල ප්‍රකාශිත සියලුම වර්ගයේ ප්‍රකාශන පිළිබඳ මූලික ග්‍රන්ථ විද්‍යාත්මක දත්ත ජාත්‍යන්තර වශයෙන් පිළිගත හැකි ස්වරූපයකින් ලොව පුරා වෙසෙන උපයෝජකයන්ට නොපමාව ලබාගැනීමට ඉඩ සැලැස්වීම විශ්ව ග්‍රන්ථ විඥාපන පාලනය වේ (රණසිංහ. 1999 : පි. 6).

විශ්ව ග්‍රන්ථ විඥාපන පාලනය හා ජාතික ග්‍රන්ථ විඥාපන පාලනය එකිනෙක හා සම්බන්ධ වන ක්‍රියාවලි දෙකක් වන අතර විශ්ව ග්‍රන්ථ විඥාපන පාලනය, ජාතික ග්‍රන්ථ විඥාපන පාලනයේ සාර්ථකත්වය මත රඳා පවතී.

ODLIS (Online Dictionary for Library and Information Science) වලට අනුව ග්‍රන්ථ විඥාපන පාලනය යනු පුස්තකාලයක හෝ ලේඛන එකතුවක ඇති සම්පත් හෝ ඒවායේ අඩංගු තොරතුරුවලට ප්‍රවේශය යොමු කරන අනුක්‍රමණිකා හෝ දත්ත පදනම් හා මූලාශ්‍ර පිළිබඳ ග්‍රන්ථ විද්‍යාත්මක වාර්තාවන් නිර්මාණය කිරීම, සංවිධානය කිරීම, කළමනාකරණය කිරීම, පවත්වාගෙන යාම යන සියලුම කටයුතු හා සම්බන්ධවන පුළුල් ක්‍රියාවලියකි. සමරූප සූචිකරණ කේත මගින් ග්‍රන්ථ විද්‍යාත්මක විස්තර හා විෂය ප්‍රවේශය ප්‍රමිතිගත කිරීම, වර්ගීකරණ ක්‍රම, නාම සාධිකාරි ලේඛන, විෂය ශීර්ෂ යෙදීම, සූචින්, ඒකාබද්ධ සූචින් සහ ආධාරක නිර්මාණය හා පවත්වාගෙන යාම සහ එකතුවේ ඇති සම්පත්වලට භෞතික ප්‍රවේශය ලබාදීම යන ක්‍රියාවලි ග්‍රන්ථ විඥාපන පාලනයට අයත් වේ.

ජාතික හා මානව සංවර්ධනය, පුස්තකාලවල එකතුව සංවර්ධනය, නව දැනුම නිෂ්පාදනය ආදිය සඳහා ග්‍රන්ථ විඥාපන පාලනය රටකට අත්‍යවශ්‍ය මෙවලමක් වේ. ඒ අනුව ප්‍රකාශිත හා අප්‍රකාශිත මුද්‍රිත, ශ්‍රව්‍ය දෘශ්‍ය හා වෙනත් සියලුම මාධ්‍ය ප්‍රමාණවත් ලෙස වාර්තාගත කිරීමේ ක්‍රමයක් දියුණු කිරීම හා පවත්වාගෙන යාමත්, එම වාර්තාවන් මානව දැනුමට හා තොරතුරුවලට එකතු කිරීමත්, ග්‍රන්ථ විඥාපන පාලනය වේ (Manual on Bibliographic Control).

Patrick Wilson (1968) ට අනුව ග්‍රන්ථ විඥාපන පාලනයට අදාළ ක්‍රියාවලි දෙකක් තිබේ. එනම් භාවිතයේ පාලනය (exploitative control) සහ විස්තරාත්මක පාලනය (descriptive control) වේ. භාවිතයේ පාලනය යනු ලේඛන හැකි උසස්ම ආකාරයෙන් භාවිත කිරීම සඳහා වූ කොන්දේසි වේ. විස්තරාත්මක පාලනය යනු ලේඛන පැහැදිලිව විස්තරාත්මක ලෙස වාර්තාගත කිරීම වේ.

මේ අනුව වාර්තාගත තොරතුරු පිළිගත් සම්මතයන්ට අනුව සංවිධානය කිරීමත්, එමගින් තොරතුරු ගවේෂණයට පහසුකම් සැලසීමත් ග්‍රන්ථ විඥාපන පාලනය වේ (Chan, 1994 ; p3).

මේ අනුව ග්‍රන්ථ විඥාපන පාලනය යනු මුද්‍රිත ද්‍රව්‍ය, ශ්‍රව්‍ය දෘශ්‍ය හා වෙනත් විවිධ මාධ්‍යන් පිළිබඳව තොරතුරු වාර්තාගත කිරීමේ ක්‍රමවේදයකි.

ග්‍රන්ථ විඥාපන පාලනය මගින් සිදුවන ක්‍රියාවලි 6 ක් රොනල්ඩ් හග්ලර් (Ronald Hagler ,1997) විග්‍රහ කර ඇත. එනම් ;

- සියලුම වර්ගවල තොරතුරු සම්පත් හඳුනාගැනීම
- එම තොරතුරු සම්පත්වල අඩංගු කරුණු හඳුනාගැනීම
- මෙම තොරතුරු සම්පත් ක්‍රමානුකූලව පුස්තකාල හා ලේඛනාගාර තුළ එක්රැස් කිරීම

- පිළිගත් නීතිරීති අනුව එම තොරතුරු සම්පත් පිළිබඳ ලැයිස්තු සකස් කිරීම
- මෙම තොරතුරු සම්පත් සඳහා ග්‍රන්ථනාමය, විෂය හා අනෙකුත් ප්‍රයෝජනවත් ප්‍රවේශයන් ලබාදීම
- මෙම තොරතුරු සම්පත්වල හෝ ඒවායේ පිටපත් සොයාගත හැකි මාර්ග සපයාදීම

**ජාතික පුස්තකාලයීය ග්‍රන්ථ විඥාපන සේවාවන්**

තොරතුරු ගවේෂණය කරනු ලබන පර්යේෂකයින්, විද්වතුන් හා පාඨකයින් ගේ අවශ්‍යතා සපුරාලීම පෙරදැරිකරගෙන ජාතික පුස්තකාල හා ප්‍රලේඛ සේවා මණ්ඩලයේ ග්‍රන්ථ විඥාපන පාලන අංශය විසින් ග්‍රන්ථ විඥාපන සේවාවන් රාශියක් ක්‍රියාත්මක කරනු ලැබේ.

**ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලිය (ප්‍රවර්තන)**

මාසික ප්‍රකාශනයක් වශයෙන් ප්‍රකාශයට පත්වන මෙහි සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාත්‍රයෙන් ම ශ්‍රී ලංකාව තුළ පළවන ප්‍රකාශන, ශ්‍රී ලංකාව පිළිබඳව විදේශීය රටවල පළවන ප්‍රකාශන සහ විදේශයන්හි සිටින ශ්‍රී ලාංකිකයන් විසින් රචනා කරන ලද ප්‍රකාශනවල ග්‍රන්ථ විද්‍යාත්මක තොරතුරු අන්තර්ගත කරනු ලැබේ.

ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව විසින් 1962 වර්ෂයේ දී ප්‍රථම වරට ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලියේ (Ceylon National Bibliography) සම්පාදන කටයුතු ආරම්භ කරන ලදී. මෙම කාර්ය ආරම්භ කිරීම සඳහා 1961 වර්ෂයේ යුනෙස්කෝ සංවිධානය අනුග්‍රහය ලබාදීමත්, මෙම ආධාර ව්‍යාපෘතිය යටතේ බ්‍රිතාන්‍ය ජාතික ග්‍රන්ථ නාමාවලියේ සංස්කාරක ලෙස කටයුතු කළ ඒ. ජේ. වෙල්ස් මහතා ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලිය ආරම්භ කිරීම සඳහා 1961 වර්ෂයේ දී ලංකාවට සම්ප්‍රාප්ත වීමත් ඉතිහාසයේ වැදගත් සංධිස්ථානයක් විය (අමරසිරි, 1995: පි.16). ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලියේ අත්හදා බැලීමක් වශයෙන් 1962 වර්ෂයේ නොවැම්බර් කලාපය සම්පාදනය කෙරුණ ද මෙහි වෙළුම 1 හා අංක 1 වශයෙන් 1963 ජනවාරි කලාපය නිල වශයෙන් ප්‍රකාශයට පත්කර ඇත. ජාතික ග්‍රන්ථ නාමාවලි සම්පාදනය සෑම රටකම ජාතික මට්ටමේ පුස්තකාල අධිකාරියක් මගින් කළ යුතු කාර්යක් බැවින් 1973 වර්ෂයේ දී ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයට මෙහි වගකීම පවරා ඇත (අමරසිරි, 1995: පි. 24).

මෙම ග්‍රන්ථ නාමාවලිය සම්පාදනය සඳහා ජාතික ලේඛනාරක්ෂක දොපාර්තමේන්තුවේ නීතිමය තැන්පතු ක්‍රමය යටතේ ජාතික පුස්තකාලයේ තැන්පත් කරනු ලබන ප්‍රකාශන, ජාතික පුස්තකාල එකතුවට ප්‍රතිග්‍රහණය කරනු ලබන ප්‍රකාශන සහ අන්තර්ජාතික ප්‍රමිති අංක ව්‍යාපෘති යටතේ අංක ලබා මුද්‍රණය කර ප්‍රකාශකයින් හා ලේඛකයන් ස්වේච්ඡාවෙන් ලබා දෙන ප්‍රකාශන අන්තර්ගත කරනු ලැබේ. ඒ අනුව මුද්‍රිත ප්‍රකාශන, ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය, පුවත්පත් හා වාර ප්‍රකාශනවල පළමු කලාපය, නව අන්තර්ජාතික ප්‍රමිති ග්‍රන්ථ අංක ලබා ඇති පුනර්මුද්‍රණ සහ ප්‍රකාශයට පත් නොවූ පශ්චාත් උපාධි නිබන්ධන ආදියෙහි ග්‍රන්ථ විද්‍යාත්මක තොරතුරු මෙම නාමාවලියට ඇතුළත් වේ.

මෙහි සූචිකරණ කටයුතු ඇංග්ලෝ ඇමරිකානු සූචිකරණ නීති සංග්‍රහයේ 2 වන සංස්කරණයට අනුව සහ වර්ගීකරණ කටයුතු ඩිවි දශම වර්ගීකරණයේ 23 වන සංස්කරණයට අනුව සිදුකරනු ලැබේ. මෙම නාමාවලියට ඇතුළත් කරනු ලබන ග්‍රන්ථ විද්‍යාත්මක තොරතුරු, විෂයන් අනුව අකාරාදිව ගොනුකර ඇති අතර පාඨකයින්ගේ පහසුව සඳහා කර්තෘනාම, ග්‍රන්ථනාම හා විෂය අනුක්‍රමණිකාවන් ඇතුළු කර තිබේ.

පුස්තකාල සඳහා පොත් තේරීම, ග්‍රන්ථ වර්ගීකරණ හා සූචිකරණ කාර්යයන්, ග්‍රන්ථ නාමාවලි සම්පාදනය, සාහිත්‍යය ගවේෂණය, විමර්ශන කටයුතු, ප්‍රකාශන කර්මාන්තය පිළිබඳව පර්යේෂණ කිරීම ආදී කාර්යයන් සඳහාත්, නවතම තොරතුරු ගවේෂණය කරනු ලබන පර්යේෂකයින්, විද්වතුන්, ප්‍රකාශකයින්, පුස්තකාල හා පාඨකයින් සඳහාත්, මෙය බෙහෙවින් ප්‍රයෝජනවත් මූලාශ්‍රයක් බවට පත්ව තිබේ.

**ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලිය (පූර්වකාලීන)**

ශ්‍රී ලංකාවට මුද්‍රණ ශිල්පය හඳුන්වා දුන් 1737 වර්ෂයේ මුද්‍රණ ද්වාරයෙන් නිකුත් වූ ප්‍රථම ග්‍රන්ථය වශයෙන් සැලකෙන්නේ ක්‍රිස්තියානි යාච්ඤා පොත හෙවත් ලංසි යාච්ඤා පොතයි. එතැන් සිට (1737 වර්ෂයේ සිට) ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලිය (ප්‍රවර්තන) ආරම්භ කළ 1963 වර්ෂය දක්වා වූ වර්ෂ 225 ක කාල පරාසය තුළ ප්‍රකාශයට පත් වූ සිංහල දෙමළ සහ ඉංග්‍රීසි ග්‍රන්ථ පිළිබඳ ග්‍රන්ථ විද්‍යාත්මක තොරතුරු ආවරණය කිරීම මෙම ව්‍යාපෘතිය මගින් සිදුවේ. ඒ අනුව 1737 වර්ෂයේ සිට 1940 වර්ෂය දක්වා වෙළුම් වශයෙන් මෙම නාමාවලී සම්පාදනය කර ප්‍රකාශයට පත් කර ඇත. මෙහි සැකැස්ම ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලියට සමාන වේ.
ප්‍රකාශිත වෙළුම්;

| | |
|---|---|
| 1737- 1884 | සිංහල දෙමළ සහ ඉංග්‍රීසි |
| 1885- 1900 | සිංහල දෙමළ සහ ඉංග්‍රීසි |
| 1901- 1910 | සිංහල හා ඉංග්‍රීසි |
| 1911- 1920 | සිංහල හා ඉංග්‍රීසි |
| 1921- 1930 | සිංහල හා ඉංග්‍රීසි |
| 1931- 1940 | සිංහල හා ඉංග්‍රීසි |

දැනට මෙහි 1901-1940 කාල පරාසය ආවරණය කරමින් දෙමළ වෙළුම ද, 1941-1961 වර්ෂයන් ආවරණය කරමින් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි වෙළුම ද සම්පාදනය කිරීමට නියමිතව ඇති අතර එම කාල පරාසයන් ආවරණය කිරීමෙන් පසු මෙම ව්‍යාපෘතිය නිමවනු ඇත. ප්‍රකාශන ඉතිහාසය පිළිබඳ ගවේෂණය කරන පර්යේෂකයින්ට බෙහෙවින් ප්‍රයෝජනවත් මූලාශ්‍රයන් වන මෙය අතීත පරම්පරාවන්ගේ දැනුම් සම්භාරය එක්රැස් කර තිබෙන මූලාශ්‍රයක් ලෙස ද හැඳින්විය හැකිය.

**ශ්‍රී ලංකා වාර සඟරා ලිපි අනුක්‍රමණිකාව**

විවිධ පර්යේෂණයන්හි නියැලෙන විද්වතුන්ට පර්යේෂකයින්ට මෙන් ම පාඨකයන්ට තොරතුරු

පහසුවෙන් හා කඩිනමින් ගවේෂණය කිරීමට මෙමගින් හැකිවන අතර මෙය කාලීන දැනුම ලබාදීමේ මූලාශ්‍රයක් ලෙස ද හැඳින්විය හැකිය. ත්‍රෛමාසිකව ප්‍රකාශයට පත් කරනු ලබන මෙම අනුක්‍රමණිකාවේ, ශ්‍රී ලංකාව තුළ ප්‍රකාශයට පත්වන සිංහල දෙමළ සහ ඉංග්‍රීසි වාරසඟරාවන්හි පළවන ලිපි, ශ්‍රී ලංකාව පිළිබඳ විදේශීය වාර සඟරාවල පළවන ලිපි සහ විදේශීය වාරසඟරාවල ශ්‍රී ලාංකිකයන් විසින් රචනා කරනු ලබන ලිපිවල ග්‍රන්ථ විද්‍යාත්මක තොරතුරු අන්තර්ගත වේ. පාඨකයන්ට පහසුවෙන් හා කඩිනමින් තොරතුරු වෙත ප්‍රවේශ වීම සඳහා ලිපිනාම, කර්තෘනාම සහ විෂය අනුක්‍රමණිකාවන් මෙහි ඇතුළත් කර තිබේ.

## සාධිකාරී සිංහල ග්‍රන්ථනාම ලේඛනය

පැරණි සිංහල සාහිත්‍ය කෘති සංස්කරණයේ දී එහි පළමු ග්‍රන්ථ නාමය විවිධ සංස්කරණ ලෙසින් ප්‍රකාශයට පත් කර ඇත. මෙවැනි අවස්ථාවල දී තොරතුරු සංවිධානය ඉතා ගැටලුකාරී වන බැවින් එම සියලුම සංස්කරණ ඒකීය ග්‍රන්ථනාමයක් යටතේ ඒකරාශි කර, පුස්තකාලවල ක්‍රමවත් ආකාරයට දැනුම සංවිධානය කිරීම මෙහි අරමුණයි. පුස්තකාලවල සූචිකරණ කටයුතුවල ඒකමිතියක් පවත්වාගෙන යාම සඳහාත්, ද්විත්වකරණයන් වැළැක්වීම සඳහාත්, සිංහල සාහිත්‍යය පිළිබඳ පර්යේෂණයන්හි නිරත පර්යේෂකයින් සඳහාත් මෙය මාර්ගෝපදේශ ග්‍රන්ථයක් වනු ඇත.

මෙහි පළමු අදියර ලෙස අනුරාධපුර යුගයේ සිට කෝට්ටේ යුගය තෙක් ප්‍රකාශයට පත් වූ කෘති පිළිබඳ ලේඛනයක් සම්පාදනය කර ඇත. එම ලේඛනය නැවත සංශෝධනය කරමින්, ආරම්භයේ සිට වර්ෂ 2000 දක්වා ප්‍රකාශයට පත් වී ඇති, පැරණි සිංහල සාහිත්‍යය පිළිබඳ විවිධ සංස්කරණයන්හි ග්‍රන්ථ නාමයන් එක්රැස් කර සාධිකාරී සිංහල ග්‍රන්ථනාම ලේඛනය සම්පාදනය කිරීම සිදුවේ.

## ආයතන නාම සාධිකාරී ලේඛනය

රජයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා අනෙකුත් රජයේ ව්‍යවස්ථාපිත ආයතනයන්හි ව්‍යවහාරික නාමයන් විවිධ කාලවකවානුවල දී සංශෝධනය වි ඇත. එබැවින් ඒ ඒ කාලපරිච්ඡේදවල රාජ්‍ය ආයතනයන්හි භාවිත කළ නාමය හඳුනාගැනීම තොරතුරු ගවේෂණයේ දී අත්‍යවශ්‍ය වේ. රාජ්‍ය ආයතනවල නාමයන් වෙනස් වී ඇති ආකාරය පිළිබඳ මෙම ලේඛනය පර්යේෂකයින්ට මෙන්ම රාජ්‍ය ආයතනවලට ද බෙහෙවින් වැදගත් මාර්ගෝපදේශ ග්‍රන්ථයක් වනු ඇත.

## ප්‍රකාශනගත සූචිකරණ දත්ත (Cataloguing-In-Publication Data)

කිසියම් කෘතියක් ප්‍රකාශයට පත් කිරීමට පෙර සූචිගත කිරීම සහ එම ග්‍රන්ථ විද්‍යාත්මක තොරතුරු අදාළ කෘතියේ මුද්‍රණය කිරීම හෝ වෙනත් ක්‍රම මගින් ප්‍රකාශයට පත් කිරීම ප්‍රකාශනගත සූචිකරණ දත්ත යනුවෙන් හැඳින්වේ (අලහකෝන්, 1997: පි. 20). පුස්තකාල ක්ෂේත්‍රයේ සූචිකරණ කටයුතු සඳහාත්, ප්‍රකාශන ක්ෂේත්‍රයේ ප්‍රමිතියක් ඇති කිරීමත් අරමුණු කරමින් ශ්‍රී ලාංකීය ප්‍රකාශන හා පුස්තකාල ක්ෂේත්‍රයේ ඉදිරි පියවරක් තබමින් 1996 වර්ෂයේදී මෙම සූචිකරණ දත්ත ලබාදීම ආරම්භ කර ඇත. පුස්තකාලවල සූචිකරණ හා වර්ගීකරණ කටයුතු පහසු සහ

කාර්යක්ෂම කිරීම, ග්‍රන්ථ ප්‍රකාශන හා අලෙවිය සඳහා කෘතිය පිළිබඳ සියලු තොරතුරු එකවර හඳුනාගැනීමට හැකිවීම සහ නියමිත පුස්තකාල ප්‍රමිතිවලට අනුව ප්‍රකාශනගත සූචිකරණ දත්ත සම්පාදනය කරන බැවින් පුස්තකාලවලට පොත්පත් අත්පත් කරගත් පසු ප්‍රමාදයකින් තොරව ඒ පිළිබඳ තොරතුරු පාඨකයින්ට ලබාදීමට හැකිවීම ආදිය මින් ලබාගත හැකි ප්‍රයෝජන වේ.

**ශ්‍රී ලංකා රජයේ ප්‍රකාශන නාමාවලිය**

ශ්‍රී ලංකාවේ රාජ්‍ය ආයතන විසින් ප්‍රකාශයට පත් කරනු ලබන ප්‍රකාශනයන්හි, ග්‍රන්ථ විද්‍යාත්මක තොරතුරු අන්තර්ගත මෙම නාමාවලිය සම්පාදනය 1990 වර්ෂයේදී ආරම්භ කර ඇත. පාර්ලිමේන්තු පනත්, පනත් කෙටුම්පත්, පාලන වාර්තා, ප්‍රගති වාර්තා, නියමු පොත්, වාර්ෂික වාර්තා, නාමාවලි, අනුක්‍රමණිකා ආදී ප්‍රකාශන පිළිබඳ තොරතුරු මෙම නාමාවලියට ඇතුළත් වී තිබේ. රාජ්‍ය ප්‍රකාශන පිළිබඳ තොරතුරු ඇතුළත් මෙම නාමාවලිය ඒ පිළිබඳ පර්යේෂණයන්හි නිරතවන්නන්ට මෙන්ම ඒ පිළිබඳ තොරතුරු ගවේෂණයේ නිරත පාඨකයින්ට බෙහෙවින් ප්‍රයෝජනවත් මූලාශ්‍රයක් වේ. 1990 වර්ෂයේ සිට 2008 දක්වා කාල පරාසයට අදාළ ශ්‍රී ලංකා රජයේ ප්‍රකාශන නාමාවලිය දැනට වෙළුම් වශයෙන් ප්‍රකාශයට පත් කර ඇත.

**ශ්‍රී ලංකා සමුළු අනුක්‍රමණිකාව**

ශ්‍රී ලංකාවේ විවිධ ආයතන විසින් පවත්වනු ලබන ජාතික හා ජාත්‍යන්තර සම්මන්ත්‍රණ, සමුළු, වැඩමුළු ආදිය පිළිබඳ තොරතුරු ගවේෂණය කරනු ලබන පාඨකයින්ගේ අවශ්‍යතා සඳහා මෙම අනුක්‍රමණිකාව සම්පාදනය කරනු ලබන අතර මෙහි සම්මන්ත්‍රණ මාතෘකාව, ස්ථානය, දිනය, සංවිධානය කරනු ලබන ආයතනය, විෂය ක්ෂේත්‍රය වැනි තොරතුරු ඇතුළත් කර ඇත. 2006 වර්ෂයට පෙර මුද්‍රිත ප්‍රකාශනයක් ලෙස සම්පාදනය කරනු ලැබූ මෙම අනුක්‍රමණිකාව, පාඨකයන්ට හා පර්යේෂකයන්ට කඩිනමින් තොරතුරු ලබාදීමේ අරමුණින් වර්තමානයේ දී දත්ත පදනමක් වශයෙන් සම්පාදනය කෙරේ. ශ්‍රී ලංකාවේ පැවති සමුළු, සම්මන්ත්‍රණ හා වැඩමුළු පිළිබඳ තොරතුරු ගවේෂණය කරන්නන් සඳහා මෙම දත්ත පදනම ජාතික පුස්තකාල වෙබ් අඩවියට සම්බන්ධ කර ඇත.

**ශ්‍රී ලංකා පශ්චාත් උපාධි නිබන්ධන අනුක්‍රමණිකාව**

පශ්චාත් උපාධි ලබා ගැනීමේ අරමුණෙන් ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලවලට ඉදිරිපත් කෙරෙන ශාස්ත්‍රපති (MA), දර්ශනපති (M. Phil) හා දර්ශන විශාරද (PhD) උපාධි නිබන්ධන පිළිබඳ තොරතුරු එක් මූලාශ්‍රයකින් ගවේෂණය කිරීමට පහසුකම් සැලසීමේ අරමුණින් මෙම අනුක්‍රමණිකාව සම්පාදනය කෙරේ පර්යේෂණයන්හි නිරත විද්වතුන්ට මෙය බෙහෙවින් ප්‍රයෝජනවත් මූලාශ්‍රයක් වන අතර මේ වන විට 1981- 2006 කාලපරිච්ඡේදය ආවරණය කරමින් පශ්චාත් උපාධි නිබන්ධන අනුක්‍රමණිකාව වෙළුම් වශයෙන් ප්‍රකාශයට පත් කර ඇත.

**ශ්‍රී ලංකා පර්යේෂණ වාර්තා අනුක්‍රමණිකාව**

ශ්‍රී ලංකාවේ විවිධ ආයතන හා විද්වතුන් විසින් සම්පාදනය කරන ලද පර්යේෂණ වාර්තා

පිළිබඳ තොරතුරු ඇතුළත් මෙම අනුක්‍රමණිකාව සම්පාදනය 2005 වර්ෂයේදී ආරම්භ කරන ලදී. විවිධ පර්යේෂණවල නිරතවන විද්වතුන්ට හා පර්යේෂකයන්ට බෙහෙවින් ප්‍රයෝජනවත් වන මෙම මූලාශ්‍රය මේ වන විට 2005- 2009 කාලපරිච්ඡේදය ආවරණය කරමින් පළමු හා දෙවන වෙළුම් ප්‍රකාශයට පත් කර ඇත.

**ශ්‍රී ලංකාවේ පුස්තකාල වෘත්තිකයින් පිළිබඳ තොරතුරු සංග්‍රහය**

විශේෂ ග්‍රන්ථ නාමාවලි සම්පාදනය කිරීම යටතේ 2011 වර්ෂයේ දී මෙහි සම්පාදන කටයුතු ආරම්භ කරන ලදී. පුස්තකාල ක්ෂේත්‍රයේ නිරත සියලුම විද්වතුන් පිළිබඳ තොරතුරු සංග්‍රහයක් මෙතෙක් ප්‍රකාශයට පත්කර නොමැති බැවින් මෙම තොරතුරු සංග්‍රහය පුස්තකාල ක්ෂේත්‍රයේ නිරත වෘත්තිකයින්ට බෙහෙවින් ප්‍රයෝජනවත් මූලාශ්‍රයක් වනු ඇත.

**ශ්‍රී ලංකාවේ පුස්තකාල හා විඥාපන විද්‍යා ග්‍රන්ථ පිළිබඳ ග්‍රන්ථ නාමාවලිය**

ශ්‍රී ලංකාව තුළ ප්‍රකාශයට පත් කර ඇති පුස්තකාල හා විඥාපන විද්‍යා ක්ෂේත්‍රයට අදාළ ග්‍රන්ථයන්හි, ග්‍රන්ථ විද්‍යාත්මක තොරතුරු ඇතුළත් මෙම ග්‍රන්ථ නාමාවලියේ සම්පාදන කටයුතු 2012 වර්ෂයේ දී ආරම්භ කරන ලදී. පුස්තකාල විද්‍යා ක්ෂේත්‍රයට අදාළ ග්‍රන්ථයන්හි තොරතුරු අන්තර්ගත මෙම නාමාවලිය විද්වතුන්ට මෙන්ම සිසුන්ට ද බෙහෙවින් ප්‍රයෝජනවත් මූලාශ්‍රයක් වේ.

**ශ්‍රී ලංකා පුවත්පත් ලිපි අනුක්‍රමණිකාව**

ශ්‍රී ලංකාවේ ප්‍රකාශයට පත්වන සිංහල, දෙමළ හා ඉංග්‍රීසි පුවත්පත්වල අන්තර්ගත ශාස්ත්‍රීය ලිපි පිළිබඳ තොරතුරු මෙහි ඇතුළත් වේ. 1988 වර්ෂයේදී ආරම්භ කරන ලද මෙම ව්‍යාපෘතිය මගින් පර්යේෂකයින්ට තම අවශ්‍යතාව පරිදි තොරතුරු ගවේෂණය කිරීම සඳහා මෙම අනුක්‍රමණිකාව දත්ත පදනමක් වශයෙන් සම්පාදනය කරනු ලබන අතර එය අන්තර්ජාලය ඔස්සේ ගවේෂණය කිරීමට පහසුකම් සලසා ඇත. මෙම දත්ත පදනම කාලීන මාතෘකා හා විවිධ සංසිද්ධීන් පිළිබඳ තොරතුරු ගවේෂණය කරනු ලබන පාඨකයින්ට පහසුවෙන් තොරතුරු කරා ප්‍රවේශ විය හැකි මූලාශ්‍රයකි.

**පුස්තකාල ද්‍රව්‍ය සූචිගත කිරීම හා ජාතික පුස්තකාල සූචිය පරිගණකගත කිරීම**

ජාතික පුස්තකාලය පරිහරණය කරනු ලබන සියලුම පාඨකයින්ට තම අවශ්‍යතාව පරිදි තොරතුරු පහසුවෙන් හා කඩිනමින් ගවේෂණය කිරීමේ අරමුණෙන් ජාතික පුස්තකාල පරිගණකගත සූචිය සම්පාදනය කර ඇත. අන්තර්ජාතික ප්‍රමිතීන්ට අනුකූලව Alice for Windows මෘදුකාංගය භාවිත කරමින් පරිගණකගත සූචිය සකස් කර ඇත. මෙහි ජාතික පුස්තකාලයට ප්‍රතිග්‍රහණය කරනු ලබන සියලුම මුද්‍රිත, ශ්‍රව්‍ය දෘශ්‍ය, විද්‍යුත් යනාදී විවිධ වර්ගයේ පුස්තකාල ද්‍රව්‍යයන්හි ග්‍රන්ථ විද්‍යාත්මක තොරතුරු ඇතුළත් වී ඇත. මෙමගින් කර්තෘනාමය, ග්‍රන්ථනාමය, ප්‍රකාශක, ISBN අංකය, විෂය, වර්ග අංකය, ජාතික පුස්තකාල ප්‍රතිග්‍රහණ අංකය ආදිය මගින් පාඨකයින්ට තම අවශ්‍යතාවට අනුව ගවේෂණය සඳහා පහසුකම් සලසා ඇත.

මෙම ග්‍රන්ථ විද්‍යාත්මක තොරතුරු ප්‍රවේශ කිරීමේ දී වර්ගීකරණ කටයුතු සඳහා ඩිවි දශම වර්ගීකරණයේ 23 වන සංස්කරණය භාවිත කරන අතර විෂය ශීර්ෂ යෙදීම සඳහා කොංග්‍රස් පුස්තකාල විෂය ශීර්ෂ (Congress Subject Headings) භාවිත කරනු ලැබේ. මෙමගින් වඩාත් කාර්යක්ෂම හා ඵලදායී පාඨක හා තොරතුරු සේවාවක් ලබාදීමට පරිගණකගත සූචිය අන්තර්ජාලයට සම්බන්ධ කර ඇත.

**ජාතික ඒකාබද්ධ සූචිය**

රට තුළ විසිරී පවතින තොරතුරු පාඨකයින්ට ප්‍රයෝජනවත් මෙන්ම පහසුවන පරිදි ගවේෂණය කිරීමට පහසුකම් සැලසීමේ අරමුණෙන් ජාතික ඒකාබද්ධ සූචිය සම්පාදනය කර ඇත. මේ සඳහා දායක වන පුස්තකාලයන්හි සියලුම පුස්තකාල ද්‍රව්‍යවලට අදාළ තොරතුරු ජාතික ඒකාබද්ධ සූචියෙහි අන්තර්ගත වී තිබේ. මෙමගින් ජාතික පුස්තකාලයට පැමිණෙන පාඨකයින්ට අවශ්‍ය පුස්තකාල ද්‍රව්‍ය නොමැති නම් එම පුස්තකාල ද්‍රව්‍ය තිබෙන වෙනත් පුස්තකාලයක් වෙත යොමු කිරීමේ හැකියාව පවතී. තවද ජාතික ඒකාබද්ධ සූචිය සඳහා දායකත්වය දක්වන පුස්තකාලයක, පරිගණකගත සූචියෙහි තොරතුරු යම් හෙයකින් මැකී ගියහොත් එම තොරතුරු නැවත ලබා ගැනීමේ හැකියාව මේ සඳහා දායකත්වය ලබාගන්නා පුස්තකාලවලට සැපයෙන මහඟු සේවාවකි. සියලුම පුස්තකාලයන්හි තොරතුරු එක්රැස්කරමින් ජාතික ඒකාබද්ධ සූචිය පුලුල් කිරීම සඳහා ප්‍රතිපත්තියක් සම්පාදනය කිරීමට හා එහි ඉදිරි සංවර්ධන කාර්යයන් කඩිනමින් ඉටු කිරීම මේ වන විට කටයුතු කරමින් පවතී.

**දේශීය පුස්තකාල ජාල කටයුතු**

ජාතික මට්ටමින් ක්‍රියාත්මක වන පුස්තකාල ජාල සමග සම්බන්ධතා පැවැත්වීම සහ දැනට ක්‍රියාත්මක වන පුස්තකාල ජාල මගින් පවත්වන පුහුණු පාඨමාලා, වැඩමුළු, රැස්වීම්, සම්මන්ත්‍රණවලට සහභාගිවෙමින් පුස්තකාල ජාල සමඟ සබඳතාවක් පවත්වාගෙන යාම සිදුවේ. මෙයට අදාලව පුස්තකාල ක්ෂේත්‍රයේ සිදුවන නව සිදුවීම් ඇතුළත් කරමින් ඉංග්‍රීසි භාෂාවෙන් *නැට්නෙට් ලංකා* (NATNET Lanka) පුවත්පත් පත්‍රිකාව ත්‍රෛමාසිකව ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**වැඩමුළු පැවැත්වීම**

ක්ෂේත්‍රයේ නිරතවන්නන් පුහුණු කිරීමේ අරමුණින් ප්‍රලේඛන මූලාශ්‍ර සම්පාදනය සහ වර්ගීකරණය හා සූචිකරණය පිළිබඳ වැඩමුළු පැවැත්වීම සිදු කරනු ලැබේ.

**සමාලෝචනය**

ශ්‍රී ලංකාවේ ප්‍රකාශයට පත්වන තොරතුරු, කාලීනව, කඩිනමින් හා පහසුවෙන් විද්වතුන්, පර්යේෂකයින් සහ පාඨකයින් වෙත ලබා දීමේ අරමුණින් ග්‍රන්ථ විඥාපන පාලන කටයුතුවල දී ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය සුවිශේෂී කාර්යභාරයක් ඉටුකරනු ලබයි.

**විමර්ශන :**

අමරසිරි, උපාලි (1995), *ජාතියේ මතකය :ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලිය,* **පුස්තකාල ප්‍රවෘත්ත**, වෙ. 16 ක. 1 ජන-මාර්තු, කොළඹ: ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය

අලහකෝන්, යූ. පී. (1997). *ප්‍රකාශනගත සූචිකරණ දත්ත*, **පුස්තකාල ප්‍රවෘත්ති**, වෙ. 18, ක. 2, අප්‍රේල් -ජුනි, කොළඹ: ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය

රණසිංහ, පියදාස (1999). *ග්‍රන්ථ විඥාපන පාලනය,* **පුස්තකාල ප්‍රවෘත්ති**, වෙ. 20, ක. 4, ඔක්.-දෙසැ., කොළඹ: ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය

Chan, L. M. (1994), Cataloguing and classification : an introduction (2nd ed.), New York : McGraw-Hill

Hagler, Ronald (1997), The bibliographic record and Information Technology 3rd ed.,Chicago : American Library Association

Manual on Bibliographic Control (1983), Compiled by the IFLA International office for UBC, Paris: United Nations Educational Scientific and Cultural Organization

Wilson, Patrick (1968), Two kinds of power : an essay on bibliographical control,Berkeley : University of California Press

## ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය

**සේවාවන්** : විමර්ශන, ලේඛන සැපයීම්, අන්තර් පුස්තකාල පිරුළු සේවා, ග්‍රන්ථ විඥාපන සේවාව, ජාතික ඒකාබද්ධ සූචිය, යොමුගත සේවාව, ප්‍රතිරූපන සේවා, අන්තර්ජාල පහසුකම්.

**එකතුන්** :
- විමර්ශන ග්‍රන්ථ - විශ්වකෝෂ, ශබ්ද කෝෂ, වාර්ෂික ග්‍රන්ථ
- සිතියම් එකතුව
- දුර්ලභ කෘති එකතුව
- පුවත්පත් (1976 වසරේ සිට) සිංහල, දෙමළ, ඉංග්‍රීසි (දේශීය පුවත්පත් පමණි)
- වාර සඟරා - දේශීය සහ විදේශීය
- ජාතික සහ අන්තර්ජාතික ප්‍රවෘත්ති සඟරා
- විද්‍යා හා තාක්ෂණික ග්‍රන්ථ එකතුව
- යුනෙස්කෝ පොත් එකතුව
- පැරණි පුස්කොළ පොත් එකතුව
- ශ්‍රී ලංකා එකතුව
- විද්‍යුත් මාධ්‍ය එකතුව
- ශ්‍රව්‍ය දෘශ්‍ය එකතුව
- රජයේ ප්‍රකාශන එකතුව
- පුස්තකාල හා විඥාපන විද්‍යා එකතුව
- පශ්චාත් නිබන්ධන එකතුව
- ජනශ්‍රැති එකතුව
- නීත්‍යානුකූල තැන්පතු එකතුව

ජාතික පුස්තකාලයේ පාඨක සේවා අංශය සඳුදා සිට සෙනසුරාදා දක්වා විවෘතව පවතී.

**විවෘතව තබන වේලාවන්**

සඳුදා, බදාදා, සිකුරාදා සහ සෙනසුරාදා දිනවල පෙ. ව. 8.30 සිට ප. ව. 4.15 දක්වා අඟහරුවාදා සහ බ්‍රහස්පතින්දා දිනවල පෙ. ව. 8.30 සිට ප. ව. 6.15 දක්වා (රජයේ ප්‍රසිද්ධ නිවාඩු දිනවල වසා තබනු ලැබේ)

**සාමාජික ගාස්තු**

| | | |
|---|---|---|
| දිනකට | : | රු. 20.00 |
| මාස 03 කට | : | රු. 100.00 |
| අවුරුදු 01 කට | : | රු. 350.00 |
| යාවජීව සාමාජිකත්වය | : | රු. 1000.00 |
| ආයතනික සාමාජිකත්වය (වසරක් සඳහා) | : | රු. 2500.00 |

**විස්තර සඳහා**

අංශ ප්‍රධාන
පාඨක සේවා අංශය
ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානය
අංක 14, නිදහස් මාවත, කොළඹ 07
දුරකථන අංක : 011-2674386 011-2685197
ෆැක්ස් : 011-2685201
වෙබ් අඩවිය : http://www.natlib.lk
ඊ මේල් : reader@mail.natlib.lk

# පුස්තකාල ද්‍රව්‍ය සංරක්ෂණය හා ප්‍රතිෂ්ඨාපනය සඳහා වන උපායමාර්ග


**උදය කබ්රාල්**

**අංශ ප්‍රධාන**

**සංරක්ෂණ හා ප්‍රතිෂ්ඨාපන අංශය**


සංරක්ෂණ හා ප්‍රතිෂ්ඨාපන අංශය ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානයට අයත් සුවිශේෂී අංශයකි. ජාතික පොත් එකතුවට ප්‍රතිග්‍රහණය කරන සියලුම පුස්තකාල ද්‍රව්‍යවල ආරක්ෂණයේ ප්‍රධාන වගකීම මෙම අංශයට පැවරේ. මෙම අංශයේ ප්‍රධාන කාර්යභාරය වන්නේ පුස්තකාල ද්‍රව්‍යවල සංරක්ෂණ හා ප්‍රතිෂ්ඨාපන කටයුතු සිදු කිරීමයි.

පුස්තකාල ද්‍රව්‍ය සංරක්ෂණය හා ප්‍රතිෂ්ඨාපනය උදෙසා මෙම අංශය මගින් සිදු කරන කාර්යභාරය ප්‍රධාන අංශ 3 ක් යටතේ ලඝුකර දැක්විය හැක.

1. පුස්තකාල ද්‍රව්‍ය ගබඩා කිරීමේ පහසුකම් උසස් මට්ටමෙන් පවත්වාගෙන යාම
2. පුස්තකාල ද්‍රව්‍යවල රසායනික සංරක්ෂණය හා පොත් බැඳුම්කරන කටයුතු
3. කෘමි ආරක්ෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

1. පුස්තකාල ද්‍රව්‍ය ගබඩා කිරීමේ පහසුකම් උසස් මට්ටමෙන් පවත්වාගෙන යාම

පුස්තකාල ද්‍රව්‍ය ගබඩා කිරීම සඳහා ලොව පිළිගත් ප්‍රමිති රාශියක් හඳුනාගත හැකිය. එක් එක් පුස්තකාල ද්‍රව්‍යයෙන් ද්‍රව්‍යයට මෙම ප්‍රමිති වෙනස් වේ. ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානය පුස්තකාල ද්‍රව්‍ය ගබඩා කිරීමේ දී ඉහත ප්‍රමිති හැකිතාක් දුරට අනුගමනය කිරීමට සැළසුම් යොදා ඇත. පුස්තකාල ද්‍රව්‍ය ගබඩාකර ඇති පරිශ්‍රයේ මධ්‍යගත වායුසමීකරණ පද්ධතියක් නිරන්තරයෙන් ක්‍රියාත්මක වන අතර අධික ජල වාෂ්පවලින් සිදුවන හානිය අවම කිරීමට ආර්ද්‍රතා පාලන යන්ත්‍ර ස්ථාපිතකර ඇත. අඩවන් වූ ආලෝකයක් පොත් එකතුව පරිශ්‍රයේ පවත්වාගෙන යනු ලබන අතර (50 lux) අවශ්‍ය අවස්ථාවලදී පමණක් දීප්තිමත් ආලෝකය දල්වනු ලැබේ. පුස්තකාල ද්‍රව්‍ය විශේෂයෙන් පොත්පත් හා සඟරා ඉහළ ප්‍රමිතිවලට අනුව සකස් කරන ලද ඇසුරුම් පෙට්ටිවල තැන්පත් කර ඇත (Archival Boxes). මෙම පෙට්ටි ඒවා ඇතුළත ඇති පුස්තකාල ද්‍රව්‍ය අහිතකර පරිසර තත්ත්වවලින් ආරක්ෂා කිරීමේ වගකීම ඉටු කරයි.

2. පුස්තකාල ද්‍රව්‍යවල රසායනික සංරක්ෂණය හා පොත් බැඳුම්කරන කටයුතු

ජාතික පුස්තකාල එකතුවට විද්වතුන් පරිහරණය කරන ලද පොත් එකතු ප්‍රතිග්‍රහණය කරනු ලැබේ. මෙලෙස ප්‍රතිග්‍රහණය කරන ලද බොහෝ පොත්පත් දිරාපත් වී ඇත. බොහෝවිට මෙම පොත්පත් දුර්ලභ පොත් පත් වන අතර ඒවා සංරක්ෂණය කිරීම මෙම අංශයට පැවරෙන ප්‍රධාන වගකීමකි. කාලයක් ගතවන විට පොත්පත් ආම්ලික වීම හා දිරාපත් වීම ස්වාභාවික සංසිද්ධියකි. පොත්පත් වියපත් වීමේ දී පැහැය වෙනස් වීම, බොහෝ දුරට කහ පැහැයට

හැරීම, තීන්ත අවපැහැ වීම, පිටු පහසුවෙන් කැඩී යාම හෙවත් හංගුර වීම, කඩදාසිවල ශක්තිමත්භාවය (Tensile Strengt) හීන වීම, දිලීර, බැක්ටීරියා, කෘමීන් මෙන් ම වෙනත් සතුන්ගේ වාසස්ථාන හා ආහාර බවට පත්වීම වැනි ගැටලුවලට පිළියම් යෙදීම සංරක්ෂණ රසායනාගාරයේ දී සිදු කෙරේ.

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානය ආම්ලික වූ පොත් පත් සංරක්ෂණය කිරීම සඳහා ජලීය නිරාම්ලීකරණ ක්‍රමවේදය යොදා ගනී. ඩබ්. ජේ. බරෝ විසින් ඉදිරිපත් කරන ලද Two-Bath Deacidification ක්‍රමවේදය දැනට අනුගමනය කෙරේ. මෙම ක්‍රමයේ දී දුර්වල භෂ්ම අඩංගු ද්‍රාවණ 2 ක මිනිත්තු 20 බැගින් ආම්ලික වූ කඩදාසි ගිල්වා තබනු ලැබේ. 0.15% සාන්ද්‍රණයෙන් යුත් කැල්සියම් හයිඩ්‍රොක්සයිඩ් ද්‍රාවණයක පළමුව කඩදාසි මි. 20 ක් ගිල්වා තබන අතර, පසුව 0.15% යුත් $CaHCO_3$ ද්‍රාවණයක දෙවනුව මි. 20 ක් පමණ කඩදාසි ගිල්වා තබනු ලැබේ (Barrow, 1976).

මෙම ක්‍රමය ශ්‍රී ලංකාවේ තැන්පත් පුස්තකාලවල බහුලව භාවිත කරන ක්‍රමවේදයක් වන අතර ඉතාම ලාභදායී හා ගුණාත්මක ක්‍රමවේදයක් වීම එය ප්‍රචලිත වීමට ප්‍රධාන හේතුවකි. කඩදාසි මත හටගන්නා පැල්ලම් ඉවත් කිරීමේ කටයුතු ද සංරක්ෂණ රසායනාගාරයේ දී සිදු කෙරේ. හංගුර වූ කඩදාසි ශක්තිමත් කිරීම සඳහා ආනයනය කරන ලද අම්ල සහිත උසස් වර්ගයේ (Kazo Paper) කඩදාසි යොදා ගනී. රසායනික ලෙස සංරක්ෂණය කරන ලද පොත් අවසානයේ දී බැදුම් කටයුතු කර පාඨකයා අතට පත් කෙරේ.

3. කෘමි ආරක්ෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

ජෛවීය ලෙස පොත්පත් දිරාපත් වීමෙන් ආරක්ෂා කර ගැනීම ද මෙම අංශය මගින් කෙරෙන කාර්යභාරයකි. කෘමීන් හා ක්ෂුද්‍රජීවීන්ගෙන් පොත් ආරක්ෂා කර ගැනීමට ක්‍රමවේද ගණනාවක් ක්‍රියාත්මක කෙරේ. පුස්තකාලවල බහුලව හමුවන කෘමීන් අතර පොත් කාවා, පොත් ගුල්ලා, පොත් උකුණා, වේයා, කැරපොත්තා වැනි කෘමීන් හඳුනාගත හැකි අතර මීයන් හා ගෘහස්ථව ජීවත්වන කුරුල්ලන් (පරවියා, ගේ කුරුල්ලා) පොත්පත්වලට හානි සිදු කරයි. කෘමීන්ගේ වාසස්ථාන බවට පත් වූ පොත් පත් ආරක්ෂාකර ගැනීම ඉතාම අසීරු කාර්යයකි. මීට ප්‍රධානතම හේතුව වන්නේ කෘමීන් මර්දනය කිරීමට විවිධ කෘමිනාශක තිබුණ ද ඒවා යෙදීමෙන් කඩදාසිවලට අහිතකර තත්ත්ව ඇති වීමයි. කඩදාසි හා කෘමීන් දෙකොට්ඨාසයටම ගැලපෙන කෘමිනාශකවල හිඟයක් පවතී. දැනට ශ්‍රී ලංකාවේ ධාන්‍ය මත වර්ධනය වන කෘමීන් පාලනය කිරීමට බහුලව යොදා ගන්නා පොස්ෆීන් වායුව ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානය කෘමීන් පාලනය කිරීමට යොදා ගනී. මෙම වායුව උග්‍ර විෂ සහිත හෙයින් පොස්ෆීන් මගින් ධූමායන කටයුතු කිරීමට මනා පුහුණුවක් හා සුදුසු උපකරණ අවශ්‍ය වේ. පොත්පත් මත වර්ධනය වන දිලීර මර්දනය සඳහා දැනට තයිමෝල් ධූමායන ක්‍රමවේදය යොදා ගනී. එම ක්‍රමවේදය මහජන පුස්තකාල සඳහා යෝග්‍ය වන අතර ඒ්ට කුඩා ධූමායන කුටීරයක් අවශ්‍ය වේ.

දැනට ශ්‍රී ලංකාවේ මහජන පුස්තකාලවල පවතින ප්‍රධාන සංරක්ෂණ ගැටලුවක් ලෙස පුස්තකාල

පොත් මත කෘමීන් වර්ධනය වීම හඳුනාගත හැක. මේ සඳහා මහජන පුස්තකාල සඳහා යොදා ගත හැකි සුදුසු කෘමි නාශකයක් ආනයනය කිරීමට ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානය මේ වන වීට කටයුතු කරමින් සිටී.

නව සංරක්ෂණ සංකල්ප ඔස්සේ කටයුතු මෙහෙයවන ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානය කෘමිනාශකවලින් තොරව පුස්තකාලය තුළ කෘමීන් හා දිලීර පාලනය කිරීමේ ක්‍රමවේදයක් හඳුන්වා දී ඇත. මෙම ක්‍රමවේද අනුගමනය කිරීමෙන් පුස්තකාලය තුළ වර්ධනය වන කෘමීන් හා දිලීර රසායනික ද්‍රව්‍ය යෙදීමෙන් තොරව පාලනය කළ හැක. රසායනික ද්‍රව්‍ය යෙදීමෙන් තොරව පුස්තකාලය තුළ කෘමීන් පාලනය කිරීම Integrated Pest Management (IPM) ලෙස හඳුන්වා දිය හැකි අතර ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානය අදියර 5 ක් යටතේ මෙම ක්‍රමය ක්‍රියාවට නංවයි.

1. ආකර්ශනය වැළැක්වීම - Avoid Attraction
2. ඇතුලුවීම අවහිර කිරීම - Block Entry
3. හඳුනා ගැනීම - Detect
4. ප්‍රතිචාර දැක්වීම - Respond
5. ආරක්ෂණය - Recover

1. ආකර්ශනය වැළැක්වීම - Avoid Attraction

මෙම අදියර යටතේ පුස්තකාලය තුළට කෘමීන් ආකර්ශනය වීම අවම කිරීමට කටයුතු කරනු ලැබේ. පුස්තකාලයට ඉතා සමීපව වෘක්ෂලතා වර්ධනය වී ඇත්නම් ඒවා ඉවත් කිරීම, මනා ජලවහන පද්ධතියක් හා කාණු පද්ධතියක් ස්ථාපිත කිරීමෙන් පුස්තකාලය වටා තෙතමනය රැඳීම අවම කිරීම, පුස්තකාලය අභ්‍යන්තරයෙහි ස්වාභාවික අලංකාර මල් බඳුන් තබා ඇත්නම් ඉවත් කිරීම, අපද්‍රව්‍ය පුස්තකාලයට පරිබාහිර ස්ථානයක රැස් කිරීම, අභ්‍යන්තරය පිරිසිඳු කර දූවිලි ඉවත් කර පවිත්‍රකාරක යෙදීම වැනි ක්‍රමවේද අනුගමනය කිරීම හා පුස්තකාලය තුළ විශේෂයෙන් ම උෂ්ණත්වය හා තෙතමනය ප්‍රශස්ත මට්ටමක පවත්වා ගෙන යාමට කටයුතු කිරීම.

2. ඇතුලුවීම අවහිර කිරීම - Block Entry

ඕ කවුළු හා ජනේල සියුම් දැල් හා තිර රෙදි යොදා ආවරණය කිරීම, පුස්තකාල ගොඩනැගිල්ලේ බාහිරට නිරාවරණය වූ සිදුරු ඇත්නම් වසා දැමීම, පුස්තකාලයට ප්‍රතිග්‍රහණය කරන සියලුම පැරණි පොත් පොස්ගීන් ධූමායනය කිරීමෙන් අනතුරුව පමණක් ජාතික එකතුවට එක් කිරීමට කටයුතු කිරීම.

3. හඳුනා ගැනීම - Detect

පුස්තකාලය තුළ කෘමීන් වර්ධනය වී ඇත්දැයි නිරන්තරයෙන් සිදුකරන පරීක්ෂාකිරීම්වලින් සොයා බලනු ලැබේ. මේ සඳහා භෞතිකව සිදු කරන සොයා බැලීම්වලට අමතරව කෘමි උගුල් යොදාගෙන සිදු කරන සමීක්ෂණයක් මගින් (Trap Survey) පුස්තකාලය තුළ කෘමීන් වර්ධනය වී ඇත්දැයි පරීක්ෂා කරනු ලැබේ. මේ සඳහා ආනයනය කරන ලද විශේෂිත කෘමි උගුල් යොදා

ගනී.

4. ප්‍රතිචාර දැක්වීම - Respond

කෘමීන් වර්ධනය වූ අවස්ථාවක දී එම පොත් සඳහා පොස්ෆීන් ධූමායනය සිදු කරනු ලැබේ.

5. ආරක්ෂණය - Recover

කෘමීන්ගෙන් පොත්පත්වලට සිදු වී ඇති හානිය සඳහා ප්‍රතිකර්ම සිදු කෙරේ. සංරක්ෂණ රසායනාගාරයේ දී මේ සඳහා ප්‍රතිකර්ම සිදු කෙරේ.

ඉහත ක්‍රියාවලිය අනුගමනය කිරීමෙන් දැනට ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානයේ පොත් එකතුව තුළ කෘමි වර්ධනය පාලනය කිරීමට සමත්ව ඇති අතර එම ක්‍රමවේදය ම මහජන පුස්තකාල සඳහා ද අනුගමනය කිරීමෙන් සාර්ථක ප්‍රතිඵල අත්කර ගත හැකිය.

**ආශ්‍රිත ග්‍රන්ථ**

Agrawal O.P., 1993, Preservation of Art Object & Library Materials, National Book Trust, NewDelhi.

Barrow W. J., 1976, The Barrow two-bath Deacidification Method, The Ameri can Archivist Vol. 39, No. 2, Society of American Archivist.

විමලරත්න කේ. ඩී. ජී., 1989, පුස්තකාල ද්‍රව්‍ය සංරක්ෂණය සහ ප්‍රතිසංස්කරණය, කොළඹ.- ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය.

# ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය මගින් සිදු කරන පර්යේෂණ හා සමීක්ෂණ සේවා

**විජය ප්‍රේමදර්ශන**

**අංශ ප්‍රධාන**

**පුස්තකාල පර්යේෂණ අංශය**

කිසියම් සංවිධානයක් හෝ ආයතනයක් විසින් කරන ලද කාර්යයන්හි ඵලදායී සංවර්ධනයක් උදෙසා ප්‍රතිපෝෂණ වැඩසටහන් පැවැත්වීම, සමීක්ෂණ සිදු කිරීම හා පර්යේෂණ පැවැත්වීම අදාළ සංවිධාන හා ආයතනවල පැවැත්මට මෙන් ම සංවර්ධනයට බෙහෙවින් බලපාන බව කිව යුතු වේ.

ශ්‍රී ලංකාවේ ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය ද ස්වකීය අරමුණු මෙන් ම පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම පිණිස ආරම්භයේ සිට ම පුස්තකාල ක්ෂේත්‍රයේ විවිධ පර්යේෂණ සිදු කිරීම, ඒ සඳහා සහාය දැක්වීම, සමීක්ෂණ පැවැත්වීම, උපදෙස් ලබා දීම හා අදාළ පර්යේෂණ/ සමීක්ෂණ වාර්තා ඉදිරිපත් කිරීම සිදු කෙරේ. ආරම්භයේ දී මෙම කාර්යය උදෙසා සංවර්ධන හා පර්යේෂණ ඒකකය නමින් අංශයක් පිහිටුවා තිබුණ ද එම කටයුතු විධිමත් කිරීමේ අරමුණෙන් ද වර්තමානයේ දී ඒ සඳහා ම විශේෂිත පුස්තකාල පර්යේෂණ අංශය නමින් අංශයක් පිහිටුවා තිබේ.

**පුස්තකාල සංඛ්‍යාලේඛන රැස්කිරීම සඳහා සමීක්ෂණ පැවැත්වීම**

යුනෙස්කෝ සංවිධානයේ ඉල්ලීමකට අනුව ලොව පුරා ඇති පුස්තකාල පිළිබඳ සමීක්ෂණයක් 1971 වර්ෂයේ දී සිදු කර තිබේ. මෙහි දී ජාතික, විශේෂ, විශ්වවිද්‍යාල, මහජන හා පාසල් පුස්තකාල සම්බන්ධයෙන් ත්‍රෛමාසික සංගණනයක් සිදුකළ අතර මෙම කර්තව්‍ය සඳහා ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය ද දායක වී ඇත. මෙය වසර 02 කට වරක් සිදුකර ඇති අතර එහි දී පොත් එකතුව, වසරක් තුළ අත්කරගත් ප්‍රමාණය, සඟරා සංඛ්‍යාව, භාවිත කළ ප්‍රමාණය, පොත් හුවමාරුව, ජාත්‍යන්තර පොත් හුවමාරුව, ඡායාපිටපත් සේවය, සම්පූර්ණ ජනගහණය හා පොත් ලබාගත් ප්‍රමාණය ආදී විස්තර රැස්කර ඇති අතර ඒවා ප්‍රකාශයට පත් කිරීම සඳහා යුනෙස්කෝ සංවිධානය වෙත යවා තිබේ. (පරිපාලන වාර්තාව, 1972, පි. 07)

**සංඛ්‍යාලේඛන විස්තර අඩංගු තොරතුරු සංග්‍රහ පළ කිරීම**

පුස්තකාල ක්ෂේත්‍රයේ වරින්වර සිදුකර ඇති සමීක්ෂණවල ප්‍රතිඵල වශයෙන් තොරතුරු සංග්‍රහ කිහිපයක් පළකර තිබේ.

1. Directory of Libraries in Sri Lanka 1994/ 2010
2. Statistical Handbook on Libraries in Sri Lanka - 2010 (මුද්‍රණයේ පවතී)
3. පර්යේෂණ වාර්තා සහ පශ්චාත් උපාධි නිබන්ධන පිළිබඳ තොරතුරු සංග්‍රහ පළ කිරීම

**දිස්ත්‍රික් මට්ටමින් පුස්තකාල සමීක්ෂණ පැවැත්වීම**

ශ්‍රී ලංකාවේ ඇති සියලු පුස්තකාල ආවරණය වන පරිදි දිස්ත්‍රික් පුස්තකාල සමීක්ෂණ ව්‍යාපෘතිය ද තවත් සුවිශේෂී කාර්යයක් වශයෙන් හැඳින්විය හැකි ය. මෙය 80 දශකයේ මැද භාගයේ දී ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයෙන් ආරම්භ කළ වැදගත් ව්‍යාපෘතියක් ලෙස පෙනේ. මෙහි දී ඒ ඒ දිස්ත්‍රික්කවල පැවති පුස්තකාල තොරතුරු සම්බන්ධයෙන් 1987 වර්ෂය වනවිට දිස්ත්‍රික්ක 09 ක විස්තර රැස්කර තිබේ. (පුස්තකාල ප්‍රවෘත්ති, 8 (3/4), 1987, පි. 24) ඒ අනුව තොරතුරු අඩංගු කොට පළමුවෙන් ම කුරුණෑගල, මොනරාගල හා රත්නපුර දිස්ත්‍රික්කවල වෙන වෙනම සමීක්ෂණ වාර්තා 1990 වර්ෂයේ දී පළකර ඇත. මෙම ව්‍යාපෘතිය නිරන්තරයෙන් සිදු නොවුව ද 2011 වර්ෂයේ සිට එය නැවත ආරම්භ කර ඇත්තේ බස්නාහිර පළාතේ කොළඹ, ගම්පහ හා කළුතර දිස්ත්‍රික්ක ආවරණය වන පරිද්දෙනි.

**පාසල් පුස්තකාල සමීක්ෂණයක් පැවැත්වීම**

අධ්‍යාපන අමාත්‍යාංශයේ උපදෙස් පරිදි දිවයින පුරා ඇති පාසැල් පුස්තකාල සම්බන්ධයෙන් හා ඒවායේ කටයුතු පිළිබඳ සමීක්ෂණයක් කිරීමට පළමුවෙන් ම මූලික වී ඇත්තේ 1979 වර්ෂයේ දී ය. මෙය දීප ව්‍යාප්තව සිදුකළ ව්‍යාපෘතියක් බව සඳහන් කළ හැකිය.

ප්‍රශ්නාවලියක් ඇසුරින් පාසැල් පුස්තකාලවල විස්තර රැස්කර ඇති අතර අනතුරුව සකස් කළ වාර්තාවේ තොරතුරු මෙසේ දක්වා තිබේ.

1. එවකට පැවති පාසැල් සංඛ්‍යාව - 12 000 කි.
2. පුස්තකාල තිබූ පාසැල් සංඛ්‍යාව - 742 කි.
3. මුළු පාසැල් සංඛ්‍යාවෙන් පුස්තකාල පහසුකම් නොමැති ප්‍රමාණය ප්‍රතිශතයක් ලෙස - 94% කි.
4. පුස්තකාල 742 න් සේවාව පැවැත්වීමට කාර්ය මණ්ඩලය සිටි පාසැල් පුස්තකාල ගණන - 61 කි.

මේ සම්බන්ධයෙන් පාසැල් පුස්තකාල පද්ධතිය නගා සිටුවීම සඳහා ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ යෝජනා හා නිර්දේශ ඇතුළත් අදාළ වාර්තාව අධ්‍යාපන අමාත්‍යාංශය වෙත යොමු කර තිබේ.

**සමීක්ෂණ ඇසුරින් විශේෂ ග්‍රන්ථ නාමාවලී පළ කිරීම**

ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලිය සම්පාදනය කිරීමේ කටයුතු ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවෙන් ජාතික පුස්තකාලය හට පැවරී ඇත්තේ 1976 වසරේ සිටය. ඉන් අනතුරුව එම ව්‍යාපෘතියට පරිබාහිරව වරින්වර විවිධ විෂයයන් ඔස්සේ සමීක්ෂණ හා පර්යේෂණ සිදුකර ඇති අතර, ලංකාවේ ඇති විශ්වවිද්‍යාල හා පර්යේෂණ පුස්තකාලවලට තිබූ පශ්චාත් උපාධි නිබන්ධන ගැන නාමාවලියක් සැකසීමට ආරම්භ කර ඇත්තේ 1979 වසරේ සිටය. එහි දී

i. විද්‍යාත්මක හා කාර්මික පර්යේෂණායතන පුස්තකාලය
ii. ජාතික විද්‍යා සභාව

iii. මධ්‍යම බැංකු පුස්තකාලය
iv. ගන්නොරුව කෘෂිකර්ම දෙපාර්තමේන්තු පුස්තකාලය
v. කාර්මික සංවර්ධන මණ්ඩල පුස්තකාලය
vi. පතල් පර්යේෂණ ආයතන පුස්තකාලය
vii. රබර් පර්යේෂණ ආයතන පුස්තකාලය
viii. භූ විද්‍යා දෙපාර්තමේන්තුව
ix. කෘෂි පර්යේෂණ ආයතනය

ආදී පුස්තකාලවලට තිබූ නිබන්ධන 506 ක තොරතුරු රැස්කර ඇත.

**පරීක්ෂණ හා සමීක්ෂණ වාර්තා ඉදිරිපත් කිරීම**

මෙහි දී දිවයින පුරා පිහිටි පුස්තකාලවල කටයුතු වැඩිදියුණු කිරීම හා ඒවාට වරින්වර සිදු වූ විවිධ උපද්‍රව සම්බන්ධයෙන් පරීක්ෂා කොට සමීක්ෂණය කිරීම ජාතික පුස්තකාලයේ තවත් කාර්යභාරයක් වේ. ඒ යටතේ,

1. ගින්නෙන් විනාශ වූ යාපනය මහජන පුස්තකාලය සම්බන්ධයෙන් වාර්තාවක් සකස් කොට රජයට ඉදිරිපත් කිරීම. මෙය යළි ගොඩනැගීම පිණිස රජයේ සුදු නෙළුම් ව්‍යාපාරය යටතේ "පොතයි ගඩොලයි" ව්‍යාපෘතිය ගැන 1996.10.30 දින ජාතික පුස්තකාලයේ ප්‍රධානත්වයෙන් රැස් වී සාකච්ඡා පවත්වා ඇත. (පුස්තකාල ප්‍රවෘත්ති, 14(04), 1996, පි. 04)

2. විවිධ පුස්තකාලවල පැවති දුර්ලභ එකතු ඉල්ලීම් පරිදි පරීක්ෂා කොට අදාළ අධිකාරි ආයතන වෙත වාර්තා ඉදිරිපත් කිරීම. (ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ ශ්‍රව්‍ය දෘශ්‍ය පුස්තකාලය, ගෘහ නිර්මාණ ශිල්පීය ආයතනයේ පුස්තකාලය හා ICMA පුස්තකාලය)

3. 2003 වර්ෂයේ දී ගංවතුර හා නායයාම් හේතුවෙන් රත්නපුර දිස්ත්‍රික්කයේ පුස්තකාල පරීක්ෂා කොට නිර්දේශ ඉදිරිපත් කිරීම හා අධාර උපකාර කිරීම.

4. සුනාමියෙන් හානියට පත් උතුරු, නැගෙනහිර, දකුණ හා බස්නාහිර යන පළාත්වල පුස්තකාල පරීක්ෂා කොට වාර්තා ඉදිරිපත් කිරීම සහ ඒවා වැඩි දියුණු කිරීමට හා යළි ස්ථාපිත කිරීම වෙනුවෙන් අවශ්‍ය කටයුතු කිරීම.

5. 2007.02.02 දින ගින්නෙන් හානියට පත් මහනුවර මහජන පුස්තකාලය පරීක්ෂා කොට අවශ්‍ය නිර්දේශ සමඟ යළි ගොඩනැගීම සඳහා සහාය දැක්වීම. (පුස්තකාල ප්‍රවෘත්ති, 28(01), 2001, පි. 06)

**පර්යේෂණ පැවැත්වීම හා ඒ සඳහා සහය දැක්වීම**

ශ්‍රී ලංකාවේ පුස්තකාල ක්ෂේත්‍රයට අදාළ කටයුතු හා සේවාවන් සම්බන්ධයෙන් පර්යේෂණ පැවැත්වීම ද ඒවා සිදුකරන පිරිසට සහාය දැක්වීමත් ජාතික පුස්තකාලයේ ප්‍රධාන කර්තව්‍යයකි. මේ යටතේ,

1. ජාතික ග්‍රන්ථ නාමාවලිය ආශ්‍රයෙන් වසර 14 ක් තුළ ශ්‍රී ලංකාවේ පළ වූ පොත්පත් සම්බන්ධයෙන් 1981 වර්ෂයේ දී පර්යේෂණයක් සිදුකර ඇත. මෙය ජාතික ග්‍රන්ථ සංවර්ධන

මණ්ඩලයට අවශ්‍ය තොරතුරු ලබාදීම වෙනුවෙන් සිදුකර තිබේ.

2. අධ්‍යාපන අමාත්‍යාංශයේ උපදේශකත්වයෙන් ලෝක බැංකු ආධාර මත කියවීමේ රුචිකත්වය පිළිබඳ පාසැල් මට්ටමින් පර්යේෂණයක් 2009/ 2010 වර්ෂවල සිදුකර ඇත. මෙහි වාර්තාව තවම සකස් වෙමින් පවතී.

**පර්යේෂකයන් සඳහා මූලාධාර සැපයීම**

පුස්තකාල ක්ෂේත්‍රයේ පර්යේෂණ කාර්යයෙහි යෙදී සිටින විද්වතුන් වෙනුවෙන් මූලාධාර කිරීම ජාතික පුස්තකාලයේ තවත් එක් ප්‍රධාන කාර්තව්‍යකි. මේ යටතේ,

1. අධ්‍යාපන සංවර්ධන වර්ෂය නිමිතිකොට අධ්‍යාපන ප්‍රලේඛන ක්ෂේත්‍රයේ පර්යේෂණ කටයුතු සඳහා ආධාර කිරීමේ ව්‍යාපෘතියක් සමාජ විද්‍යා ප්‍රලේඛන සේවා අංශයෙන් 1997 වර්ෂයේ දී ආරම්භ කර ඇත. (පුස්තකාල ප්‍රවෘත්ති, 18(01), 1997, පි. 04)

2. පර්යේෂකයන්ට අනුග්‍රහයක් දක්වීමේ අරමුණෙන් පශ්චාත් උපාධි (ශාස්ත්‍රපති, ශාස්ත්‍ර ශූරී) පාඨමාලාවලට අදාළ උපාධි නිබන්ධනවල පිටපත් මිල දී ගැනීම සිදු කෙරේ.

**පර්යේෂණ වැඩමුළු සංවිධානය කිරීම**

ශ්‍රී ලංකාවේ පුස්තකාල ක්ෂේත්‍රයේ පමණක් නොව වෙනත් ක්ෂේත්‍රවල පර්යේෂණ සිදුකරන පර්යේෂකයන් දැනුවත් කිරීමේ වැඩමුළු සංවිධානය කිරීම ද ජාතික පුස්තකාලයේ තවත් ප්‍රධාන කර්තව්‍යයක් ලෙස හඳුන්වා දිය හැකිය. මේ යටතේ,

1. කළමනාකරණ හා වාණිජ විද්‍යා පර්යේෂණ විධි සම්බන්ධයෙන් අදාළ විද්‍යාර්ථීන් උදෙසා සම්මන්ත්‍රණයක් 2001.09.07 දින ජාතික පුස්තකාලයේ දී පැවැත්වීය. (පුස්තකාල ප්‍රවෘත්ති, 22(03), 2011, පි. 13)

2. විශ්වවිද්‍යාල විද්‍යාර්ථීන් උදෙසා ජාතික පුස්තකාලයේ තොරතුරු සම්පත් ගැන දැනුවත් කිරීමේ වැඩසටහන් වරින්වර සිදු කිරීම. පළමුවෙන් ම 2006.05.05 දින ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ දී දිනක වැඩමුළුවක් පැවැත්වීම. (පුස්තකාල ප්‍රවෘත්ති, 27(1/2), 2006, පි. 07) 2006.10.03 දින සබරගමුව විශ්වවිද්‍යාලයේ දී සිදු කිරීම. (පුස්තකාල ප්‍රවෘත්ති, 27(3/4), 2006, පි. 06) ඉන් අනතුරුව රුහුණු විශ්වවිද්‍යාලය වැනි ආයතනවල සිදුකර ඇති අතර දැනටත් සිදුවන නිරන්තර ව්‍යාපෘතියක් ලෙස හඳුන්වා දිය හැකිය.

3. පුස්තකාල ක්ෂේත්‍රයේ සේවයේ නියැලි අය වෙනුවෙන් පුස්තකාල පර්යේෂණ ක්‍රමවිද්‍යාව පිළිබඳ වැඩමුළු පැවැත්වීම යටතේ 2011 වසරේ 2011.06.10, 2011.11.03 හා 2012 වර්ෂයේ ත් 2012.02.24 දින එක් දින වැඩසටහනක් පවත්වා ඇත. මෙය ද නොකඩවා ඉදිරියට සිදුවන ව්‍යාපෘතියක් ලෙස පෙන්වා දිය හැකිය.

යනාදී වශයෙන් ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයෙන් සිදු කෙරෙන පර්යේෂණ කටයුතු පිළිබඳ පැහැදිලි කළ හැකිය. කෙසේ වෙතත් මෙම ක්ෂේත්‍රයේ මේ කාර්යය කිරීමට ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයට අමතරව වෙනත් ආයතනයක් නැති බව කිව යුතු වේ.

**ආශ්‍රිත මූලාශ්‍ර**

වාර්ෂික වාර්තා :-

පරිපාලන වාර්තාව, (1972), ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය, කොළඹ.

පරිපාලන වාර්තාව, (1979), ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය, කොළඹ.

පරිපාලන වාර්තාව, (1981), ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය, කොළඹ.

පරිපාලන වාර්තාව, (1990), ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය, කොළඹ.

පරිපාලන වාර්තාව, (1994), ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය, කොළඹ.

පරිපාලන වාර්තාව, (2005), ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය, කොළඹ.

පරිපාලන වාර්තාව, (2006), ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය, කොළඹ.

පරිපාලන වාර්තාව, (2009), ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය, කොළඹ.

පරිපාලන වාර්තාව, (2010), ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය, කොළඹ.

පරිපාලන වාර්තාව, (2011), ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය, කොළඹ.

වාර සඟරා :-

පුස්තකාල ප්‍රවෘත්ති, (1987), ලුහුඬු පුවත්,ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය, 8(3/4), පි. 24

පුස්තකාල ප්‍රවෘත්ති, (1996), ලුහුඬු පුවත්, ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය, 14(04), පි. 04

පුස්තකාල ප්‍රවෘත්ති, (1997), ලුහුඬු පුවත්, ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය, 18(01), පි. 04

පුස්තකාල ප්‍රවෘත්ති, (2001), ලුහුඬු පුවත්, ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය, 22(03), පි. 13

පුස්තකාල ප්‍රවෘත්ති, (2006), ලුහුඬු පුවත්, ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය, 27(1/2), පි. 06

පුස්තකාල ප්‍රවෘත්ති, (2007), ලුහුඬු පුවත්, ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය, 28(01), පි. 06

## ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ
## සංරක්ෂණ හා ප්‍රතිෂ්ඨාපන සේවා

### පුහුණු පාඨමාලා

- සංරක්ෂණ හා ප්‍රතිෂ්ඨාපන කටයුතු පිළිබඳ ප්‍රායෝගික හා න්‍යායාත්මක පුහුණු වැඩමුළුව

  අදියර : 1

  කාලය : දින තුනයි (පැය 24 යි)

  පාඨමාලා ගාස්තු : රු. 3000.00

  අදියර : 2

  කාලය : දින දෙකයි (පැය 16 යි)

  වැඩමුළු ගාස්තු : රු. 2000.00

- කාර්යාල නිලධාරීන් හා ලේඛනාගාර භාර නිලධාරීන් සඳහා ලේඛන සංරක්ෂණ හා පොත් බැඳුම්කරණය පිළිබඳ පුහුණු වැඩමුළුව

  කාලය : දින දෙකයි (පැය 16 යි)

  වැඩමුළු ගාස්තු : රු. 3000.00

- පුස්කොළ පොත් සංරක්ෂණ වැඩමුළුව

  කාලය : දින දෙකයි (පැය 16 යි)

  වැඩමුළු ගාස්තු : රු. 2500.00

### පුස්තකාල පොත් ධූමායන කටයුතු

ඔබගේ පුස්තකාලයේ හෝ පෞද්ගලික පොත් එකතුවේ කෘමි, දිලීර මර්දනය සඳහා ධූමායන ප්‍රතිකර්මය සිදු කරනු ලැබේ. (රසායන ද්‍රව්‍ය සඳහා පමණක් මුදල් අය කරනු ලැබේ)

### පොත් බැඳුම් ද්‍රව්‍ය හා උපකරණ අලෙවි කිරීම

රෙක්සින්, චීප් බෝඩ්, සුදු රෙදි, කාකි රෙදි, නූල් පන්දු, කෙම්ෆික්ස්, මාබල් කොළ, කාට්රිජ් කොළ, එතුම් කොළ සහ ලෙදරට් කොළ අඩංගු පොත් බැඳුම් ද්‍රව්‍ය කට්ටලයක් රු. 4500.00 ක මිලකට සහ පොත් බැඳීම සඳහා භාවිත කරනු ලබන රු. 1500.00 ක් වටිනාකමින් යුත් බැඳුම් උපකරණ කට්ටලයක් මණ්ඩලයීය පොත් අලෙවි හලෙන් මිල දී ගත හැක.

**මේ පිළිබඳ වැඩිදුර තොරතුරු**

**සංරක්ෂණ හා ප්‍රතිෂ්ඨාපන අංශයේ අංශ ප්‍රධාන වෙතින් ලබා ගත හැකිය.**

**(දුරකථන අංක : 011 2688855 දිගුව 259)**

# ජාතික මට්ටමේ පුස්තකාල සංවර්ධනයේ දී ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ කාර්යභාරය


**මෛත්‍රී ජයසුන්දර**

**අංශ ප්‍රධාන**

**ව්‍යාප්ති සේවා අංශය**


ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ ප්‍රධාන වගකීම ජාතියේ දැනුම මතු පරපුර සඳහා සංරක්ෂණය කිරීම සහ ශ්‍රී ලාංකික ජනතාවගේ තොරතුරු අවශ්‍යතා ඉටු කිරීම වෙනුවෙන් ජාතික පුස්තකාලය පවත්වා ගෙන යාමයි. ඊට අමතරව දේශීය පුස්තකාල ක්ෂේත්‍රයේ නායකත්ව භූමිකාවට අදාළ කටයුතු රාශියක් ද මෙම ආයතනය විසින් ක්‍රියාත්මක කර ගෙන යමින් සිටී. මෙවැනි කටයුතු ඉටු කිරීමේ වගකීම පැවරී ඇති අංශ අතර ව්‍යාප්ති සේවා අංශයට ප්‍රමුඛස්ථානයක් හිමි වේ. ඒ බව මතු සඳහන් ව්‍යාපෘති සහ වැඩසටහන් සලකා බැලීමෙන් ද අවබෝධ කර ගත හැකිය.

1998 අංක 51 දරන ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩල පනත අනුව දේශීය පුස්තකාල ක්ෂේත්‍රය නගා සිටුවීම සඳහා ආයතනය විසින් අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග ගණනාවක් පෙන්වා දී ඇත.

1. සියලුම ප්‍රජා අංශ අතර පුස්තකාල හා ප්‍රලේඛන සේවා සඳහා වූ අවශ්‍යතාව ඇගයීම සහ පුස්තකාල හා ප්‍රලේඛන සේවා ප්‍රවර්ධනය කිරීම.
2. ශ්‍රී ලංකාවේ පුස්තකාල හා ප්‍රලේඛන වෘත්තියේ දියුණුව ප්‍රවර්ධනය කිරීම.
3. පුස්තකාල හා ප්‍රලේඛන සේවාවන් හි සියලු අංශවලට අදාළ පර්යේෂණ, සමීක්ෂණ හා විමර්ශන ආරම්භ කිරීම, ප්‍රවර්ධනය කිරීම, පවත්වාගෙන යාම හා සම්බන්ධීකරණය කිරීම.
4. පුස්තකාල හා ප්‍රලේඛන සේවාවන් හි සියලු අංශවල ජාතික ප්‍රමිති සකස් කර ප්‍රකාශයට පත් කිරීම.
5. කියවීමේ පුරුද්ද වැඩි දියුණු කිරීම.

මෙම අරමුණු ඉටු කර ගැනීම වෙනුවෙන් ව්‍යාප්ති සේවා අංශය සිය දායකත්වය ලබා දෙමින් සිටී.

**පුස්තකාල ශ්‍රේණිගත කිරීම**

ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන පුස්තකාල පද්ධතිය මහජන, පාසල්, දෙපාර්තමේන්තු සහ වෙනත් වශයෙන් වර්ගීකරණයට ලක් කොට ඒ ඒ පුස්තකාල වර්ග තෝරාගත් නිර්ණායක අනුව ශ්‍රේණිගත කිරීම ව්‍යාප්ති සේවා අංශය මගින් ඉටු කරයි. පුස්තකාල සේවාවන් විධිමත් කර ඒවායේ කාර්යසාධනය ඉහළ නංවාලීම පුස්තකාල ශ්‍රේණිගත කිරීමේ අරමුණයි. මේ සඳහා පුස්තකාල ක්ෂේත්‍රයේ ප්‍රවීණ වෘත්තීයවේදීන් ගේ උපදේශකත්වයෙන් ප්‍රමිති සකස්කරගෙන

ඇත. එම ප්‍රමිති අනුව ශ්‍රේණි ක්‍රමයක් නිර්මාණය කරගෙන තිබේ.

**මහජන පුස්තකාල ශ්‍රේණි**

1. අධි ශ්‍රේණිය
2. පළමු ශ්‍රේණිය
3. දෙවන ශ්‍රේණිය
4. තුන්වන ශ්‍රේණිය

**පාසැල් පුස්තකාල ශ්‍රේණි**

1. පළමු ශ්‍රේණිය
2. දෙවන ශ්‍රේණිය
3. තුන්වන ශ්‍රේණිය

**දෙපාර්තමේන්තු පුස්තකාල ශ්‍රේණි**

1. අධි ශ්‍රේණිය
2. පළමු ශ්‍රේණිය
3. දෙවන ශ්‍රේණිය
4. තුන්වන ශ්‍රේණිය

පුස්තකාල ගොඩනැගිලි, ඉඩකඩ, වාර්ෂික මුදල් ප්‍රතිපාදන, අංශ සහ සේවා, කාර්ය මණ්ඩල ප්‍රමාණය, පුස්තකාල එකතුව ආදී නිර්ණායක අනුව පිළිගත් පුස්තකාලවේදීන් යොදවා ඔවුන් ගේ වාර්තා අනුව ශ්‍රේණිගත කිරීමේ කමිටුව පුස්තකාල සුදුසු ශ්‍රේණි සඳහා යොමු කරයි.

**ශ්‍රේණිගත කරන ලද පුස්තකාල සංඛ්‍යාව (1990 - 2011)**

| පුස්තකාල වර්ගය | ගණන |
|---|---|
| මහජන පුස්තකාල | 781 |
| පාසල් පුස්තකාල | 312 |
| දෙපාර්තමේන්තු පුස්තකාල | 103 |
| එකතුව | 1196 |

**උපදේශක සේවා සැපයීම**

ව්‍යාප්ති සේවා අංශය මගින් ගුණාත්මක සහ ඵලදායී පුස්තකාල සේවාවක් පවත්වාගෙන යාමේ අරමුණින් සෑම වර්ගයකම පුස්තකාල සඳහා උපදේශක සේවා ක්‍රියාත්මක කරයි. ඒ අනුව පුස්තකාල ගොඩනැගිලි සැලසුම් සැපයීම, අභ්‍යන්තර අංශ සංවිධානය සඳහා උපදෙස් ලබාදීම, නැති වූ පුස්තකාල ද්‍රව්‍ය පිළිබඳ කටයුතු කිරීමේ උපදෙස් ලබාදීම, පුස්තකාල සේවා සැලසුම්කරණය වැනි පුස්තකාලයක් සාර්ථකව ක්‍රියාත්මක කිරීමට අදාළ සියලු උපදෙස් ලබා දීමට කටයුතු කෙරේ.

විශේෂ අවස්ථාවන් හි පුස්තකාල නිරීක්ෂණය සඳහා නිලධාරීන් යෙදවීමට සහ ඔවුන්ගෙන් වාර්තා ලබා ගැනීමට ද කටයුතු කෙරේ.

උදා:- සුනාමි විපතින් හානියට පත් පුස්තකාල පරීක්ෂා කිරීමට නිලධාරි මණ්ඩලයක් පත් කිරීම.

**පොත් සහ උපකරණ පරිත්‍යාග කිරීම**

ජනතාවගේ කියවීමේ පුරුද්ද වර්ධනය කිරීමටත්, සීමිත සම්පත් සහිත පුස්තකාල සවිබල ගැන්වීම සඳහාත් 1985 වර්ෂයේ සිට පොත් සහ ලී බඩු උපකරණ පරිත්‍යාග කිරීමේ ව්‍යාපෘතිය ආරම්භ කරන ලදී.

සාමාන්‍ය පරිත්‍යාගවලට අමතරව රජයේ විශේෂ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ප්‍රදේශවලට සහ හදිසි අවස්ථාවල විශේෂ පරිත්‍යාග කිරීම් සිදු කරනු ලැබේ.

උදා :- 1. දැයට කිරුළ ප්‍රදර්ශනය පැවැත්වෙන දිස්ත්‍රික්කය තුළ පුස්තකාල වෙනුවෙන් පොත් පරිත්‍යාග.

2. සුනාමි ආපදාවන් ගෙන් හානියට පත් පුස්තකාල සඳහා පොත් සහ ලී බඩු පරිත්‍යාග.

දේශීය මෙන් ම විදේශීය ආයතන ජාතික පුස්තකාලය වෙත ලබා දෙන පොත්පත් සහ උපකරණ ඉල්ලීම් මත පුස්තකාල සඳහා පරිත්‍යාග කිරීමට ව්‍යාප්ති සේවා අංශය සූදානම්ව සිටී.

**කියවීමේ රුචිය වර්ධනය කිරීමේ වැඩසටහන**

මෙම වැඩසටහන යටතේ ශ්‍රී ලාංකික ජනතාවගේ කියවීමේ රුචිකත්වය පිළිබඳ තොරතුරු ලබා ගැනීම සඳහා සමීක්ෂණ පැවැත්වීම සිදු කෙරේ. මෙහි එක් අදියරක් ලෙස පාසල් සිසුන්ගේ කියවීමේ රුචිය වර්ධනය කිරීමේ සමීක්ෂණයක් 2010 වසරේ ආරම්භ කළ අතර, දැන් එය අවසන් අවස්ථාවට ළඟා වෙමින් පවතී.

**විශේෂ දින සැමරීම**

පුස්තකාල ක්ෂේත්‍රයට අදාළ විශේෂ දින සැමරීමට ව්‍යාප්ති සේවා අංශය කටයුතු කරනු ලැබේ. ඒ අනුව ශ්‍රී ලංකාවට මෙන් ම ජාත්‍යන්තරව පිළිගත් දින වෙනුවෙන් සම්මන්ත්‍රණ, වැඩමුළු, දේශන සෑම වර්ෂයකම සංවිධානය කරයි.

**පුස්තකාල වෘත්තිකයන් ගේ අයිතීන් සුරැකීමට ඉදිරිපත් වීම.**

වෘත්තීය අයිතිවාසිකම් සහ පිළිගැනීම් පිළිබඳ නොවිසඳුනු ගැටලු ගණනාවක් ශ්‍රී ලංකාවේ පුස්තකාල වෘත්තිකයන් හමුවේ පවතී. මෙම ගැටලු පිළිබඳ බලධාරීන්ගේ අවධානය යොමු කර විසඳුම් සෙවීමේ වගකීම ව්‍යාප්ති සේවා අංශයට පැවරී ඇත. ඒ අනුව,

පුස්තකාල කාර්ය මණ්ඩලය බඳවා ගැනීමේ පරිපාටි සංශෝධනය

තරඟ විභාග පැවැත්වීම

වෘත්තීය සමිති ඉල්ලීම් පිළිබඳ සාකච්ඡා කිරීම

වැටුප් සංශෝධන යෝජනා ඉදිරිපත් කිරීම

වැනි කාර්යයන් සඳහා සම්බන්ධ වී සාර්ථක ප්‍රතිඵල අත්පත් කර ගෙන ඇත.

**පොත් ප්‍රදර්ශන පැවැත්වීම**

ශ්‍රී ලාංකික ලේඛකයින් ගේ කෘති මහජනතාව අතට පත් කිරීමටත්, ජනතාව අතට ගුණාත්මක ප්‍රමිතියෙන් යුත් පොත් සහ අනිකුත් මාධ්‍ය සාධාරණ මිලට සැපීමේ අරමුණෙන් පොත් ප්‍රදර්ශන පැවැත්වීම ව්‍යාප්ති සේවා අංශය විසින් පවත්වා ගෙන යනු ලැබේ. 2011 වර්ෂයේ පැවැත් වූ පොත් ප්‍රදර්ශන සංඛ්‍යාව පහත දැක්වේ.

දායට කිරුළ පොත් ප්‍රදර්ශනය - බුත්තල (දින 10)
සිංහල අවුරුදු පොත් ප්‍රදර්ශනය - මණ්ඩලයීය පරිශ්‍රයේ දී
පොසොන් පොත් ප්‍රදර්ශනය - මිහින්තලේ
කොළඹ ජාත්‍යන්තර පොත් ප්‍රදර්ශනය - BMICH (සැප්තැම්බර්)
මහනුවර පොත් දැක්ම
නැගෙනහිර පළාත් සාහිත්‍ය උත්සවයට සමගාමී පොත් ප්‍රදර්ශනය (දෙසැම්බර්)

ශ්‍රී ලංකාවේ ප්‍රධාන පෙලේ පොත් ප්‍රදර්ශනවලට අමතරව සංවිධානය කරන අනිකුත් ප්‍රදර්ශන සඳහා ද උපරිම සහාය දැක්වීමට සූදානම් වී සිටී.

**ජාතික කියවීමේ මාසයට අදාළ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම**

කියවීම තුළින් පිරිපුන් හා බහුශ්‍රැත සමාජයක් ගොඩනැගීමේ අරමුණින් 2004 වර්ෂයේ සිට රජය විසින් නම් කරන ලද ජාතික කියවීමේ මාසයට අදාළ වැඩකටයුතු සම්බන්ධීකරණය පැවරී ඇත්තේ ව්‍යාප්ති සේවා අංශයට ය. මෙම මාසය වෙනුවෙන් දිවයිනේ මහජන, පාසැල්, දෙපාර්තමේන්තු හා විශ්වවිද්‍යාල පුස්තකාල සම්බන්ධ කර ගනිමින් වැඩසටහන් රාශියක් ක්‍රියාත්මක කරනු ලබයි.

1. කියවීමේ අගය පෙන්වා දෙන ස්ටිකර්, පෝස්ටර් මුද්‍රණය හා ප්‍රදර්ශනය
2. කියවීමේ කඳවුරු සංවිධානය
3. පාසැල් ළමුන් අතර විවිධ තරඟ සංවිධානය
4. පුස්තකාලයාධිපතිවරුන්ට පුහුණු වැඩමුළු සංවිධානය
5. ජාතික පුස්තකාලය නැරඹීමට ශ්‍රී ලාංකිකයන්ට අවස්ථාව ලබා දීම
6. නොමිලයේ ජාතික පුස්තකාල සාමාජිකත්වය පිරිනැමීම
7. ප්‍රාදේශීය වශයෙන් කියවීමේ මාසයේ වැඩසටහන් පැවැත්වූ පුස්තකාල, සංස්කෘතික මධ්‍යස්ථාන ඇගයීම
8. ජයග්‍රහණ අත්පත් කර ගන්නා පුස්තකාල සඳහා තිළිණ, කුසලාන, සහතික පත් පිරිනැමීම
9. කියවීමේ මාසයට අදාළ ජාතික උත්සවය සංවිධානය කිරීම හා කියවීමේ මාසයට සම්බන්ධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් උපදේශක චක්‍රලේඛ නිකුත් කිරීම
10. පොතපත කියවීමට ජනතාව නැඹුරු කිරීමට අදාලව මාධ්‍ය ප්‍රචාරණය සඳහා මාධ්‍ය ආයතන වල සහාය ලබා ගැනීම

ජාතික කියවීමේ මාසයට සම්බන්ධ ප්‍රධාන උත්සවය සංවිධානය කිරීමේ වගකීම ද ව්‍යාප්ති සේවා අංශය මගින් ඉටු කරනු ලබයි.

### ජාතික පුස්තකාල පොත් හල

සාධාරණ මිල ගණන් යටතේ ජනතාව අතට පොත්පත් ලබා දීම සහ පුස්තකාල ලිපි ද්‍රව්‍ය සැපයීම අරමුණු කොට ගෙන ව්‍යාප්ති සේවා අංශය අධීක්ෂණය යටතේ ජාතික පුස්තකාල පොත් හල පවත්වාගෙන යනු ලැබේ. 2012 වර්ෂයේ දී මෙම පොත් හල පාඨක ආකර්ශනය සඳහා නවීකරණය කරන ලද අතර නූතන සන්නිවේදන සහ අතිකුත් පහසුකම් ද සහිත සන්නිවේදන පියසක් ලෙස දැන් විවෘතව ඇත. (Internet, Fax, Laminating) ලේඛකයින්ගේ කෘති අලෙවි අවස්ථා පුළුල් කිරීම 2012 වසරේ සිදු වූ වැදගත් සිදුවීමකි. දශක ගණනාවක සිට නියමිත ප්‍රමිතියට සකස් කරන ලද පුස්තකාල ලිපි ද්‍රව්‍ය සැපයීම නිසා ජාතික පුස්තකාල පොත් හල පුස්තකාල වෘත්තිකයන් අතර ජනප්‍රියත්වයට පත් වී ඇත.

### පළාත් පුස්තකාල සංවර්ධන ව්‍යාපෘතිය

ශ්‍රී ලංකාව තුළ පළාත් සභා පරිපාලන ව්‍යුහය ස්ථාපිත වීමත් සමඟ ඒ ඒ පළාත්වල පුස්තකාල හා තොරතුරු සේවා සංවර්ධනය කිරීම සඳහා මෙම ව්‍යාපෘතිය ආරම්භ කරන ලදී. මේ යටතේ එක් එක් පළාත් සභා සඳහා පුස්තකාල සේවා මණ්ඩල ආරම්භ කිරීමට හා පවත්වාගෙන යාමට ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය නායකත්වය හා අවශ්‍ය මඟ පෙන්වීම ලබා දේ. දැනට ඌව සහ මධ්‍යම පුස්තකාල සේවා මණ්ඩල පිහිටුවා ඇති අතර ඔවුන් තම පළාත තුළ විවිධ ව්‍යාපෘති සාර්ථකව ක්‍රියාත්මක කරමින් සිටී.

### හොඳම පුස්තකාලය තේරීමේ තරඟය

නවීන තාක්ෂණික යුගයට ගැලපෙන මහජන හා පාසල් පුස්තකාල සේවාවක් ඇති කිරීමේ අරමුණින් පුස්තකාල කාර්ය මණ්ඩලය දිරිමත් කිරීම සඳහා 2011 වර්ෂයේ ව්‍යාප්ති සේවා අංශය හොඳම පුස්තකාලය තේරීමේ තරඟය ආරම්භ කරනු ලැබීය. ප්‍රාදේශීය සභා, නගර සභා, මහ නගර සභා මට්ටමින් හොඳම මහජන පුස්තකාල තෝරා ගැනීමටත් පළාත්, පළාත් සහ ජාතික පාසැල් අතරින් හොඳම පුස්තකාල තෝරා ගැනීමටත් අපේක්ෂා කෙරේ. පළාත් මට්ටමින් තෝරා ගත් පුස්තකාල අධීක්ෂණ කටයුතු වෘත්තීය පුස්තකාලවේදීන්ගෙන් සමන්විත කමිටුවක් මගින් සිදු කරගෙන යනු ලැබේ. තෝරා ගන්නා පුස්තකාල සහ පුස්තකාලයාධිපතිවරු ඇගයීම ජාතික උත්සවයක දී සිදු කිරීමට සැලසුම් කර ඇත.

### ශ්‍රී ලංකාවේ පුස්තකාල පිළිබඳ දත්ත පදනම් පවත්වාගෙන යාම

ශ්‍රී ලංකාවේ පවත්නා මහජන පුස්තකාල, විශ්වවිද්‍යාල පුස්තකාල, වෘත්තීය අධ්‍යාපන ආයතන පුස්තකාල පිළිබඳ දත්ත පදනම් පවත්වාගෙන යන අතර, ඒ සඳහා දැනට පාසැල් පුස්තකාල පිළිබඳ තොරතුරු ද එක් රැස් කර ඇත. මෙම තොරතුරු සංවිධානය කර ශ්‍රී ලංකා පුස්තකාල

නාමාවලිය 2010 වර්ෂයේ දී යාවත්කාලීන කරන ලදී.

මෙම සියලු කාර්යයන් සහ වැඩසටහන් ඉටු කිරීම සඳහා පළපුරුදු කාර්ය මණ්ඩලයක් අංශය සතු වුවත් ප්‍රතිපාදන සීමා සහිතවීම, අත්‍යාවශ්‍ය තනතුරු කිහිපයක් පුරප්පාඩුව පැවතීම ගැටලු ලෙස සඳහන් කළ හැකිය. එසේ වුව ද පවතින සම්පත් උපරිම කාර්යක්ෂමතාවකින් යොදවා දේශීය පුස්තකාල ක්ෂේත්‍රය නගා සිටුවීමට කළ හැකි මෙහෙය වෙනුවෙන් ව්‍යාප්ති සේවා අංශය කැප වී සිටින බව සඳහන් කළ යුතුය.

**මහජන පුස්තකාල ශ්‍රේණිගත කිරීම - ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය**

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය මගින් මහජන පුස්තකාල ශ්‍රේණිගත කිරීම හා පුස්තකාල සංවර්ධනයට උපදෙස් ලබාදීම සිදු කෙරේ. තුන්වන ශ්‍රේණියේ පුස්තකාල හැර අනෙකුත් පුස්තකාල අදාළ ශ්‍රේණියට උසස් කිරීම සඳහා ඇගැයීම් වාර්තාවක් ලබා ගැනීම වෙනුවෙන් පහත සඳහන් පරිදි මුදල් ගෙවිය යුතු වේ.

| | | |
|---|---|---|
| අධි ශ්‍රේණිය සඳහා පුස්තකාලයක් සමීක්ෂණය කිරීම වෙනුවෙන් | - | රු.5000.00 |
| පළමු ශ්‍රේණිය සඳහා පුස්තකාලයක් සමීක්ෂණය කිරීම වෙනුවෙන් | - | රු.4000.00 |
| දෙවන ශ්‍රේණිය සඳහා පුස්තකාලයක් සමීක්ෂණය කිරීම වෙනුවෙන් | - | රු.2500.00 |
| තෙවන ශ්‍රේණිය සඳහා පුස්තකාලයක් සමීක්ෂණය කිරීම වෙනුවෙන් | - | රු.500.00 |

02. පළාත් පාලන කොමසාරිස්වරයාගේ නිර්දේශ සහිතව සේවා ගාස්තුව ද සමග කරනු ලබන ඉල්ලීම අනුව මහජන පුස්තකාල ශ්‍රේණිගත කිරීම සිදු කරනු ලැබේ. ශ්‍රේණිගත කරවා ගැනීමට බලාපොරොත්තුවන පුස්තකාල අපේක්ෂිත ශ්‍රේණියට නියමිත ප්‍රමිති සපුරා තිබිය යුතුය.

03. ශ්‍රේණිගත කිරීමෙන් අනතුරුව විධිමත් සහතිකපතක් ලබාදීමට කටයුතු කෙරේ. ඒ සඳහා වැයවන මුදල රු.500.00 කි. ඉහත ගාස්තුවට අමතරව එය ගෙවිය යුතුය.

04. ඔබ පුස්තකාලය ශ්‍රේණිගත කිරීමට අවශ්‍ය නම් එම ශ්‍රේණියට අදාළ ගාස්තුව ගෙවා ඉල්ලීමක් කළයුතු අතර, එම මුදල චෙක්පතක් මගින්. **"අධ්‍යක්ෂ ජනරාල්ල ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය"** යනුවෙන් සඳහන් කොට යොමු කළ යුතු වේ.

# ශ්‍රී ලංකාවේ පුස්තකාල අධ්‍යාපනය සඳහා ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ දායකත්වය

**මිහිර අරවින්ද**

**අංශ ප්‍රධාන**

**අධ්‍යාපන හා පුහුණු අංශය**

ජාතික පුස්තකාලය විවෘත කර විසි දෙවසරක් ගෙවීයන විට එහි සුවිශේෂී අංශ රාශියක් නව සංකල්ප යටතේ අලුත් වෙමින් පවතී. දැනුම බෙදන එක් ප්‍රධාන ආයතනයක් වශයෙන් ජාතික පුස්තකාලයේ කටයුතු වඩාත් පුළුල්ව හා විධිමත්ව ජනතාව අතරට ගෙන යමින් සිය මෙහෙවර යුග යුග ගෙවමින් ඉටුකරලීම මණ්ඩලය ලද මහත් භාග්‍යයකි. අතුපතර විහිද පැතිරෙන මහ නුග රුකක් සේ විවිධ අංශ හරහා සිය සේවාව ලබා දෙමින් දේශය සඳහා නව තොරතුරු යුගයක් බිහි කිරීමට කාර්යයන් රැසක් ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය මගින් ඉටු කෙරේ. ඒ අතර පුහුණු කිරීමේ, අධ්‍යාපනය ලබා දීමේ කාර්යය ද මණ්ඩලයේ එක් ප්‍රධාන කාර්යයකි.

1998 අංක 51 දරන ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩල පනත අනුව පැවරී ඇති ඉලක්ක සහ පරමාර්ථ අතර එක් ප්‍රධාන ඉලක්කයක් වන්නේ කාර්ය මණ්ඩල පුහුණු කිරීම මෙන්ම ක්ෂේත්‍රයේ මානව සම්පත් පුහුණු කිරීම, දැනුවත් කිරීම හා ඔවුනගේ කුසලතා හැකියා සහ ආකල්ප හා චර්යාවන් වැඩි දියුණු කිරීමට දායක වීමයි. අධ්‍යාපන හා පුහුණු අංශය මගින් ආරම්භයේ පටන්ම මෙම සේවාවන් හා ඉලක්ක සඳහා කටයුතු කර ඇත.

ඒ අනුව ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයීය අධ්‍යාපන හා පුහුණු අංශය මගින් දිවයිනේ පුස්තකාල වෘත්තිය අධ්‍යාපන කටයුතු සැලසුම් සහගත ලෙස ඉටුකිරීමට අවශ්‍ය පියවර ගනු ලබයි. ජාතික පුස්තකාලයේ කාර්ය මණ්ඩලයේ මෙන් ම රටපුරා විසිරී සිටින විවිධ පුස්තකාල වෘත්තිකයින් හට මෙලෙස දැනුම යාවත්කාලීන කරලීම මෙම ආයතනයෙන් සිදු කෙරේ. ඒ අනුව අධ්‍යාපන හා පුහුණු අංශය සතු කාර්යභාරය සැකෙවින් දැක්වුවහොත් පහත පරිදි වේ.

"විවිධ පුස්තකාල ක්ෂේත්‍රවල පුහුණු අවශ්‍යතා අඳුනා ගැනීම, පුස්තකාලයාධිපතීන් ඇතුළු පුස්තකාල කාර්ය මණ්ඩල සඳහා පුහුණු පාඨමාලා, වැඩමුළු, සම්මන්ත්‍රණ පැවැත්වීම, පුස්තකාල සේවා පවත්වාගෙන යනු ලබන ආයතන ප්‍රධානීන් දැනුවත් කිරීමේ සම්මන්ත්‍රණ, රට තුළ පුස්තකාල විද්‍යා අධ්‍යාපන කටයුතු අධීක්ෂණය හා සම්බන්ධීකරණය කිරීම."

මෙම කාර්යභාරය සලකා බැලීමේ දී ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ ඇති කාර්යයන් අතර වෘත්තිය අභිවෘද්ධිය හා දැනුවත් කිරීම උදෙසා අති සුවිශේෂී කාර්යභාරයන් රැ සක් අධ්‍යාපන හා පුහුණු අංශය මගින් ඉටු කෙරේ. ඒ අනුව මෙම කාර්යයන් ක්‍රියාත්මක වන

ආකාරය විස්තරාත්මකව පහත දැක්වේ.

අධ්‍යාපන හා පුහුණු කටයුතුවල දී ජාතික හා පළාත් මට්ටමේ ආයතන හා සංවිධාන සමඟ සම්බන්ධීකරණය හා සහයෝගීතා කටයුතු කිරීමද සිදු කරනු ලබයි. ඒ යටතේ,

1. පළාත් සභා අමාත්‍යාංශය සහ පළාත් සභා සමඟ කෙරෙන සංවිධාන කටයුතු
2. අධ්‍යාපන අමාත්‍යාංශය හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය
3. උසස් අධ්‍යාපන අමාත්‍යාංශය හා කැලණිය විශ්වවිද්‍යාලයේ පුස්තකාල විද්‍යා අංශය
4. ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය
5. ශ්‍රී ලංකා පුස්තකාල සංගමය

මේ නයින් බලන කල අධ්‍යාපන හා පුහුණු අංශය පුස්තකාල විද්‍යාව හා වෘත්තිය සමඟ ක්‍රියාත්මක කෙරෙන සියලු ජාතික ආයතන සමඟ මනා සබඳතාවක් පවත්වන බව පැහැදිලි වේ.

එසේ ම විවිධ අවශ්‍යතා අනුව පාඨමාලා හා වෘත්තීය කුසලතා නැංවීමේ වැඩසටහන් හා ව්‍යාපෘති සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම ද අප සතු කාර්යයක් වේ. ඒ යටතේ අප මණ්ඩලයේ සංරක්ෂණ අංශය හා එක්ව වෘත්තීය පුහුණු අමාත්‍යාංශය හා සහයෝගයෙන් NVQ මට්ටමේ සහතිකයක් තිකුත් කළ හැකි සංරක්ෂණ පුහුණු වැඩසටහන් 02 ක් අලුතෙන් හඳුන්වා දී ඇත. පුස්කොළ පොත් සංරක්ෂණය හා පොත් බැඳුම්කරණය හා සංරක්ෂණය පිළිබඳ පාඨමාලා ද්විත්වය ඒ අතර ප්‍රමුඛ වේ. මෙම පාඨමාලා 2 ම වෘත්තීය පුහුණු අධිකාරියේ අනුමත පුහුණු පාඨමාලාවන් වන අතර ඒ පිළිබඳ ශ්‍රී ලංකාවේ පිළිගත් වෘත්තීය සහතිකයක් පිරිනමනු ලබන එකම ආයතනය අප මණ්ඩලය වේ.

කැලණිය විශ්වවිද්‍යාලයේ පුස්තකාල විද්‍යාව හදාරන විශේෂවේදී සිසුන් රැසකට සිය ප්‍රායෝගික කටයුතු සිදු කිරීම සඳහා පහසුකම් ද මණ්ඩලය මගින් සිදුකෙරේ. එහි දී ත්‍රෛයිමාසික පුහුණු අවස්ථා කැලණිය විශ්වවිද්‍යාලයීය පුස්තකාල විද්‍යා විශේෂවේදී උපාධිදාරී සිසුන්ට ලැබෙන අතර මෙවන් පෘථුල ප්‍රායෝගික පුහුණුවක් ලබා දීමට හැකි ප්‍රධාන ආයතනයක් වශයෙන් අප මණ්ඩලය කැපී පෙනෙන කාර්යයක් ඉටු කරනු ලබයි. ඒ සඳහා අදාළ සම්බන්ධීකරණය හා සංවිධානය කිරීම සිදු වන්නේ අධ්‍යාපන හා පුහුණු අංශයේ පූර්ණ දායකත්වයෙනි.

පළාත් සභා අමාත්‍යාංශය හා පළාත් පාලන ආයතනය සමඟ එක්ව පුහුණු අවස්ථා රාශියක් දූයේ මහජන පුස්තකාල ක්ෂේත්‍රය සඳහා සලසා දී ඇත. ශ්‍රී ලංකාව පුරා සෑම පළාත් පාලන ආයතනයක් ම ආවරණය වන පරිදි විසිරී ඇති මහජන පුස්තකාල පද්ධතිය බලගැන්වීම සඳහා එම කාර්යමණ්ඩල නිලධාරීන් හා සේවකයින් මෙන් ම පරිපාලන නිලධාරීන් ද දැනුවත් කිරීම, පුහුණු කිරීම හා සවිබල ගැන්වීම මණ්ඩලයීය අධ්‍යාපන හා පුහුණු අංශය මගින් සිදු කරනු ලැබේ. විශේෂයෙන් 2004 සුනාමි ව්‍යසනයෙන් පසුව මහජන පුස්තකාල පද්ධතියේ විනාශ වූ පුස්තකාල ගොඩනැගීම සඳහා විදේශීය ආයතනවල අනුග්‍රහය යටතේ කටයුතු කළ අප මණ්ඩලය

නැවත එම පද්ධතිය නගා සිටු වීම සඳහා විශේෂ පුහුණු වැඩසටහන් රැසක් ක්‍රියාත්මක කරන ලදී. විශේෂයෙන් යුද්ධය පැවති සමයේ දී පවා උතුරු නැගෙනහිර පළාත්වල ද මෙම පුහුණු වැඩසටහන් පැවැත්වීම අභියෝගාත්මක ජය ගැනීමක් වශයෙන් සැලකිය හැක. විශේෂයෙන් යුද්ධය පැවති සමයේ පුස්තකාල ගොඩනැංවීම සඳහා ද්‍රව්‍යමය ආධාර සමඟ පුහුණු අවස්ථාවන් ද උදාකර දෙමින් යහපත් මහජන පුස්තකාල සේවාවක් පවත්වා ගැනීමට විශාල ශක්තියක් ලබා දීමට අපට හැකිවීම සුවිශේෂී වේ.

එසේ ම මහජන පුස්තකාල කාර්යමණ්ඩල සඳහා අධ්‍යාපනික දැනුවත් කිරීම් හා පුහුණු වැඩසටහන් පැවැත්වීමේ දී එම කාර්යමණ්ඩලයන්හි දැනුම, ආකල්ප හා කුසලතා වැඩිදියුණු කරමින් ප්‍රාදේශීයව එම පුස්තකාල ව්‍යාප්ති සේවාවන් අභිවර්ධනය කරලීමේ උපාය මාර්ග පිළිබඳව වැඩි අවධානයක් යොමු කිරීමට කටයුතු සැලසීම අපගේ ප්‍රධාන අරමුණු වේ. එසේම පුස්තකාල කාර්ය මණ්ඩලවල තොරතුරු තාක්ෂණ සන්නිවේදනය හා පරිගණක සාක්ෂරතාව දියුණු කිරීම සඳහා ද විශේෂ අවධානයක් යොමු ව පවතී. මහජන පුස්තකාල කාර්ය මණ්ඩල සඳහා වැඩසටහන් පැවැත්වීමට සමගාමීව පාඨක සමාජ සඳහා ද අධ්‍යාපනික වැඩසටහන් පැවැත්වීම සිදු කෙරේ. වීශේෂයෙන් පුහුණුවක් ලත් කාර්ය මණ්ඩල කෙතරම් සේවාවන් සැලසුව ද එම සේවා ලබා ගැනීමට ප්‍රශස්ත පාඨක පිරිසක් නොමැති නම් සාර්ථක සේවාවක් සිදුවන්නේ නැත. එනිසා අවබෝධයෙන් හා උනන්දුවෙන් යුත් පුස්තකාල පාඨක පිරිසක් සවිබල ගැන්වීම සඳහා පාඨක සමාජ දැනුවත් කිරීමේ වැඩසටහන් ද වසර පුරා අධ්‍යාපන අංශය මගින් දියත් කරනු ලබන්නේ එම දුර්වලතාවන් මගහැර විශිෂ්ට ද්විපාර්ශවීය සේවාවක් රටට උරුම කරදීම උදෙසාය. පාඨක සමාජ පිරිස් දැනුවත් කිරීම, ඔවුන් සඳහා පුහුණු අවස්ථාවන් තවදුරටත් සැලසීම ඉදිරියේ දී සිදුකිරීමට ඇති අතිශය වැදගත් කාර්යයන් ය. වීශේෂයෙන් මහජන පුස්තකාල යනු හුදු පොත් පත් හුවමාරු මධ්‍යස්ථානයක් පමණක් ලෙස සිතන පිරිසක් සමඟ තොරතුරු මධ්‍යස්ථානයක කාර්ය ඉටුකිරීමට නොහැකි ය. පොත්පත් හා පුවත්පත් කියවීමේ හා හුවමාරු කිරීමේ අවස්ථාවන් සලසා දීම මහජන පුස්තකාලයකින් සැලසෙන ප්‍රධාන කාර්යයන්ගෙන් එකක් පමණි. එහෙත් ඉන් ඔබ්බට ගිය සුවිශේෂී තොරතුරු හුවමාරුවක් හා දැනුම සංරක්ෂණයක් හා රටේ සංවර්ධනයේ ප්‍රතිලාභ ග්‍රාමීය මට්ටමේ ජනතාවට සමීප කිරීමේ හුවමාරු මධ්‍යස්ථානයක් වශයෙන් මහජන පුස්තකාල ඉවතින් සේවා ලබාගැනීමේ හැකියාව පිළිබඳ පාඨක පිරිස් මෙන් ම ජනතාව ද දැනුවත් කිරීම අප මණ්ඩලයට මෙන් ම පළාත් පාලන බලධාරීන්ට ද එකසේ ඇති අත් නොහැරිය හැකි වගකීමකි.

එබැවින් පාඨක සමාජ නැවත පිහිටුවීමේ කටයුතු ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ අධ්‍යාපන හා පුහුණු අංශය හා පුස්තකාල ව්‍යාප්ති සේවා අංශය හා එක්ව ක්‍රියාත්මක කිරීමට නියමිත ඉදිරි වැඩසටහන් වේ. මෙහි පවතින බරපතල ගැටලුව නම් පවතින දේශපාලන ක්‍රියාදාමයන් සඳහා පාඨක පිරිස් දක්වන ඇල්මැරුණු ස්වභාවය අනුව පාඨක සමාජ පිහිටුවීමේ කටයුතු සඳහා සජීවී දායකත්වයක් ලබා නො දීමයි. බොහෝ පිරිස් එය දකින්නේ දේශපාලනික

කටයුත්තක කොටසක් ලෙසිනි. එහෙත් පාඨක සමාජ පිහිටුවීම යනු ඕනෑම ප්‍රදේශයක දැනුම හුවමාරු කිරීම, භාවිත කිරීම හා ඉන් තම ප්‍රදේශයේ සමාජ සංවර්ධනය දියුණු කිරීම සඳහා දායක වීමට ලැබෙන දැනුමැත්තන්ගේ එකතුවක් ගොඩනැංවීමකි. මහජන පුස්තකාල සේම පාඨක සමාජයන් ද පුස්තකාල සේවාව දියුණු කිරීම සඳහා අතිමහත් දායකත්වයක් ලබාදීම සිදුකළ යුතු හෙයින් එම පුහුණු කිරීම් හා ආකල්ප වැඩිදියුණු කිරීම සඳහා අප අංශය විශේෂයෙන් අවධානය යොමු කොට ඉදිරියේ දී කටයුතු කිරීමට සැලසුම් සකස් කර ඇත.

මීට අමතරව මහජන පුස්තකාල පරිපාලනය කෙරෙන ආයතන ප්‍රධානීන් හා නිලධාරීන් සඳහා ද දැනුවත් කිරීමේ සම්මන්ත්‍රණ රැසක් ක්‍රියාත්මක කළ යුතුව ඇත. ඒ සඳහා ද පූර්ව සංවිධාන කටයුතු අධ්‍යාපන හා පුහුණු අංශය මගින් සිදු කරමින් පවතී. විශේෂයෙන් මහජන පුස්තකාල සේවාවේ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම, තොරතුරු සේවාවන් හා පරිගණක පහසුකම් වැඩිදියුණු කිරීමේ අවශ්‍යතා සඳහා අවධානය යොමු කිරීමට අදාළ ප්‍රාදේශීය දේශපාලන නායකයින් හා ප්‍රාදේශීය පළාත් පාලන ප්‍රධානීන් දැනුවත් කිරීමේ කටයුතු ද සිදු කිරීමට ඇති කාර්යයන් වේ.

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය ශ්‍රී ලංකා පුස්තකාල සංගමය හා එක්ව මෙම සේවාව වැඩිදියුණු කිරීම සඳහා අධ්‍යාපනික වැඩසටහන් රැසක් ක්‍රියාත්මක කර ඇති අතර ඉදිරියේ දී ද එම කටයුතු සිදු කිරීමට අපේක්ෂා කරයි. විශේෂයෙන් ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ අධ්‍යාපනය ලබන සිසු සිසුවියන් සඳහා සිංහල හා දෙමළ මාධ්‍ය ද්විත්වයෙන් ම ප්‍රායෝගික පුහුණු අවස්ථා අප මණ්ඩලයේ මෙම අංශය මගින් සම්බන්ධීකරණය කිරීම හා සංවිධානය කිරීම සිදු කරනු ලබයි. ඊට අමතරව ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ ප්‍රාදේශීය ශාඛාවන්වල අධ්‍යයන කටයුතු සිදු කරන සිසුන් සඳහා ජාතික පුස්තකාල අධ්‍යාපන චාරිකාවන් සංවිධානය කිරීමේ සම්බන්ධීකරණයන් හා අවශ්‍ය පහසුකම් අධ්‍යාපන හා පුහුණු අංශය මගින් සලසා දෙනු ලැබේ.

මීට අමතරව ශ්‍රී ලංකාවේ පාසල් පද්ධතියේ පාසල් සිසුන් සඳහා ද මෙම ජාතික පුස්තකාල අධ්‍යයන අවස්ථාව සලසා දීම පිණිස කටයුතු කිරීමේ හැකියාව හා ඒ සඳහා ඉඩ ප්‍රස්ථා සලසා දීම පාඨක සේවා අංශය හා අධ්‍යාපන හා පුහුණු අංශය එක්ව කටයුතු යොදනු ලැබේ. මීට අමතරව පාසල් පුස්තකාල කාර්ය මණ්ඩල හා පුස්තකාල ගුරු භවතුන් සඳහා පුහුණු වැඩසටහන් රාශියක් ක්‍රියාත්මක කර ඇති අතර එම සේවාවන් තවදුරටත් ඉදිරියේ දී ව්‍යාප්ත කිරීමේ අරමුණු හා සංවිධාන කටයුතු සැලසීමට අධ්‍යාපන හා පුහුණු අංශය උනන්දුවක් දක්වනු ලැබේ. විශේෂයෙන් ජාතික මට්ටමේ ආයතනයක් වශයෙන් පාසල් සඳහා කලාප වශයෙන් මෙන් ම කොට්ඨාස වශයෙන් ද තෝරාගෙන පුහුණු වැඩසටහන් පෙළක් සිංහල හා දෙමළ මාධ්‍යයෙන් ද පවත්වා ඇත.

එසේම පාසල් පුස්තකාල සේවාව වැඩිදියුණු කිරීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය හා එක්ව

වැඩසටහන් පැවැත්වීම හා සම්මන්ත්‍රණ පැවැත්වීම ද සිදු කරනු ලැබේ. එහිදී පුස්තකාලයක් ඉගෙනුම් ඉගැන්වීම් මධ්‍යස්ථානයක් වශයෙන් භාවිත කිරීම පිළිබඳ ප්‍රමුඛ අවධානය යොමු කරමින් මෙම සම්මන්ත්‍රණ හා පුහුණු අවස්ථා සූදානම් කෙරේ. විශේෂයෙන් පාසල් පද්ධතියේ පවතින දුෂ්කරතා අතර බොහෝ පාසල් සඳහා විධිමත් නිශ්චිත පුහුණු ගුරු පුස්තකාලයාධිපතිවරු නොමැති වීම සුවිශේෂී ගැටලුවකි. මන්ද යත් බොහෝ විට සිටින්නේ පුස්තකාල සහායකයින් හෝ පුස්තකාල භාර ගුරුභවතෙක් වීම හේතුවෙන් වගකීම් සහගත සේවාවන් සැලසීමට නිශ්චිත පුහුණුවක් ලබා ගැනීමට ඔවුන් ඉදිරිපත් නොවේ. සේවාව සලසන්නේ තාවකාලික වශයෙන් වන අතර ම එවැනි ගුරුවරුන් වසරකට හෝ දෙකකට පසුව සොයා බැලීමේ දී එම සේවාවෙන් ඉවත් ව වෙනත් විෂයයක් ඉගැන්වීමේ කටයුතුවල නියැලී සිටින බව පෙනේ. එහෙයින් එම පාසල් පුස්තකාල සේවාව දරු දැරියන් හට ලබා දීමේ දී සෑම පාසලකටම නිශ්චිත ගුරු භවතෙක් ස්ථිර පුස්තකාලයාධිපති තනතුරේ කටයුතු කිරීම අත්‍යවශ්‍ය වේ. එවිට විධිමත් පුහුණුවක් හා වගකීමක් සහිතව පුහුණු කටයුතු සැලසීමට ද පහසු වනු ඇත. එසේ ම සෙසු පුස්තකාල කාර්යමණ්ඩල සඳහා ද පුහුණුව ලබාදීම සිදුකළ යුතුව ඇත. එම කාර්යය මණ්ඩලය මගින් සෑම වසරකම සිදු කරනු ලබයි. මෙම ආධුනික පුස්තකාල සහායකයන් සඳහා පුස්තකාල කටයුතු පිළිබඳ සේවාස්ථ වැඩසටහනක් අධ්‍යාපන හා පුහුණු අංශය මගින් හඳුන්වා දී ඇත. එමගින් ආධුනික සේවකයින් හට කෙටි කාලීන ප්‍රායෝගික පුහුණුවක් අදාළ පුස්තකාල අංශයන්හි නියැලෙමින් ලබා ගැනීමට හැකියාව පවතී. මේ සඳහා පිළිගත් පුහුණු සහතිකයක් ද අවසානයේ ලබා දීමට අප කටයුතු යොදා ඇත. ඕනෑම ආධුනික පුස්තකාල සේවා නිලධාරියෙක් හට මෙම දින 05 ක සේවාස්ථ පුහුණු පාඨමාලාව සඳහා ඉල්ලුම් කළ හැකි අතර ප්‍රායෝගික පුහුණු අවස්ථාවලින් යුතු මෙම වැඩසටහන මගින් මූලික පුස්තකාල ක්‍රියාදාමය පිළිබඳ සැලකිය යුතු අවබෝධයක් ලබාදීම මෙහි අරමුණ වේ.

පුස්තකාල සංරක්ෂණය හා පොත් බැඳුම්කරණය පිළිබඳ ව අදියර I හා II වශයෙන් පුහුණු වැඩසටහන් 02 ක් සංරක්ෂණ අංශය හා එක්ව පවත්වනු ලැබේ. මෙමගින් පුස්තකාල ද්‍රව්‍ය සංරක්ෂණය පිළිබඳ මෙන් ම පොත් බැඳුම්කරණය පිළිබඳ ප්‍රායෝගික පුහුණුවක් ලබා ගැනීමට හැකි පරිදි සකසා ඇති විශේෂ වැඩසටහනකි. මෙමගින් න්‍යායික දැනුමත් ප්‍රායෝගික අවබෝධයත් සුඹබරව ලබාගත හැකි අතර සාර්ථකව පුහුණුව නිම කරන සිසුන් සඳහා පිළිගත් සහතික පත්‍රයක් ලබා දීමට ද කටයුතු සලසා ඇත. බොහෝ පුස්තකාලවල සංරක්ෂණ කටයුතු හා ප්‍රතිෂ්ඨාපන කටයුතු සඳහා පුහුණු සේවකයින් නොමැතිවීම හේතුවෙන් පුස්තකාල ද්‍රව්‍ය ඉක්මනින් හානියට පත් වේ. එම සම්පත් නාස්තිය අවම කරමින්, තම කටයුතු සාර්ථකව සිදු කිරීමට පුස්තකාල සේවක මණ්ඩලය මේ සඳහා යොමු කළ හැක. මෙම පුහුණුව සමඟ වෘත්තීය පුහුණු අමාත්‍යාංශය මගින් පිළිගත් වෘත්තීය පුහුණු සහතිකයක් ලබාදීම සඳහා ද මණ්ඩලය කටයුතු යොදා තිබේ.

ජාතික පුස්තකාල ක්ෂේත්‍රයේ මහජන, පාසල්, පිරිවෙන් හෝ වෙනත් ඕනෑම ආයතනයක

පුස්තකාල ක්ෂේත්‍රයේ නිලධාරියෙකුට තොරතුරු සේවාව කඩිනමින් පහසුවෙන් පාඨකයාට ලබාදීම සඳහා අවශ්‍ය දැනුම ලබාදීමට WINISIS මෘදුකාංගය මූල්කරගනිමින් තොරතුරු සන්නිවේදන තාක්ෂණික (ICT) 03 දින වැඩසටහනක් ද හඳුන්වා දී ඇත. මෙම වැඩසටහන මගින් මේ වන විට විශාල පුස්තකාල සේවක පිරිසක් සඳහා පුහුණුව ලබා දී ඇති අතර එමගින් ඇති වූ නව ප්‍රවණතා හා දැනුම තම පරිගණක පුහුණු අවස්ථා වැඩිදියුණු කොට හඳුන්වාදීම සඳහා මණ්ඩලය මගින් කටයුතු යොදා ඇත. මේ යටතේ අධ්‍යාපන අමාත්‍යාංශයේ ජාතික පාසල් ඒකකය හා එක්ව ''පොත්ගුල'' නමින් නව පරිගණක මෘදුකාංගයක් තෝරාගත් පාසල් 50 ක් සඳහා හඳුන්වා දී අවශ්‍ය පුහුණුව ද ලබාදෙන ලදී.

ගුරු විද්‍යාල, විද්‍යාපීඨ පුස්තකාල කාර්යමණ්ඩල හා සිසු සිසුවියන් සඳහා පුස්තකාල භාවිතය හා පවත්වා ගැනීම පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් ද වාර්ෂිකව සිදු කරනු ලැබේ. මෙමගින් ද පාසල් ක්ෂේත්‍රයේ පුස්තකාල පුහුණු ගුරු භවතුන් සුලබ කිරීම සඳහා කටයුතු සැලසීම සිදු කෙරේ. ගුරු ශිෂ්‍යයින් සඳහා පුස්තකාල භාවිත කිරීම, එහි වැදගත්කම, ඉන් අධ්‍යාපනික කටයුතු පහසු කිරීමට හැකි ආකාරය ආදිය පිළිබඳව දැනුවත් කිරීම අප විසින් සිදු කෙරේ. එසේ ම පිරිවෙන් පුස්තකාල කාර්ය මණ්ඩල මෙන් ම ශිෂ්‍ය ප්‍රජාව ද පුහුණු කරලීම, දැනුවත් කරලීම හා කුසලතා වර්ධනය සඳහා කටයුතු යෙදීම වාර්ෂිකව සිදු කරන කාර්යයක් වේ. ඉල්ලීම් ලැබෙන පරිදි මෙම පුහුණු වැඩසටහන් නොමිලයේ ලබාදීමට කටයුතු යොදනු ලබයි.

මේ හැරුණුවිට පුස්තකාල ක්ෂේත්‍රයේ වෙනත් ආයතනයන් හි පුස්තකාල සේවාවන් පවත්වාගෙන යාම සඳහා දැනුවත් කිරීමේ අධ්‍යාපනික වැඩසටහන් ද ක්‍රියාත්මක කෙරේ. උදාහරණ වශයෙන් පොලිස් පුස්තකාල සංගමයේ පුස්තකාල නිලධාරීන්, ගෘහ පුස්තකාල පවත්වාගෙන යන පුද්ගලයින් සඳහා, විවිධ ආයතනගත පුස්තකාල නිලධාරීන් සඳහා, සංස්ථා, දෙපාර්තමේන්තු, මණ්ඩලවල පුස්තකාල නිලධාරීන් හා සේවකයින් සඳහා මෙන් ම පෞද්ගලික අංශයේ පුස්තකාල පවත්වාගෙන යන කාර්යමණ්ඩල වෙත ද පුහුණු වැඩසටහන් ඉල්ලීම් පරිදි සලසා දීමේ පහසුකම් මණ්ඩලයේ අධ්‍යාපන හා පුහුණු අංශය මගින් සිදු කරනු ලැබේ. මේ සියල්ලෙහි බලාපොරොත්තුව වන්නේ රටේ ජාතික වශයෙන් පුස්තකාල ක්ෂේත්‍රයේ පුළුල් පිබිදීමක් මෙන් ම ප්‍රශස්ත සේවාවක් තුළින් විශිෂ්ට ගණයේ වෘත්තිකයින් පිරිසක් ඇති කරලීමට උනන්දුවක් ඇති කරලීමයි. විශේෂයෙන් ජාත්‍යන්තරව සලකා බැලීමේ දී පුස්තකාල සේවාවේ වෘත්තීය තත්ත්වය විශාල ප්‍රගතියක් මෙන් ම සමාජ අවධානයක් දිනාගත් වෘත්තීය ක්ෂේත්‍රයකි. එවැනි තත්වයක් ශ්‍රී ලාංකේය පුස්තකාල වෘත්තිය තුළ ඇතිකරලීම උදෙසා සමස්ත වෘත්තිකයින්ගේ ආවධානය ඇතිකරලීමට අවශ්‍ය පසුබිම නිර්මාණය කිරීම ද අපට ඇති පුළුල් අභියෝගයකි. එය වහා ජය ගතයුතු අභියෝගයකි. විශේෂයෙන් ඇල්මැරුණු තත්ත්වයක නිහඬ සේවාවන් සපයන පුස්තකාල වෘත්තිය ඕනෑම රටක මනස දැනුමින් පෝෂණය කිරීම කටයුතු සලසන අත්‍යාවශ්‍ය සේවාවකි. එහෙත් මෙම සේවාව ලාංකේය සමාජය තුළ සමාජගතවීමේ දී කිසියම් වූ අතපසු වීමක් හෝ නොසලකා හැරීමක් සිදු ව ඇත. එය වහා සොයා බලමින් පර්යේෂණාත්මක අධ්‍යයනයන් ඔස්සේ මෙම

වෘත්තිය සේවාව පුළුල්ව ඉස්මතු කරලීම උදෙසා ජාතික වශයෙන් නියමු කටයුතු සිදු කිරීමට ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය මගින් සිදුකළ යුතු කටයුත්තකි. ඒ බව අවබෝධ කරගනිමින් නව මං ඔස්සේ කටයුතු කිරීම මෙම සංවත්සරය සමරන අප වෙත පැවරෙන පොදු වගකීම වේ. ඒ සඳහා අධ්‍යාපන හා පුහුණු අංශය විශේෂ අවධානයකින් යුතුව කටයුතු කරන බව සඳහන් කළ හැකිය.

රටේ ජාතික සංවර්ධනය සමඟ අධ්‍යාපන සංවර්ධනය හා තොරතුරු ප්‍රචලිත කිරීමේ, ළඟා කිරීමේ හා ළඟාකරගැනීමේ කාර්යයන් තොරතුරු මධ්‍යස්ථාන ලෙස පුස්තකාල සඳහා පැවරී ඇති ප්‍රබල කාර්යභාරයකි. ඒ සඳහා ජාතික වශයෙන් අවධානයක් යොමුකරවීම ද වැදගත් වේ. ඒ සඳහා මණ්ඩලය මගින් දේශන මාලාවක් ද ප්‍රජාව සඳහා පැවැත් වූ අතර වත්මනෙහි එය වඩාත් සංවිධානාත්මකව ඉදිරිපත් කිරීමට සැලසුම් සකස් කර ඇත. බාහිර ආයතනවල දැනුවත් කිරීම් හා සමගාමීව අප මණ්ඩලයේ සමස්ත කාර්ය මණ්ඩලය සඳහා ද පුහුණු අවස්ථා ඇතිකරලීමේ කටයුතු අධ්‍යාපන හා පුහුණු අංශය මගින් ඉටුකර ඇත. එසේ ම ආධුනික ලේඛකයින් හා ළමා ලේඛකයින් සඳහා ලේඛනකරණය හා නිර්මාණකරණය පිළිබඳ ව දැනුවත්භාවයක් ඇතිකරලීම උදෙසා ප්‍රකාශන හා ග්‍රන්ථ සංවර්ධන අංශය සමඟ අධ්‍යාපන හා පුහුණු අංශය වැඩසටහන් දියත් කරනු ලබයි. මීට අමතරව ඕනෑම පුස්තකාල ක්ෂේත්‍රයක හෝ පාසලක, මහජන පුස්තකාලයක ආරාධනා පරිදි ඉල්ලුම් කරන විද්වත් සම්මන්ත්‍රණ දේශන සඳහා අවශ්‍ය ප්‍රවීණයින් සම්බන්ධිකරණය ද මණ්ඩලය වෙනුවෙන් අධ්‍යාපන හා පුහුණු අංශය සිදු කරනු ලබන තවත් සේවාවකි. මේ සඳහා මණ්ඩලයීය නිලධාරීන් මෙන් ම බාහිර ප්‍රවීණයන් ද සහභාගි කරවීමට පහසුකම් අපවෙත පවතී.

ඒ අනුව විසි දෙවන සංවත්සරය සමරන මේ මොහොතේ ජාතික වශයෙන් පුස්තකාල අධ්‍යාපන වැඩිදියුණු කරලීම උදෙසා සිදුකළ යුතු වැඩසටහන් රැසක් තවත් පවතින බව අප විසින් අවබෝධ කරගෙන තිබේ. විශේෂයෙන් නව දැනුම හා පුහුණුව පුස්තකාල නිලධාරීන් හට කඩනමින් ලබාදීම සඳහා කඩිනම් කෙටි කාලීන වැඩසටහන් දියත් කළ යුතුව ඇත. ඒ අතර වඩා වැදගත්කමක් දක්වන පරිගණක සාක්ෂරතාවයෙන් යුතු පුස්තකාල කාර්ය මණ්ඩලයක් පුහුණු කරලීම හදිසි තත්ත්වයක් ලෙස කළ යුතුව ඇත. ලෝකය පුරා තොරතුරු හුවමාරුව තත්පර ගණනක වේගයෙන් සිදුවන විටෙක පුස්තකාලයකින් විනාඩි ගණනක පමාවෙන් යුතුව සිදු වේ නම් ඒ සඳහා යොමු වෙන පාඨකයින් නව මං සොයා පිටව යාම නැවතිය නොහැකි දෙයක් වනු ඇත. අත ඇති ජංගම දුරකථනය ඉතා නුදුරේ දී ජංගම පුස්තකාල තොරතුරු මධ්‍යස්ථානයක් බවට පත්වනු නොඅනුමානය. එවන් විටක පුස්තකාල යනු භෞතිකව පවතින අභාවයට යමින් සිටින තවත් එක් වටිනා සේවයක් වනු ඇති. ඉන් මිදීම සඳහා ජාතික වශයෙන් පුහුණු වැඩසටහන් සැකසිය යුතුව ඇත. මූල්‍ය අර්බුදය හමුවේ මේ සියල්ල ජයගත හැකි ක්‍රියාමාර්ග ද සොයාගත යුතු වේ. ජාතික ආයතනයක් වශයෙන් ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයත් ප්‍රාදේශීය පළාත් පාලන ආයතන ප්‍රධානීන් සියලු දෙනාමත් දේශපාලනික

තීන්දු ගන්නා මැති ඇමතිවරුන් ද මේ සඳහා අවධානය ඉක්මනින් යොමු කරනු ඇතැයි අපගේ විශ්වාසයයි. පුස්තකාලයක් යනු පොදු මහජන විශ්වවිද්‍යාලයකි. ඒ සඳහා තාක්ෂණය යනු සිදුවන සමාජ ආර්ථික දේශපාලනික විපර්යාසයේ අවශ්‍යතාවයකි. මේවා ද සමඟ එක්ව නොයන අධ්‍යාපනය ද ප්‍රායෝගික නොවන හෙයින් ග්‍රාමීය ජනතාව නඟා සිටුවීම සඳහා යටිතල පහසුකම් සමඟ දැනුම් සංවර්ධනය නැමැති දිගුකාලීන ආයෝජනය ද සංවර්ධනය සඳහා අත්‍යාවශ්‍ය වේ. ඒ සඳහා රටේ පුස්තකාල පද්ධතිය ද ජාලගත ව නව තාක්ෂණික දැනුමැති නිලධාරීන් සමඟ ගොඩනැංවිය හැකි නම් රටේ සංවර්ධනය පූර්ණ තිරසාර සංවර්ධන සිහිනය සැබෑ වීමේ මාර්ගය එයවනු ඇති බව අපගේ විශ්වාසයයි.

## ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය

### පුස්තකාල ලිපි ද්‍රව්‍ය මිල ගණන්

| | | | |
|---|---|---|---|
| 1. | දින පත්‍රිකා (සිංහල, දෙමළ) | - 100 | - රු. 50.00 |
| 2. | දින පත්‍රිකා (ඉංග්‍රීසි) | - 100 | - රු. 60.00 |
| 3. | පොත් තුණ්ඩු (සිංහල/දෙමළ/ඉංග්‍රීසි) | - 100 | - රු. 70.00 |
| 4. | පොත් සාක්කු | - 100 | - රු. 125.00 |
| 5. | සාමාජික බලපත්‍ර | - 100 | - රු 140.00 |
| 6. | සාමාජික අයදුම්පත් | - 100 | - රු. 150.00 |
| 7. | සුචි පත්‍රිකා | - 100 | - රු. 50.00 |
| 8. | පරිග්‍රහණ ලේඛන (පිටු 600) | - 01 | - රු. 1500.00 |
| 9. | පරිග්‍රහණ ලේඛන (පිටු 300) | - 01 | - රු. 900.00 |
| 10. | නියමු ලේබල් | -(පැකට් 01) | - රු. 65.00 |
| 11. | සංවෘත පුස්තිකා පෙට්ටි | - 01 | - රු. 265.00 |
| 12. | විවෘත පුස්තිකා පෙට්ටි | - 01 | - රු. 200.00 |
| 13. | කාඩ් ට්‍රේ | - 01 | - රු.1,550.00 |

චෙක්පත් මගින් ගෙවන්නේ නම් අදාළ චෙක්පත, *"සභාපති, ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය"* නමට ලිවිය යුතු වේ.

මෙම ද්‍රව්‍ය ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ අලෙවිහලෙන් ලබාගත හැකිය.

**විමසීම්** : 0112698847, 0112685197

# ශ්‍රී ලංකාවේ ප්‍රකාශන හා ග්‍රන්ථ සංවර්ධන ක්ෂේත්‍රයේ ප්‍රගමනය උදෙසා ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ මෙහෙවර


**ශ්‍රීමා සූරියබණ්ඩාර**

**අංශ ප්‍රධාන**

**ප්‍රකාශන හා ග්‍රන්ථ සංවර්ධන අංශය**


මානව ශිෂ්ටාචාරය තුළ මිනිසා විසින් සිය අදහස් හා හැඟීම් අන් අය වෙත ප්‍රකාශ කිරීම සඳහා විවිධ ක්‍රම අනුගමනය කළ අතර කඩදාසි සොයා ගැනීමත් මුද්‍රණ යන්ත්‍රය සොයා ගැනීමත් සමගම විවිධ මාදිලියේ පොතපත ලෝකය පුරා ශීඝ්‍රයෙන් බිහිවන්නට විය. මෙමගින් මුද්‍රණ තාක්ෂණය මෙන් ම ප්‍රකාශන කටයුතු වලද පිබිදීමක් ඇති විය. මේ හරහා වාර්ෂිකව විශාල පරිමාණයෙන් පොතපත බිහි වූ අතර දැනුම සන්නිවේදනය කිරීමේ ප්‍රධාන වාහකය ලෙස පොතපත, සුවිශේෂී ස්ථානයක් හිමි කර ගෙන තිබේ.

1970 වසරේ ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය පිහිටුවීමත් සමග දේශීය ප්‍රකාශන ක්ෂේත්‍රය තුළ යම් පිබිදීමක් ඇති කිරීමට හේතු වීය. එමගින් ප්‍රකාශන කර්මාන්තයේ උන්නතිය සඳහා ලේඛකයන් හට ඔවුන්ගේ ලේඛන කාර්යයෙහි නියැලීමට අත දීම සඳහා ප්‍රධාන ව්‍යාපෘති ගණනාවක් ආරම්භ කර තිබේ.

**මුද්‍රණ අනුග්‍රහය ලබාදීම/ ප්‍රකාශන ආධාර පිරිනැමීම**

ප්‍රකාශන ක්ෂේත්‍රයේ උන්නතිය සඳහා ආරම්භ කළ ව්‍යාපෘතිවලින් ප්‍රකාශන ආධාර ව්‍යාපෘතියට හිමිවන්නේ ප්‍රමුඛ ස්ථානයකි. 1984 වර්ෂයේ ආරම්භ කළ මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණු වූයේ ගුණාත්මක බවින් යුතු දේශීය ග්‍රන්ථ සුලබ කිරීම, ග්‍රන්ථ කර්තෘවරුන් හා පරිවර්තකයන් දිරිමත් කිරීම, ප්‍රකාශනවල නිෂ්පාදන ප්‍රමිතිය හා ගුණාත්මකභාවය උසස් මට්ටමකට ගෙන ඒම, ප්‍රකාශනවල මිල සාධාරණ මට්ටමක පවත්වාගෙන යාම, කියවීම ප්‍රවර්ධනය කිරීම සහ ජාතික පුස්තකාල සේවාව වර්ධනය කිරීමයි.

මෙම ව්‍යාපෘතිය යටතේ ආධාර ලබාදීමේ ක්‍රමවේදය වන්නේ ශාස්ත්‍රීය හෝ සාහිත්‍ය වටිනාකමින් යුතු අත්පිටපත් ලබාගැනීම, ඒ ඒ විෂයයන් සම්බන්ධ ප්‍රවීණයන් වෙත යොමු කිරීම හා ඔවුන් ලබාදෙන නිර්දේශ අනුව අනුග්‍රහය ලබාදීම හෝ ප්‍රතික්ෂේප කිරීමයි. උසස් මට්ටමකින් යුතු අත්පිටපත්වල ගුණාත්මක බව තවදුරටත් වර්ධනය කිරීම සඳහා පොත්පත්වල භෞතික සැකැස්ම කෙරෙහි ලේඛකයන් උනන්දු කරවීමද මෙමගින් සිදු කෙරේ. එහි දී පොතක පිටකවරය, කඩදාසි වර්ගය, අකුරුවල ප්‍රමිතිය මෙන්ම පොතක මුල්පිටු හා පසු පිටු සකස් විය යුතු ආකාරය පිළිබඳව අවධානය යොමු කෙරේ. එමෙන් ම සෑම පොතකින් ම පිටපත් 1000 ක් මුද්‍රණය කරවීමට කර්තෘවරු පෙළඹවීමෙන් වැඩි පාඨක පිරිසක් වෙත ගුණාත්මක පොතපත පරිශීලනය කිරීමට අවස්ථාව සලස්වන අතරම පාඨක ප්‍රජාවගෙන් ද මේ සඳහා වැඩි ඉල්ලුමක් පවතී. දිනෙන් දින වැඩිවන කඩදාසිවල මිල හා මුද්‍රණ වියදම් හේතුවෙන් අධෛර්යමත්වන ලේඛකයා,

ප්‍රකාශකයා සහ පොත් වෙළෙන්දාට අතදීමක් මෙන්ම මේ සඳහා ලැබෙන මූල්‍යමය අනුග්‍රහය මගින් ප්‍රකාශකයාට ද පොතපත ප්‍රකාශයට පත් කිරීමට පෙළඹවීමක් ද වේ. එය පොත්වල මිල සාධාරණ මට්ටමක පවත්වාගැනීමට ද හේතු වේ.

වාර්ෂිකව රජය මගින් ලබාදෙන ප්‍රතිපාදන අනුව අනුග්‍රහය ලබාදීමේ උපරිම ආධාර මුදල තීරණය කරනු ලැබේ. 2005 වර්ෂයේ රාජ්‍ය අනුග්‍රහය නොමඳව ලැබූ හෙයින් උපරිම ආධාර මුදල රු. 100,000.00 දක්වා ලබාදීමට හැකි වූ අතර එම වර්ෂයේ ඉදිරිපත් කර තිබූ අත්පිටපත් 509 න් 213 ක් සඳහා ආධාර මුදල් පිරිනැමීමට සුදුසු උසස් තත්වයේ අත්පිටපත් වීම වැදගත් කරුණකි. බොහෝ විට වාර්ෂිකව අත්පිටපත් 100 කට ආසන්න ප්‍රමාණයක් මුද්‍රණ අනුග්‍රහය ලබා ගැනීම සඳහා සුදුසු උසස් මට්ටමේ අත්පිටපත් මේ සඳහා ලැබෙන බව සඳහන් කළ යුතුය. බොහෝ වර්ෂවල ආධාර මුදලේ උපරිමය රු. 50,000.00 සීමාවේ පැවතුණි. 2012 වර්ෂයේ කිසියම් වෙනසක් සිදු කරමින් ශාස්ත්‍රීය කෘති සඳහා පිරිනැමෙන ආධාර මුදල රු. 60,000.00 ක් වශයෙන් හා නිර්මාණාත්මක කෘති සඳහා රු. 45,000.00 ක් වශයෙන් ලබාදීමට මණ්ඩලය තීරණය කරන ලදී.

වර්ෂ කිහිපයක් හැරුණු කොට මෙම ව්‍යාපෘතිය අඛණ්ඩව පවත්වාගෙන යාමට අප මණ්ඩලයට හැකි වූ අතර එමගින් උසස් නිර්මාණ 3000 කට ආසන්න ප්‍රමාණයක් ප්‍රකාශයට පත් කිරීමට හැකිවීම මෙන් ම ප්‍රවීණ ලේඛකයන් රැසක් බිහි කිරීමට ද අප මණ්ඩලයට හැකිවීම අතිශයෝක්තියක් නොවන බව ද සඳහන් කළ යුතුය.

වාර්ෂිකව පවත්වනු ලබන රාජ්‍ය සාහිත්‍ය සම්මාන පිරිනැමීමේ උළෙලේ දී රාජ්‍ය සාහිත්‍ය සම්මානයෙන් පිදුම් ලැබීමට හැකි කෘති 50 ක් පමණ බිහි කිරීම, ප්‍රකාශන ක්ෂේත්‍රයට මෙම ව්‍යාපෘතිය හරහා ලැබූ නොමඳ දායකත්වය මනාව පිළිබිඹු කරයි.

**නව ප්‍රකාශන මිල දී ගැනීම**

ලේඛකයා ලේඛනකරණයට යොමු කිරීම දිරිමත් කිරීමේ අරමුණෙන් ආරම්භ කළ තවත් ප්‍රධාන වැඩපිළිවෙළක් ලෙස නව ප්‍රකාශන මිල දී ගැනීමේ ව්‍යාපෘතිය හැඳින්විය හැකිය. මෙමගින් ලේඛකයන්හට ඔවුන්ගේ ප්‍රකාශන අලෙවිකර ගැනීමට අතදීමක් ලෙස නිවැරදි ප්‍රමිතීන් හා ග්‍රන්ථ විද්‍යාත්මක ක්‍රම අනුගමනය කරමින් ප්‍රකාශිත ග්‍රන්ථවලින් පිටපත් ප්‍රමාණයක් මිල දී ගැනීම සිදු කරනු ලැබේ. මෙම ව්‍යාපෘතිය යටතේ ම ළමා ලේඛකයින් මෙන් ම ළමයින් සඳහා පොතපත රචනා කරන ලේඛකයන් දිරිමත් කිරීමේ අරමුණෙන් ළමා ග්‍රන්ථවලින් පිටපත් ප්‍රමාණයක් මිල දී ගැනීමට ද කටයුතු කරනු ලැබේ.

මෙලෙස වාර්ෂිකව ග්‍රන්ථනාම 350 කට වැඩි ප්‍රමාණයක් මිල දී ගනිමින් ලේඛකයින්ට ආධාර කිරීම ක්‍රියාත්මක කර දැනට වසර 20 ක් පමණ ගත වී ඇත. මෙසේ මිල දී ගන්නා ප්‍රකාශන ග්‍රාමීය හා අර්ධ නාගරික ප්‍රදේශවල පවත්නා පුස්තකාල සංවර්ධනය සඳහා පරිත්‍යාග වශයෙන් ලබා දෙමින් පුස්තකාල සේවාවේ ප්‍රවර්ධනය උදෙසා මහඟු දායකත්වයක් ලබා දීමට හැකි වී තිබේ.

මෙම ව්‍යාපෘතිය යටතේ 2011 වර්ෂයේ දී ප්‍රකාශන මිල දී ගැනීම සඳහා සුවිශේෂී දායකත්වයක් දැරීමට මණ්ඩලයට හැකියාව ලැබුණි. මෙහි දී එක් කර්තෘවරයකුගෙන් රු. 25,000.00 ක උපරිමයකට යටත්ව පිටපත් මිල දී ගැනීම සිදු කෙරුණි. එම වර්ෂය පුරා ග්‍රන්ථ නාම 400 කට ආසන්න ප්‍රමාණයක් මිල දී ගනිමින් විශාල මුදලක් (රුපියල් මිලියන 3.5 ක පමණ) මෙම ව්‍යාපෘතිය හරහා වැය කිරීමට කටයුතු කර තිබේ.

කෙසේ වුව ද ආධාර මුදල තීරණය කිරීම වාර්ෂිකව ලැබෙන ප්‍රතිපාදන මත සිදු කරන අතර 2012 වසර සඳහා ප්‍රකාශනයේ වටිනාකම අනුව රු. 15,000.00, රු. 10,000.00 සහ රු. 5,000.00 වශයෙන් පිටපත් මිල දී ගැනීම සැලසුම් කර තිබේ.

**රාජ්‍ය සම්මාන දිනූ කෘති මිල දී ගැනීම**

වාර්ෂිකව රාජ්‍ය සාහිත්‍ය සම්මානයෙන් පිදුම් ලැබූ කෘතිවලින් පිටපත් ප්‍රමාණයක් මිල දී ගැනීමෙන් ගුණාත්මක බවින් යුත් දේශීය ග්‍රන්ථ පාඨකයා අතර සුලභ කිරීම, ලේඛකයා දිරිමත් කිරීම, මූල්‍ය අනුග්‍රහයක් ලබාදීමත් මෙන්ම පාඨකයින් අතර හොඳ පොතපත ප්‍රචලිත කිරීමේ අරමුණින් 2005 වසරේ දී මෙම වැඩපිළිවෙළ ආරම්භ කෙරුණි.

රාජ්‍ය සාහිත්‍ය උළෙල සෑම වසරකම ඔක්තෝබර් මාසයේ දී පැවැත්වෙන අතර එහි දී සම්මානයෙන් පිදුම් ලබන ලේඛකයින්ගේ කෘති මිල දී ගැනීම මෙම වැඩපිළිවෙළ යටතේ සිදු කෙරේ. එක් ලේඛකයකුගෙන් රු. 25,000.00 ක උපරිමයකට යටත්ව පිටපත් මිල දී ගැනීම සිදු කරන අතර වාර්ෂිකව ලේඛකයින් 30 කට ආසන්න ප්‍රමාණයකගේ ප්‍රකාශන මේ යටතේ මිල දී ගැනීමට හැකි වී තිබේ. මෙසේ ලබාගන්නා ප්‍රකාශන පරිත්‍යාග වශයෙන් දිවයිනේ විවිධ පුස්තකාල වෙත ලබාදීම මගින් උසස් ගණයේ පොතපත පාඨකයා අතර පත් කිරීමට හැකි වී තිබේ.

**සම්භාව්‍ය කෘති සංස්කරණය කිරීම**

පුරාතන සිංහල සම්භාව්‍ය සාහිත්‍ය කෘති වත්මන් හා අනාගත පරපුරෙහි පරිශීලනය උදෙසා විද්වත් මණ්ඩලයක් මගින් සංස්කරණය කොට ප්‍රකාශයට පත් කිරීමේ අරමුණින් මෙම වැඩපිළිවෙළ ආරම්භ කරන ලදී. බෞද්ධයන් අතර මහත් සම්භාවනාවට පාත්‍ර වූ කෘති අතර පූජාවලිය, පන්සිය පනස් ජාතක පොත් වහන්සේ සහ මහා වංශය යන කෘති ත්‍රිත්වය සංස්කරණය කොට ප්‍රකාශයට පත් කිරීමට හැකිවීම බෞද්ධ පාඨක ප්‍රජාව ලැබූ උසස් ජයග්‍රහණයක් ලෙස සැලකිය හැකිය.

මෙම වැඩපිළිවෙළ යටතේ ම මෙරට සම්භාව්‍ය සාහිත්‍යයේ අග්‍රගන්‍ය කෘතියක් සේ සැලකෙන පොළොන්නරු යුගයේ රචිත බුත්සරණ ග්‍රන්ථය මී ළඟ සංස්කරණ කෘතිය ලෙස ප්‍රකාශයට පත්කිරීමට සැළසුම් කර ඇත.

**තෝරාගත් පුස්තකාල විද්‍යා ප්‍රකාශන පළ කිරීම**

පුස්තකාල හා තොරතුරු විද්‍යා විෂයට අදාළ ඉංග්‍රීසි භාෂාවෙන් රචිත ග්‍රන්ථයක් හෝ ලිප

මාලාවක් සිංහල භාෂාවට හෝ දෙමළ භාෂාවට පරිවර්තනය හෝ අනුවර්තනය කර ප්‍රකාශයට පත්කිරීම මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වේ.

**පුස්තකාල ප්‍රවෘත්ති සඟරාව**

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ නිල ප්‍රකාශනය වශයෙන් සැලකෙන පුස්තකාල ප්‍රවෘත්ති සඟරාව ප්‍රකාශයට පත් කිරීම ද මණ්ඩලය මගින් සිදු කෙරේ. මෙය 1973 වර්ෂයේ සිට ත්‍රෛමාසික ප්‍රකාශනයක් වශයෙන් ප්‍රකාශයට පත් කෙරේ. පුස්තකාල හා විඥාපන විද්‍යා විෂය ක්ෂේත්‍රයට අදාළ ව භාෂා තුනෙන් ම ලිපි හා ප්‍රවෘත්ති අන්තර්ගත ප්‍රකාශනයකි.

පුස්තකාල විද්‍යාව හදාරන සිසුන්ට මෙන්ම පුස්තකාල ක්ෂේත්‍රයට සම්බන්ධ සියලුම දෙනා විසින් පරිශීලනය කළ යුතු ඉතා වැදගත් ප්‍රකාශනයක් ලෙස මෙම ප්‍රකාශනය හැඳින්විය හැක.

**සුනාමි ළමා පොත් ප්‍රකාශන ව්‍යාපෘතිය**

2004 වසරේ සිදු වූ සුනාමි ව්‍යසනයෙන් දෙමාපියන්, නෑ හිතවතුන්, නිවාස, පාසල් හා පොතපත අහිමිව අසහනයට පත් දූයේ දරුවන් ඉලක්ක කර ගනිමින් මෙම ළමා පොත් ව්‍යාපෘතිය 2005 වසරේ දී ආරම්භ කරන ලදී. මෙම විපතේ දී පීඩාවිඳි දරුවන්ගේ මානසික ශක්තිය, ආත්මවිශ්වාසය සහ ධෛර්යය ලබා දී නැවතත් ජීවිතයට මුහුණ දීමට අවශ්‍ය වාතාවරණයක් ඇති කිරීම මෙම ව්‍යාපෘතිය ඇති කිරීමේ ප්‍රධාන පරමාර්ථය විය.

මේ අනුව මෙම තේමාවට සුදුසු අත්පිටපත් රචනා කොට ඉදිරිපත් කරන ලෙස ඉල්ලීමක් කරන ලදී. එම ඉල්ලීමට ප්‍රතිචාරයක් ලෙස ලැබුණු අත්පිටපත් අතරින් සිංහල 10 ක් හා දෙමළ 05 ක් වශයෙන් අත්පිටපත් 15 ක් ප්‍රකාශයට පත්කිරීමට තෝරාගන්නා ලදී. මෙසේ තෝරාගත් අත්පිටපත් සඳහා මණ්ඩලය විසින් මූල්‍යාධාර සපයන ලදී. මෙහි දී එක් ලේඛකයෙකු සඳහා රු. 40,000.00 ක මූල්‍ය අනුග්‍රහයක් පිරිනැමීමට මණ්ඩලය කටයුතු කරන ලදී.

**අන්තර්ජාතික ප්‍රමිති ග්‍රන්ථ අංක ක්‍රමය (ISBN)**

ග්‍රන්ථයක අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා යොදනු ලබන සුවිශේෂී අංක ක්‍රමයක් ලෙස අන්තර්ජාතික ප්‍රමිති ග්‍රන්ථ අංකය හෙවත් ISBN අංකය හැඳින්විය හැකිය. ජාත්‍යන්තර ප්‍රමිති සංවිධානයේ ISO 2108 දරන ප්‍රමිති නිර්දේශ අනුව ග්‍රන්ථ සඳහා මෙම අංක ක්‍රමය භාවිත කරනු ලබන අතර අංක නිකුත් කිරීමේ ජාතික ආයතනය ලෙස ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මන්ඩලයට බලය පවරා ඇත. මෙම අංක ලබාදීම 1986 වසරේ දී ආරම්භ කළ අතර මේ වන විට ප්‍රකාශකයින් 14000 කට ආසන්න ප්‍රමාණයක් අංක ලබාගැනීම සඳහා ජාතික ආයතනයේ ලියාපදිංචි වී ඇත.

ආරම්භයේ දී මෙම ව්‍යාපෘතියේ මව් ආයතනය ජර්මනියේ බර්ලින් නුවර පිහිටා තිබූ අතර වර්තමානයේ දී එය එක්සත් රාජධානියේ පිහිටුවා ඇත.

ප්‍රකාශන පළ කිරීමේ දී අනිවාර්යයෙන් මුද්‍රණය කළ යුතු අංකයක් බවට ISBN අංකය අද පත් වී තිබේ. එම නිසා වාර්ෂිකව මෙම අංකය ලබා ගැනීමට ප්‍රකාශකයන් දැඩි උනන්දුවක් දක්වන

ලැබේ. එම නිසා මේ සඳහා ලැබෙන ඉල්ලුම දිනෙන් දින වැඩි වී තිබේ. 2011 වර්ෂයේ දී නිකුත්කර ඇති සම්පූර්ණ අංක ප්‍රමාණය 10236 කි.

**අන්තර්ජාතික ප්‍රමිති සංගීත අංක ක්‍රමය (ISMN)**

ස්වර ප්‍රස්තාර සහිත සංගීත ප්‍රකාශන සඳහා මෙම අංක ක්‍රමය භාවිත කරනු ලැබේ. 1996 වසරේ දී මෙම අංක ක්‍රමය ලංකාවට හඳුන්වා දුන් අතර මව් ආයතනය පිහිටා තිබෙන්නේ ජර්මනියේ බර්ලින් නුවරයි. ජාතික ආයතනය ලෙස මණ්ඩලය කටයුතු කරන අතර වාර්ෂිකව සීමිත සංගීත ප්‍රකාශන බිහිවීම හේතු කොට ගෙන මෙම අංක ලබාගැනීමට ඉල්ලුම් කරන ප්‍රකාශකයන් ද සීමිත වේ.

**අන්තර්ජාතික ප්‍රමිත මාලික අංක ක්‍රමය (ISSN)**

පුවත්පත් හා සඟරා වැනි වාරිකව පලවන ප්‍රකාශන සඳහා මෙම අංක ක්‍රමය භාවිත කරනු ලැබේ. ISBN හා ISMN අංක ක්‍රමවලට වඩා ISSN අංක ක්‍රමය සුවිශේෂී වන්නේ මෙකී ප්‍රකාශනයේ නාමය නො වෙනස්ව පවතින තුරු එම අංකය එම ප්‍රකාශනය සඳහා යෙදීමට හැකි වීමයි.

සෑම ප්‍රකාශකයෙක්ම තම ප්‍රකාශනයේ අනන්‍යතාවය තහවුරු කර ගැනීම සඳහා මෙම ප්‍රමිති අංක ලබා ගැනීමට උනන්දුවක් දක්වනු ලැබේ. එමෙන් ම බොහෝ ප්‍රකාශන ආයතනවල පුස්තකාලවල තොග සමීක්ෂණයේ දී, වෙළඳ කටයුතුවල දී, තොරතුරු ගවේෂණයේ දී, ප්‍රකාශන ඇණවුම් කිරීමේ දී මෙම අංක ක්‍රමය බෙහෙවින් ප්‍රයෝජනවත් වී තිබේ. එම නිසා දිනෙන් දින මෙම අංක ලබා ගැනීමට පැමිණෙන ප්‍රකාශකයින්ගේ සංඛ්‍යාව ක්‍රමයෙන් වැඩි වී තිබේ. 2011 වර්ෂයේ දී වාරික ප්‍රකාශන 217 ක් සඳහා ISSN නිකුත් කිරීමට කටයුතු කර තිබේ.

**ප්‍රචාරක කටයුතු**

ග්‍රන්ථ ප්‍රකාශනයේ දී යොදාගනු ලබන අන්තර්ජාතික ප්‍රමිති අංක (ISBN/ ISMN/ ISSN) අංක පිළිබඳව ලේඛකයින්, ප්‍රකාශකයන් සහ මුද්‍රණකරුවන් දැනුවත් කිරීමේ සම්මන්ත්‍රණ, වැඩමුළු වාර්ෂිකව පැවැත්වීමට කටයුතු සංවිධානය කර තිබේ.

මෙම අංක හඳුන්වාදීම, එහි වැදගත්කම හා නිවැරදිව මුද්‍රණය කළ යුතු ආකාරය මෙන් ම බාර්කෝඩ් අංකය මුද්‍රණය කළ යුතු ආකාරය පිළිබඳ නිවැරදි අවබෝධයක් ලබාදීමට මෙමගින් කටයුතු කරනු ලැබේ.

ප්‍රායෝගිකව ලේඛකයන් හා ප්‍රකාශකයන් මුද්‍රණකරුවන් මුහුණපාන ගැටලු නිරාකරණය කර ගැනීමට ඔවුන්ට මෙවැනි සම්මන්ත්‍රණ හා වැඩමුළු මගින් හැකියාව ලැබෙනු ඇත.

මීට අමතරව කර්තෘවරු ප්‍රකාශකයින් ඇතුළු ප්‍රකාශන ක්ෂේත්‍රයේ විද්වතුන් සඳහා වැඩමුළු සම්මන්ත්‍රණ පැවැත්වීම ද සිදු කරනු ලබන තවත් කාර්යයකි. මෙහිදී ප්‍රකාශන ආධාර ව්‍යාපෘතියට සම්බන්ධ ලේඛකයින් කැඳවා ලේඛනකරණය පිළිබඳ නිවැරදි ක්‍රම ශිල්ප භාවිත කරන ආකාරය

පිළිබඳ සම්මන්ත්‍රණ හා වැඩමුළු පවත්වමින් ඔවුන් දැනුවත් කිරීමට කටයුතු සිදු කරනු ලැබේ. 2011 වර්ෂයේ දී තෝරාගත් කෙටිකතා රචිත ලේඛකයන් 30 දෙනෙක් කැඳවා නිවැරදි ක්‍රම ශිල්ප භාවිතා කරමින් කෙටිකතාකරණයෙහි නියැලෙන ආකාරය පිළිබඳව වැඩමුළුවක් පැවැත්වීමට කටයුතු කරන ලදී. කෙටිකතා රචනය පිළිබඳ ප්‍රවීණයන් කැඳවා දේශන පැවැත් වූ අතර ලේඛකයන් මුහුණපාන ගැටලු නිරාකරණය කර ගැනීමට සහ අත්දැකීම් පුළුල් කර ගැනීමට මෙමගින් ඔවුනට අවස්ථාව උදාවුණි.



National Digitization Project

*National Science Foundation*

Institute : National Library and Documentation Services Board

1. Place of Scanning : National Library and Documentation Services Board, Colombo 07
2. Date Scanned : 2017/10/13
3. Name of Digitizing Company : Sanje (Private) Ltd, No 435/16, Kottawa Rd, Hokandara North, Arangala, Hokandara
4. Scanning Officer

Name : N.P.R. Gamage

Signature : ..........

Certification of Scanning

*I hereby certify that the scanning of this document was carried out under my supervision, according to the norms and standards of digital scanning accurately, also keeping with the originality of the original document to be accepted in a court of law.*

Certifying Officer

Designation : Library Documentation Officer

Name : Iromi Wijesundara

Signature : ..........

Date : 2017/10/13

*"This document/publication was digitized under National Digitization Project of the National Science Foundation, Sri Lanka"*